# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන.

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංඝුන්ගම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ක්‍රියාත්මක ව්‍යාපෘතිය සඳහා වූ ඇගයීම් වාර්තාව

පර්යේෂණ කණ්ඩායම :-
ආර්.එල්.එන්. ජයතිස්ස (ජ්‍යෂ්ඨ පර්යේෂණ නිලධාරී)
ආචාර්යය ඩබ්ලිව්.ජී.බී. ගිරාගම (අධි පර්යේෂක)
සන්ධ්‍යා සේනානායක (සංඛ්‍යාන නිලධාරී)

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.
114, විජේරාම මාවත
කොළඹ 07.

2003 දෙසැම්බර්

711.3
(SL)
හෙක්ට

2009/06 2010/04
254

# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන.

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංසුන්ගම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ක්‍රියාත්මක ව්‍යාපෘතිය සඳහා වූ ඇගයීම් වාර්තාව

MFA 5863

පර්යේෂණ කණ්ඩායම :-
ආර්.එල්.එන්. ජයතිස්ස (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී)
ආචාර්යය ඩබ්ලිව්.ජී.බී. ගිරාගම (අධි පර්යේෂක)
සන්ධ්‍යා සේනානායක (සංඛ්‍යාන නිලධාරී)

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.
114, විජේරාම මාවත
කොළඹ 07.

2003 දෙසැම්බර්

21451
21451
පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

# පටුන


පළමුවන පරිච්ඡේදය — පිටු අංකය

1.1 පිවිසුම 4
1.2 තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන 4
1.3 ව්‍යාපෘතියේ අරමුණු 5
1.3.1 ව්‍යාපෘතියේ දිගුකාලීන බලාපොරොත්තු (අභිමතාර්ථ) 5
1.3.2 කෙටිකාලීන බලාපොරොත්තු (අරමුණු) 5
1.4 උපාය මාර්ග 6
1.5 ක්‍රියාමාර්ග 9
1.6 යෙදවුම් 9
1.7 නිමැවුම් 9
1.8 සම්බන්ධීකරණය 9
1.9 මූල්‍ය පහසුකම් සැපයීම 9
1.10 ව්‍යාපෘති ප්‍රදේශ තෝරා ගැනීම 10
1.11 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධව ආයතනයේ කාර්යභාරය 10
1.12 මෙම ඇගයීම් අධ්‍යයන වාර්තාව 10
1.13 ක්‍රමවේදය 11

දෙවන පරිච්ඡේදය

2. අධ්‍යයන ගමෙහි ලක්ෂණ
2.1 පිහිටීම 12
2.2 ඓතිහාසික තත්ත්වය 12
2.3 ජනගහනය හා එහි ලක්ෂණ 12
2.4 ආර්ථික කටයුතු හා එහි විශේෂිත ලක්ෂණ 12
2.4.1 ප්‍රධාන ආර්ථික කටයුතු 13
2.4.2 ව්‍යාපෘති බල ප්‍රදේශයේ රැකියා නියුක්තිය 15
2.4.3 ඉඩම් අයිතිය. භුක්තිය. හා ඉඩම් ආශ්‍රිත ගැටළු 15
2.4.4 කෘෂිකර්මය 16
2.4.5 ගොවිජන බැංකු ණය සැපයීම 17
2.4.6 වී සුරැකුම් වැඩසටහන 17
2.4.7 සත්ත්ව පාලනය 18
2.4.8 ස්වයං රැකියා (ගොවිපළ නොවන) 19
2.5 ආදායම් මට්ටම 20
2.6 අධ්‍යාපන තත්ත්වය 20
2.7 නිවාස තත්ත්වය හා අයිතිය 21
2.8 සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් 22
2.8.1 විශේෂිත ලෙඩරෝග 23
2.8.2 වැසිකිළි භාවිතය 23
2.8.3 ජල පහසුකම් සපයාගැනීම 23
2.8.4 ආහාර පිසීම සඳහා ඉන්ධන භාවිතය 24
2.8.5 වෙනත් පහසුකම් 25
2.8.6 ප්‍රදේශයේ මහාමාර්ග 25
2.8.7 ග්‍රාමීය ප්‍රජා සංවිධාන හා ඒවායේ සහභාගීත්වය 26
2.9 කාන්තාවන්ගේ හා තරුණයන්ගේ තත්ත්වය 28

| තුන්වෙනි පරිච්ඡේදය | | පිටු අංකය |
|---|---|---|
| 3. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 29 |
| 3.1 | ගම තෝරා ගැනීම | 29 |
| 3.1.2 | සැළසුම් සැකසීම | 30 |
| 3.1.3 | සහභාගිත්ව ගැමි විමසුම | 31 |
| 3.2 | ග්‍රාමීය ප්‍රවේශය- හඳුනාගත් හා ප්‍රමුඛතාගත කරන ලද ගැටළු | 31 |
| 3.3 | සංවිධානාත්මක හා කළමනාකරණ ව්‍යුහය | 35 |
| 3.4 | ජනතා සහභාගීත්වය ලබාගැනීම හා ඔවුන් ක්‍රියාකාරීන් බවට පත්කිරීම | 36 |
| 3.5 | ක්‍රියාත්මක කළ සංවර්ධන කටයුතු | 38 |

| හතරවන පරිච්ඡේදය | | |
|---|---|---|
| 4. | ව්‍යාපෘතියෙහි බලපෑම් සහ අරමුණු සඵල කරගැනීම | 41 |
| 4.1 | සංවර්ධන කටයුතුවල බලපෑම | 41 |
| 4.2 | කෙටි කාලීන හා දිගු කාලීන ව්‍යාපෘති අරමුණු ඉටුවීම | 45 |

| පස්වන පරිච්ඡේදය | | |
|---|---|---|
| 5. | සොයාගැනීම්, පාඩම්, අත්දැකීම් හා ගැටළු | |
| 5.1 | සොයා ගැනීම | 49 |
| 5.2 | පාඩම් හා අත්දැකීම් | 51 |
| 5.3 | ප්‍රශ්න හා ගැටළු | 52 |

| හයවන පරිච්ඡේදය | | |
|---|---|---|
| 6. | නිගමන හා යෝජනා | |
| 6.1 | නිගමන | 53 |
| 6.2 | යෝජනා | 53 |

# පළමුවන පරිච්ඡේදය

# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන පිළිබඳව හැඳින්වීම

## 1.1 පිවිසුම

ආර්ථික හා සමාජීය වශයෙන් වඩා වැදගත් වූ මෙරට පාරිභෝගික කෘෂිකාර්මික ක්ෂේත්‍රය මෑතක සිට වඩාත් පසුගාමී හා ආකාර්යක්ෂම එකක් බවට පත්ව ඇත. රටෙහි ජනගහණයෙන් 75% ක් පමණ ග්‍රාමීය අංශයෙහි ජීවත් වන අතර ශ්‍රම බලකායෙන් 35% ක් පමණ කෙළින්ම හෝ වක්‍ර අන්දමින් කෘෂිකර්මය හා සම්බන්ධ කටයුතු වල නියුතුව ජීවිකාව කරගෙන යති. මුළු ජනගහණයෙන් 70% ක් පමණ කෘෂිකර්මය මත යැපෙති. මෙතරම් වැදගත් කමක් දරනු ලබන දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුල මෑත භාගයේ දැකගත හැකි ප්‍රවනතා වන්නේ අඩු නිෂ්පාදන ඵලදායීතාවය, අඩු ආදායම්, වැඩි නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් මිළක් නොලැබීම හා එය උච්චාවචනයට භාජනය වීම, රැකියා හිඟයක් පැවතියදී වුවද ජනතාව කෘෂිකර්මයෙන් තව තවත් බැහැර වීම යනාදියයි. මේ තත්ත්වය ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ආර්ථික තත්ත්වය පහළ බැසීමටත් දුප්පත්කම වර්ධනය වීමටත් හේතු වී ඇත.

නිදහස් ආර්ථික ප්‍රතිපත්තීන් යටතේ වර්තමාන ග්‍රාමීය ක්ෂේත්‍රය මුහුණ පා ඇති ඉහත දැක්වූ අභියෝග ජය ගැන්ම තුළින් සමෘද්ධිමත් ගොවිජන සමාජයක් බිහි කිරීම සඳහා යොමු වූ නව ව්‍යාපෘතියක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ආරම්භ කරනු ලැබ ඇති අතර එය "තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන" වේ. මෙම වැඩ සටහන කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍ය ගරු එස්.බී. දිසානායක ඇමතිතුමාගේ අදහසක් හා දිරිගැන්වීම මත ඇරඹීම සුවිශේෂ වූ කරුණකි.

## 1.2 තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන

ඉහත දැක්වූ පරිදි විවිධාකාර වූ ප්‍රශ්න ග්‍රාමීය ක්ෂේත්‍රය තුල පැවතියද ඒවා බොහොමයක් විසඳීම සඳහා අවශ්‍ය සම්පත් හා හැකියාවන් එම ක්ෂේත්‍රය තුලම පවතී. එවැනි දෑ හඳුනා ගැනීමත්, ඒවා විධිමත් පරිදි උපයෝගී කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික, කළමනාකරණ හා සංවිධානාත්මක විධි හා ක්‍රමෝපායන් පිළිබඳව අත්හදා බැලීමක් සඳහා ආරම්භ කරනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘතිය "තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන" වෙයි.

මෙම වැඩසටහන යටතේ දිවයිනේ විවිධ කෘෂි දේශගුණික කලාපයන්ගෙන් "ක්ෂේත්‍ර පර්යේෂණාගාර" ලෙස තෝරා ගනු ලැබූ ගම් "ආදර්ශන" හෙවත් "ආදර්ශ ගම්මාන" ලෙස දියුණු කිරීමට උත්සාහ ගනු ලැබින. එසේ කරනු ලැබුයේ එම ගම් වල කරනු ලැබූ විවිධ අත්හදා බැලීම් එම ගම් තුලම භාවිතයට සැලැස්වීමෙන් වූ අතර එවැනි ආදර්ශ ගම්මාන බිහි කිරීමේ අරමුණ වූයේ අසල්වැසි අනෙකුත් ගම්

වලටත් එවැනි සාර්ථක අත්දැකීම් අනුගමනය කිරීම තුලින් දියුණුව සලසා ගැනීමට අවස්ථාව ලබා දීමය.

මෙම වැඩසටහනෙහි මූලික ලක්ෂණ වන්නේ ඒකාබද්ධ සංවර්ධනය, සහභාගිත්ව ප්‍රවේශය හා තිරසර භාවයයි. ග්‍රාමීය සංවර්ධනයේදී, බෝග හා නිෂ්පාදන වල විවිධාංගීකරණය, ආර්ථික කටයුතු වලට අමතරව අධ්‍යාපනය, සෞඛ්‍ය, යටිතල පහසුකම් ආදී වූ සමාජ හා අනෙකුත් අංශයන්හි සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම, සංවර්ධනය සඳහා දායක කරගත හැකි සියළුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලත් ජනතාවගේත් සහභාගීත්වය හා සහයෝගය ඒ සඳහා උපරිම අන්දමින් ලබා ගැනීම හා පාරිසරික සමතුලිතාවය මෙන්ම ආරම්භ කරනු ලබන ආර්ථික කටයුතු හා සංවිධානාත්මක ක්‍රමෝපායන් ඇතුළත් සංවර්ධනාත්මක ක්‍රියාවලියෙහි දිගුකාලීන පැවැත්ම කෙරෙහි වැඩසටහන යටතේ විශේෂ අවධානය යොමු කිරීමට අපේක්ෂා කෙරිනි.

1.3 ව්‍යාපෘතියෙහි අරමුණු

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අංග දෙකකින් සමන්විත වන අතර ඉන් ප්‍රධාන අංගය වන්නේ ඉහත දැක්වූ ආකාරයට ග්‍රාමීය සංවර්ධනය සඳහා කෙළින්ම හා ප්‍රායෝගිකව මැදිහත් වීමය. ඒ යටතේ අනෙකුත් ගැමියන් පෙළඹවීම සඳහා විවිධ අත්හදා බැලීම් සිදු කරමින් ආදර්ශ ගම් බිහිකරනු ලැබේ. එහි දෙවන අංගය වන්නේ තොරතුරු සැපයීම තුළින් වක්‍ර අයුරින් ග්‍රාමීය සංවර්ධනය සඳහා දායක වීමය. ඒ යටතේ කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධනය සඳහා රජය අනුගමනය කරන්නා වූ ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් කෙරෙහි ග්‍රාමීය ජනතාවගේ ආකල්ප හා ප්‍රතිචාරයන් සම්බන්ධ තොරතුරු එක්රැස් කර ඒ පිළිබඳව තීරණ ගන්නන් හා ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීමට අපේක්ෂා කෙරිනි.

ආදර්ශ ගම්මාන බිහිකිරීම තුළින් ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රායෝගික ලෙස යොමු වූ මෙම වැඩසටහනෙහි මූලික අංගය දෙස බලන විට එහි දිගු කාලීන මෙන්ම කෙටිකාලීන අපේක්ෂාවන් ද ගැබ්ව පවතී. ඒවා නම් :

1.3.1 දිගු කාලීන බලාපොරොත්තු (අභිමතාර්ථ)

I. තිරසාර වූ නිෂ්පාදන ක්‍රියාවලියක් පදනම් කරගත් ආදර්ශ ගම්මාන බිහි කිරීම.

II. ජනතාවගේ ජීවන තත්ත්වය නැංවීම.

1.3.2 කෙටි කාලීන බලාපොරොත්තු (අරමුණු)

I. ජනතාවගේ ආදායම් වර්ධනය කිරීම.

II. රැකියා වර්ධනය කිරීම

III. නිෂ්පාදන ඵලදායීතාවය වර්ධනය කිරීම

IV. ආහාර සුරක්ෂිත භාවය තහවුරු කිරීම

V. සංවර්ධනය සඳහා ජනතා සහභාගීත්වය උපරිම අයුරින් යොදා ගැනීම.

1.4 උපාය මාර්ග

ඉහත දැක්වූ අභිමතාර්ථ හා අරමුණු සඵල කර ගැනීම සඳහා විවිධ වූ ක්‍රමෝපායයන් අනුගමනය කිරීමට බලාපොරොත්තු වූ අතර ඒවා පහත සඳහන් වේ.

i. නිෂ්පාදන පිරිවැය අඩුකිරීම

ගොවිපල නිෂ්පාදනයන්හි ආර්ථික ඵලදායීබව හා පවුලේ ආදායම් වර්ධකනය සමග කෙළින්ම සම්බන්ධ වන මේ යටතේ ගොම, පිදුරු, හා කොම්පෝස්ට් වැනි කාබනික ද්‍රව්‍ය භාවිතයට උනන්දු කරවීම මඟින් රසායනික පොහොර භාවිතය අවම කිරීම හා ඒකවර වගා කිරීමට සැලැස්වීමෙන් ඒකාබද්ධ පළිබෝධ පාලනයට මග සලස්වා රසායන ද්‍රව්‍ය භාවිතය සඳහා යන වියදම අවම කරවීම, අවශ්‍ය බීජ තම ගොවිපල හෝ ගම තුළින්ම නිපදවා ගැනීමට සලස්වා ඒ සඳහා යන අධික වියදම අඩු කිරීම යනාදිය ගැනේ.

ii. නිෂ්පාදන සඳහා වඩා ඉහළ මිලක් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.

වෙළඳපොලෙහි වැඩි ඉල්ලුමක් ඇති බෝග හා කාබනික නිෂ්පාදන වලට උනන්දු කරවීම, වගා කාල සටහන වෙනස් කරවීම මඟින් වැඩි මිලක් ලබා ගත හැකි අවස්ථා වලදී නිෂ්පාදන වෙළඳපොළට සැපයුමට කටයුතු සැලැස්වීම, වැඩි මිලක් ලැබෙන තෙක් අස්වනු ගබඩා කිරීම සඳහා උනන්දු කරවීම.

ගොවීන් සංවිධානය කරවීම මඟින් ඔවුන්ගේ හේවල් කිරීමේ ශක්තිය වර්ධනය කිරවීම හා ඉදිරි වෙළඳ ගිවිසුම් අත්සන් කරවීමට සැලැස්වීම මඟින් වඩාත් හොඳ මිලක් ලබා ගැනීම තහවුරු කරවීම යනාදිය කාර්යයන් මෙයට ඇතුලත්ය.

iii. නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම

නිෂ්පාදන ඵලදායීතාවය වැඩි කිරීම සඳහා ඉවහල් වන නව බීජ, යෙදවුම්, හා භාවිතයන් මෙන්ම නව යන්ත්‍ර සුත්‍ර හඳුන්වා දීම සහ උචිත භාවය අනුව ඒවා යොදා ගැනීමට ගොවීන් උනන්දු කරවීම මේ යටතට ඇතුලත්ය.

iv. සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී භාවිතය

ගොවිපල මට්ටමේ ඵලදායීතාව හා ආදායම නැංවීමට හේතු කරවන බෝග විවිධාංගීකරණය මෙන්ම යටි වගාව, මිශ්‍ර වගාව යනාදිය සඳහා ගොවීන් උනන්දු කරවීම, බෝග වගාව හා සත්ව පාලනය ඒකාබද්ධ කිරීමට මග

සැලැස්වීම හා දැනට භාවිතයට නොගත් ඉඩම්, ජලය ඇතුළු ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට යොදා ගැන්මට සැලැස්වීම මේ යටතේ ගැනේ.

v. නිෂ්පාදන නීව්‍රතාවය වැඩි කිරීම

ජල කළමණාකරණය කෙරෙහි ගොවීන් උනන්දු කරවීම හා විහිදුම් හා බිංදු ජල සම්පාදනය වැනි සූක්ෂම ජල සම්පාදන ක්‍රම හඳුන්වා දීම මගින් ජලය ඉතිරි කර ගැනීමට සලස්වා අමතර කන්නයක් වගා කිරීමට මග පෙන්වාදීම මේ යටතට ගැනෙන අතර කාර්යක්ෂම ලෙස සම්පත් භාවිතයට මෙන්ම ආදායම් වර්ධනයටත් මේවා හේතු වේ.

vi. කෘෂි කර්මාන්ත මෙන්ම වෙනත් කර්මාන්ත හා ස්වයං රැකියා බිහි කිරීම.

සංවර්ධනයේ විවිධාංගීකරණයට මෙන්ම ගොවි පවුල් වල රැකියා හා ආදායම් වර්ධනයට ඉවහල් වන මේ සඳහා කෘෂි සම්පත් මෙන්ම වෙනත් වටපිටාවේ ඇති සම්පත් භාවිතයෙන් ඇරඹිය හැකි කර්මාන්ත හා ද වෙනත් ආදායම් මාර්ග ඇරඹීමට කැමති අයට අදාල පුහුණු අවස්ථා ලබාදීම හා අවශ්‍ය පහසුකම්, උපදෙස්, අලෙවි මාර්ග යනාදිය ලබා ගැනීමට අදාල ආයතන සමග සාකච්ඡා කර මග සැලැස්වීමද ඇතුලත්ය.

vii. අරපරෙස්සම, ඉතුරුම් වර්ධනය හා ආයෝජනය සඳහා ජනතාව පෙළඹවීම

ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් බීමත්කම ආදී අනවශ්‍ය වියදම් අඩු කරීමත් සමෘද්ධි, ගොවිජන බැංකු, ග්‍රාමීය බැංකු ආදී බැංකු සමග වැඩි සබඳතාවක් ගොඩනංවාලීම තුලින් ඉතිරි කිරීම් සඳහා මෙන්ම ආපසු ගෙවීම සඳහා ඔවුන් තුළ නැඹුරුවක් ඇති කිරීමත් එමගින් පහසුවෙන් ණය ලබා ගත හැකි අය බවටත්, අනාගත ආයෝජකයින් බවටත් පත් වීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම

viii. පුනරුත්තාපන හා ඉදිකිරීම් කටයුතු සිදු කිරීම

ආර්ථික හා සමාජ සංවර්ධනය ඇති කිරීමට හේතු වන්නා වූ කැඩී බිඳී ගිය හා ගොඩ වූ වැව්, අමුණු හා ඇල වේලි පුනරුත්ථාපනය, මාර්ග අළුත්වැඩියා කිරීම යනාදියත් කෘෂි ළිං ඇල මාර්ග, පාලම්, බෝක්කු හා ගොඩනැගිලි යනාදිය අළුතෙන් ඉදිකිරීමත් මේ යටතට ගැනේ.



පුස්තකාලය
LIBRARY
හෙ.ගො.ගෙ.ප.පු.ආ
HARTI

ix. පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීම

කෘෂි ඉඩම් වල පස සංරක්ෂණ සඳහා කානු, වැටි ආදිය දැමීමට සැලැස්වීම, වැව් හා ජලාශයන්ට අදාල ජලාධාර ප්‍රදේශ හා රක්ෂිතයන් හි වන වගා සඳහා උනන්දු කරවීම, පාරවල් දෙපස හා පොදු ඉඩම් යනාදියේ වන වගා කරවීම හා පෞද්ගලික ඉඩම් වල කෘෂි වන වගාවන් සඳහා උනන්දු කරවීම, ඊට අවශ්‍ය පහසුකම් සැලැස්වීම යනාදිය මේ යටතේ සිදු කෙරෙන අතර පස මෙන්ම ජල සංරක්ෂණය කෙරෙහිත් කෘෂි නිෂ්පාදනයන්හි තිරසාරත්වය කෙරෙහිත් මේවා බලපානු ලැබේ..

x සහභාගීත්ව විධික්‍රම අනුගමනය හා ග්‍රාමීය සංවිධාන බිහි කිරීම

සම්පත් හා ගැටළු හඳුනා ගැනීමේ සිට ඒවාට විසඳුම් ලබා ගැනීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය, පසු විපරම ආදී වූ සංවර්ධනයේ හැම අවස්ථාවකදීම ග්‍රාමීය ජනතාවගේ උපරිම දායකත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය සංවිධාන ව්‍යුහයන් ගම තුළ බිහි කිරීම, සංවර්ධන කටයුතු හා සම්බන්ධ තීරණ ගැනීමේදී ජනතාව සම්බන්ධ කර ගැනීම හා ඔවුන්ගේ ගැටළු යනාදිය හඳුනා ගැනීම සඳහා සහභාගීත්ව ගැමි විමසුම් ක්‍රමය වැනි සහභාගීත්ව විධි ක්‍රමයන් අනුගමනය කිරීම.

xi ප්‍රදේශයේ රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන ගම වෙත වඩාත් සමීප කරවීම

කෘෂි උපදෙස් ඇතුළු සෙසු තාක්ෂණ හා විවිධ සේවාවන් සපයනු ලබන ග්‍රාමීය ආයතන ගමත් සමග වඩාත් සමීප කරවීම හා ඒ සඳහා ගම තුළ පිහිටුවන ආයතනික රාමුව උපයෝගී කර ගැනීමට කටයුතු කිරීම.

xii නව අත්හදා බැලීම් සිදු කිරීම

වෙනත් ප්‍රදේශ වලින් දැක ගත හැකි සාර්ථක සංවර්ධන අත්දැකීම් පදනම් කර ගනිමින් විවිධ නිෂ්පාදන, යෙදවුම්, තාක්ෂණික භාවිතයන්, සංවිධානාත්මක හා කළමනාකරණ විධි ක්‍රමයන් පිළිබඳ අත්හදා බැලීම් සිදු කිරීම.

## 1.5 ක්‍රියා මාර්ග

ඉහත සඳහන් කරනු ලැබූ විවිධ සංවර්ධන ක්‍රමෝපායන් යටතේ ගනු ලබන ක්‍රියා මාර්ග අදාල ව්‍යාපෘති ප්‍රදේශයන්හි පවත්නා ප්‍රශ්ණ වල ස්වභාවය හා සම්පත් යනාදිය අනුවත් ඒවායෙහි ඇති උචිත භාවය මෙන්ම ඒ සඳහා ජනතාව දක්වනු ලබන උවමනාව හා ප්‍රමුඛත්වය මතත් තීරණය කෙරේ.

## 1.6 යෙදවුම්

මෙම ව්‍යාපෘතිය සඳහා භාවිත මූලික යෙදවුම් වන්නේ නව බීජ වර්ග, පැල වර්ග, සතුන් වර්ග, තාක්ෂණික උපකරණ, ව්‍යාප්ති සේවා දැනුම හා උපදේශන සේවා, විශේෂඥ ඥානය, මුදල් යනාදිය වෙති.

මේවා බොහොමයක් එම ගම් ප්‍රදේශයන්හි අදාල ආයතන මගින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් යටතේ ලබාදනු ලබන ඒවා වන අතර ව්‍යාපෘතිය යටතේ ඒවා ජනතාව වෙත ක්‍රමවත් හා වඩාත් ඵලදායී වන ආකාරයෙන් බෙදා හැරීමට කටයුතු සැලසේ. ඊට අමතරව ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති මුදල් මගින්ද බීජ හා පැල වර්ග යම්කිසි ප්‍රමාණයක් ජනතාව වෙත ලබා දීමට කටයුතු කෙරේ.

## 1.7 නිමවුම්

වැඩසටහනින් අපේක්ෂිත නිමවුම් වන්නේ විවිධ වගාවන් යටතේ ඇති වපසරිය හා යටි වගාව, මිශ්‍ර වගාව හා නව තාක්ෂණික ක්‍රම භාවිත වපසරිය වැඩිවීම, ස්වයං රැකියා ඒකක වැඩිවීම, නිෂ්පාදනය වැඩිවීම යනාදියයි.

## 1.8 සම්බන්ධීකරණය

මෙම අධ්‍යයනය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සම්බන්ධීකරණය කරනු ලබන අතර කෘෂි කර්ම හා පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍යාංශය මෙන්ම සෙසු අමාත්‍යාංශ වලට අයත් දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අදාල ප්‍රදේශ වල පිහිටි රාජ්‍ය නොවන ආයතන වල සහයෝගයෙන් ක්‍රියාත්මක කෙරේ.

## 1.9 මූල්‍ය පහසුකම් සැපයීම

වැඩසටහන සම්බන්ධීකරණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සිදු කරනු ලබන්නේ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අයත් සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල මගිනි. මේ සඳහා රු. දශ ලක්ෂ 4.3 ක මුදලක් ලබා දී තිබේ.

මීට අමතරව ඇතැම් ගම්වල ඉදිකිරීම් කටයුතු සඳහා ද එමගින් මුදල් වැයකර ඇත. එම ප්‍රමාණය රු.දශ ලක්ෂ 0.7 කි. මීට අමතරව කෘෂි කර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය රු. දශ ලක්ෂ 10 ක මුදලක් වැව් හා ප්‍රවාහන පද්ධතීන් පුනරුත්ථාපනය හා කෘෂි ළිං ඉදිකිරීම ඇතුලත් පාදක ව්‍යුහය දියුණු කිරීමට ලබාදී ඇත.

## 1.10 ව්‍යාපෘති ප්‍රදේශ තෝරා ගැනීම

ව්‍යාපෘති ප්‍රදේශ තෝරා ගැනීමේදී විවිධ කෘෂි දේශගුණික කලාපයන් මෙන්ම ( වී, අර්තාපල්, ලොකු ළූණු, රතු ළූණු, මිරිස්, උඩරට එළවළු, මුං ඇට/කව්පි වැනි) විවිධ බෝග හා (සත්ව පාලනය වැනි) ආර්ථික කටයුතු නියෝජනය වන ආකාරයට කටයුතු කර ඇත. ඒ අනුව (උතුරු මැද, ඌව, මධ්‍යම, වයඹ ආදී) පලාත් 4ක් හා (පොළොන්නරුව, මොණරාගල, බදුල්ල, කුරුණෑගල, මාතලේ, අනුරාධපුරය, නුවරඑළිය, පුත්තලම යනාදී) දිස්ත්‍රික්ක 8 ක් නියෝජනය වන ආකාරයෙන් ග්‍රාම සේවා වසම් 9 ක් තෝරා ගෙන ඇත. එසේ තෝරාගත් ගම් හා අදාල විස්තර ඇමුණුම 1හි ඇති අංක 1 වගුවෙහි සඳහන් වේ.

## 1.11 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ආයතනයේ කාර්යභාරය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2002 වසරේ අවසාන කාර්තුව තුලත් 2003 වසර මුළුල්ලේත් හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සම්පූර්ණ ශක්තිය හා කැපවීම සිදුකර ඇත. මේ වෙනුවෙන් ආයතනයේ සියළුම අංශයන්හි සිටින පර්යේෂණ නිලධාරීන් මෙන්ම පර්යේෂණ සහාය කාර්ය මණ්ඩලයත් මහත් පරිශ්‍රමයක් දරා ඇත. ඒ අනුව ඒ ඒ ව්‍යාපෘති ගම්මාන යටතේ ඇති සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා (සම්බන්ධීකරණ නිලධාරියකු/නිලධාරිනියක ලෙස) පර්යේෂණ නිලධාරියකු/නිලධාරිනියක බැගින් පත්කර ඇත. ඔහුගේ හෝ ඇයගේ සහයට තවත් පර්යේෂකයකු පත්කර සිටී. මීට අමතරව ඒ ඒ ව්‍යාපෘති ගම්වල සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා සහාය වීමට සංඛ්‍යාන නිලධාරී හා සංඛ්‍යාන සහකාරවරුන් එක් අයකු හෝ දෙදෙනකු පත්කර සිටිති. සියළුම ගම්මාන හෙවත් උප ව්‍යාපෘතීන් ඇතුලත් මුළු වැඩසටහනම සම්බන්ධීකරණය කිරීම කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයෙන් සිදු කරනු ලබන අතර ඒ සඳහා එක් සම්බන්ධීකරණ නිලධාරියකු පත්කර සිටී. ආයතනයේ අධ්‍යක්ෂ තුමා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ තුමා උපදෙස් සැපයීමෙන් එය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වති. මෙම ව්‍යාපෘතිය හා ඒ යටතේ ඇති උප ව්‍යාපෘතීන් (ව්‍යාපෘති ගම්) සම්බන්ධයෙන් විවිධ වගකීම් දරනු ලබන නිලධාරීන් / නිලධාරිනියන්ගේ නම් ඇමුණුම 1 යටතේ ඇති අංක 2 වගුව මගින් ඉදිරිපත් කර ඇත.

## 1.12 මෙම ඇගයීම් අධ්‍යයන වාර්තාව.


මෙම වාර්තාවෙන් හෙළිදැක්වෙන්නේ තිරසර වැඩසටහනෙහි එක් ව්‍යාපෘති ප්‍රදේශයක් වූ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංසුන්ගම ග්‍රාමනිලධාරී වසම පදනම්කර ගනිමින් ක්‍රියාත්මක කල වැඩසටහන ඇගයුමට භාජනය කිරීම තුලින් ලබාගත් තොරතුරුය. අදාල


ව්‍යාපෘති ප්‍රදේශයේ මූලික සමාජ ආර්ථික ලක්ෂණ, සම්පත් ප්‍රශ්න හා ගැටළු යනාදියත්, ව්‍යාපෘතිය යටතේ එහි ක්‍රියාත්මක කරන ලද කටයුතුත් ඒවායේ ප්‍රථිඵල හා අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු කරා ලඟාවීම සඳහා ඒවා කොතරම් දුරට උපකාරී වූවාද යන්නත්, ව්‍යාපෘතියට මුහුණදීමට සිදුවූ ගැටළු යනාදියත්, එය ක්‍රියාත්මක කිරීමෙන් ලබාගත් පාඩම් හා අත්දැකීම් යනාදියත් මෙමගින් ඉදිරිපත් කෙරේ.

## 1.13 ක්‍රමවේදය

මෙම වාර්තාව සැකසීමේදී අදාල ව්‍යපෘති ප්‍රදේශයන්හිදී සිදුකරන ලද සහභාගිත්ව ගැමි විමසුම් ක්‍රමවේද භාවිතාකරමින් එකතුකරගන්නා ලද දත්ත සහ තොරතුරු, ගම වෙත ඒ ඒ අවස්ථාවන්හිදී පිවිසීමේදී කරනු ලැබූ නිරීක්ෂණ, පොහොර සහනාධාරය අඩු කිරීම් වැනි විවිධ අංශ අලලා කරනු ලැබූ සමීක්ෂණ, ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වරින්වර සකස් කරනු ලැබූ ප්‍රගති වාර්තා, ග්‍රාම නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මගින් ලබාගන්නා ලද දත්ත සහ තොරතුරු, ගැමෙහි ජනතාව සමඟ සාකච්ඡා කිරීමෙන් ලබාගන්නා ලද තොරතුරු පදනම් කරගනු ලැබිය.

# ADMINISTRATIVE BOUNDARIES






පුස්තකාලය
LIBRARY
HARTI

# දෙවන පරිච්ඡේදය.

## අධ්‍යයන ගමෙහි ලක්ෂණ

### 2.1 පිහිටීම

උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, මැදිරිගිරිය ගොවිජනසේවා බලප්‍රදේශයේ සංසුන්ගම ග්‍රාමනිලධාරි වසම පිහිටා තිබේ.

### 2.2 ඓතිහාසික තත්ත්වය

ඩී.එස්. සේනානායක මහතා විසින් 1946 වර්ෂයේදී මින්නේරි වැව විශාල කරවා ප්‍රතිසංස්කරණය කිරීමෙන් අරඹන ලද මින්නේරිය ගොවිජනපද ව්‍යාපාරයට මෙම ව්‍යාප්ති බල ප්‍රදේශය අයත්වේ. මෙම වසමේ පදිංචි ජනපදිකයින් සියළුදෙනාම කොත්මලේ ප්‍රදේශයෙන් පැමිණ ඇති අතර ඒ සියළු දෙනාම ජාතිහුය. ප්‍රදේශයේ ප්‍රධාන විහාරස්ථානය වන ශ්‍රී ශාක්‍ය සිංහාරාමයේ අධිපති හිමියන් විසින් මෙම ප්‍රදේශය "සංසුන්ගම" යැයි නම්කොට ඇත.

### 2.3 ජනගහනය හා එහි ලක්ෂණ

| මුළු ජනගහනය 1264 | |
|---|---|
| පුරුෂ | ස්ත්‍රී |
| 643 | 621 |

ජනගහන සංයුතිය

| වයස් කාණ්ඩය | පිරිමි | ගැහැණු |
|---|---|---|
| 0-5 | 98 | 92 |
| 6-9 | 138 | 135 |
| 10-59 | 375 | 355 |
| 60 හා ඊට වැඩි | 32 | 39 |

ගමෙහි මුළු පවුල් සංඛ්‍යාව 305 කි. පවුලක සාමාන්‍ය ජනගහනය පුද්ගලයන් 4 කි. මෙම සියළුම දෙනා බෞද්ධාගමිකයෝය.

### 2.4 ආර්ථික කටයුතු හා එහි විශේෂිත ලක්ෂණ.

සංසුන්ගම ගම්මානයේ ආර්ථික කටයුතු වනුයේ යල/ මහ කන්න දෙකේ වී වගා කිරීමත් ගොඩ ඉඩම්වල එළවළු වැනි බෝග වගා කිරීමත්. තාවකාලික රැකියා ලෙස කුලී වැඩ කිරීමත්. ඉතා සුළු වශයෙන් ස්වයං රැකියා සහ සත්ත්ව පාලනයේ නිරතවීමත් වේ. ප්‍රධානතම ආර්ථික කටයුත්ත වනුයේ වී වගා කිරීමයි. යල, මහ කන්න දෙකේදීම වී වගා කිරීමේ පහසුකම ඇති අතර ජලය නිකුත් කිරීමෙන් පසු වී වගාව සඳහා

බිම් සැකසීමේ කාර්යයේ සිට වී වපුරනතුරු මාස 1 1/2 ක පමණ කාලයක් ජනතාව වගාකටයුතු වල නියැලී සිටී. මෙම කාර්යයන් සඳහා බහුල ලෙසම පවුලේ ශ්‍රමය යොදාගන්නා අතර සුළු වශයෙන් කම්කරු ශ්‍රමය යොදාගනී. මාස 3-4 වයස් කාණ්ඩවල වී වගාකරන හෙයින් අස්වනු නෙලනතුරු මාස 3 1/2-4 ක කාලයක් බලාසිටීමට සිදුවේ. අස්වනු නෙලන සමය බෙහෙවින් ශ්‍රමය අවශ්‍ය වන කාලයකි. එම කාලයට අස්වනු නෙලීම සඳහා අධික වියදම්දරා මඩකලපුව ප්‍රදේශයෙන් කම්කරුවන් ගෙනඒම සිදුවේ. මෙයද මාස 1-1 1/2 ක් පමණ කාලයකි. මෙම නිසා පෙනෙන්නේ වී වගාවේදී ශ්‍රමය යෙදිය යුතු වන්නේ කාලීනව බවයි. වී වැපිරීම සිදුකරන අතර පැළ සිටුවීමක් දක්නට නොලැබේ. එහෙත් ඇතැම් කන්නවල වපුරන සමයේදී වර්ෂාව හේතුවෙන් වී පැළ පොකුරු සෑදීමක් වන නිසා එම පොකුරු ගලවා පාළු සිටුවීමට සිදුවේ. මෙය පවුලේ කාන්තාවන් විසින් කරනු ලබයි. වී වගාවේ බිම් සැකසීම පළමු හීය, දෙවන හීය සහ පෝරු ගෑම යනුවෙන් අවස්ථා තුනකදී සිදුකල යුතු වන්නේය. මේ සඳහා මුල් අවධියේදී බහුල ලෙස යොදා ගත්තේ මී ගවයන්ය. එමනිසා බිම් සැකසීමේ වියදම ඉතා අඩු මට්ටමක පැවතිනි. එහෙත් 60 දශකයේදී ට්‍රැක්ටර් භාවිතය ඇරඹීමත් සමග මී ගවයන් ක්‍රමයෙන් ඉවත්වූ අතර බිම් සැකසීමේ වියදම් ඉහළ මට්ටමක් ගෙන ඇත. මේ නිසා වී නිෂ්පාදන වියදම සැළකියයුතු අන්දමින් ඉහළ මට්ටමක පවතී. වී වපුරා අස්වනු නෙලනතුරු කාලය ගෙවීන්ට අමතර ආදායමක් උපයා ගැනීම පිනිස අමතර රැකියාවක නිරතවීමට අවස්ථාව ඇත. එහෙත් වඩු, මේසන් වැනි ශිල්පීන් හැරුනු විට වැඩි පිරිසක් වන ජනතාව ඵලදායි ආර්ථික කටයුත්තක නියැලෙන බවක් දක්නට නොලැබේ. මෙම කාලය තුළ සිදුකෙරෙන දෙවන ප්‍රධානතම ආර්ථික කටයුත්ත වනුයේ ගොඩ ඉඩම වගා කිරීමයි. මෙහි මඤ්ඤොක්කා, මිරිස්, එලවළු, කව්පි, මුං සහ වෙනත් පළතුරු බෝග වගා කිරීමෙන් පවුලේ පරිභෝජනය සඳහා අවශ්‍ය අළුත් ආහාරපාන සපයාගැනීම සිදුවේ. ගමෙහි වර්තමාන ජනගහන සංයුතිය අනුව වැඩිම පිරිසක් සිටින්නේ ශ්‍රම බලකායට අයත් වයස් සංයුතිය තුලය. ගොවිතැන් කටයුතුවල නිරතවනුයේ පාසැල් හැරගිය තවමත් රැකියාවක් නොකරන තරුණ පිරිස සහ පවුල්වල දෙමව්පියන්ය. මෙම වැඩිහිටි ජනතාව කෘෂිකර්මයට පරිබාහිර වශයෙන් වෙනත් ආදායම් උත්පාදන වැඩක යෙදීමේ ඇති වැදගත්කම අවධාරණය කලද, පලපුරුදු වී ගොවිතැන හා ගොඩ ගොවිතැනට පරිබාහිර වූ වෙනත් රැකියාවක් ඇරඹීමේ චකිතයක් හා පසුබාන ගතියක් මොවුන් තුළ දක්නට ලැබේ. ප්‍රාග්ධන හිඟය, පුහුණුවක් නැතිකම, උපදෙස් නැතිකම, අලෙවි ගැටළු මෙම පසුබාන ස්වභාවය තවත් වැඩිකිරීමට හේතුවී ඇත. සත්ත්ව පාලනයේ නියැලීම ඉතා අඩු මට්ටමක පවතී. සත්ත්ව පාලනය සම්බන්ධ ව්‍යාප්ති සේවයේ පවත්නා දුර්වලතා ප්‍රධාන වශයෙන්ම සත්ත්ව පාලනය කෙරෙ ජනතාව යොමු නොවීමට හේතුවී ඇත. කුලී වැඩ වැනි තාවකාලික රැකියාවල යෙදෙන පිරිසද ඉතා අඩු මට්ටමක පවතී. වර්තමානයේදී මෙම ජනතාව එකම සහ ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස සැළකීමට පුරුදුව ඇත්තේ වී වගාවෙන් ආදායම් ලබාගැනීමයි. මෙම ගමට අයත් කොටසක් වන පිටියේ කොටස ජනපදිකයන් නොවන කුඹුරු ඉඩම්ද හිමි නැති පිටින් පැමිණි පවුල් 19 ක් පමණ සිටින ප්‍රදේශයකි. ගමේ වෙනත් කොටස් සමග සසඳන විට මෙම කොටසේ ජනතාව ඉතාම දිළින්දෝය. ඔවුන්ගේ මූලිකම ජීවනෝපාය වනුයේ කුලී වැඩයි.

## 2.4.1 ප්‍රධාන ආර්ථික කටයුතු

ගොවි ජනපදයක් වන මෙම ප්‍රදේශයේ ප්‍රධානතම ආර්ථික කටයුත්ත වනුයේ වී වගාවයි. එක් පවුලකට කුඹුරු අක්කර 5ක්ද ගොඩ අක්කර 3ක්ද රජයෙන් ලබාදී ඇත. වාරිමාර්ග පහසුකම් මනාසේ සළසා ඇති බැවින් යල මහ කන්න දෙකේදීම වී වගාකිරීමට පුළුවන. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවත්



21451

පුස්තකාලය
LIBRARY
HARTI

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් සිය ව්‍යාපෘති කටයුතු ශක්තිමත් ලෙස මෙම ප්‍රදේශයේ පවත්වාගෙනයාමත්, මින්නේරිය නේවාසික කළමනාකරණ ආයතනය විසින් නිසි කෘෂි කළමනාකරණයක් පවත්වා ගෙනයාමත්, ගමේ ගොවි සංවිධානයේ මනා කැපවීමත් නිසා වී වගාව සාර්ථක අන්දමින් පවත්වාගෙන යාමට හැකිවී ඇත. වර්තමානයේ මෙම ජනපදවල ජීවත්වන්නේ දෙවන සහ තුන්වන පරපුරේ ගොවීන්ය. මේ නිසා අක්කර 8ක ඉඩම් ඒකකය බෙදීයාමකට ලක්වීමෙන් එක් පවුලකට හිමි ඉඩම් කොටස කුඩා වී ඇත. එසේ වුවත් ප්‍රදේශයේ ගොවීන් අක්කර 10 වී බුසල් 90-100 අතර පරාසයක ඉහළ අස්වැන්නක් ලබාගැනීමට සමත් වී ඇත. සෑම ගොවි පවුලක්ම වී අතිරික්තයක් නිපදවන අතර එය අලෙවි කරයි. වර්තමානයේදී වී වගාවේ යෙදවුම් මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ නැගීම නිසා නිෂ්පාදන වියදම ඉහළ යාමත්, වී නිෂ්පාදනය සාධාරණ මිලකට අලෙවිකර ගැනීමට අපහසුවීමත් වී ගොවිතැන සම්බන්ධයෙන් උද්ගත වී ඇති ප්‍රධාන ගැටළු වශයෙන් ගොවීන් පෙන්වා දෙයි. ගොවිපවුලකට ලබාදී ඇති අක්කර 3ක ගොඩ ඉඩමේ නිවාස ගොඩනගාගෙන ඇති අතර ඉතිරි කොටසේ ගොඩ බෝග වගා කරයි. ඇතැම් ගොවීන් මෙම ගොඩ ඉඩමද කුඹුරු අස්වද්දා ඇති අතර මාස්කන්නයේදී ප්‍රදේශයට අධික ලෙස ලැබෙන වර්ෂා ජලයෙන් එහි වීවගා කරයි. යල කන්නයේ වර්ෂාව හිඟ බැවින් මෙම කුඹුරු ඉඩමේ වී වගා කිරීමට නොහැකිය.

මෙම ගොඩ ඉඩමේ නිවාස ආශ්‍රිත කොටසේ පොල්, තැඹිලි, කොස්, දෙල් සහ පළතුරු ගස් වර්ගද වැට ආසන්නයේ තේක්ක, හල්මිල්ල වැනි දැව ගස් වර්ගද වගාකර ඇත. ඉතිරි බිම් කොටස ගොඩබෝග වගාව සඳහාද වෙන්කර ඇත. ඇතැම් ගොවීන් තම ගොඩ ඉඩමේ කුඹුරු අස්වද්දා ඇති අතර එහි මාස් කන්නයේදී වී වගා කරයි. සෙසු ගොවීන් මාස් කන්නයේදී ගොඩ ඉඩමේ මඤ්ඤොක්කා, මුං, කවුපි, මාළුමිරිස්, අමුමිරිස් සහ බටු වැනි එළවළු වර්ග වගා කරයි. යල කන්නයේදී බඩ ඉරිඟු, රටකජු සහ එළවළු වගා කරයි. මීට අමතරව කන්න භේදයක් නොමැතිව කෙසෙල් වගා කරයි. ගමේ කෘෂි ළිං 8 ක් පමණ ඇති අතර ඒ යටතේ එළවළු මුං සහ කව්පි වගා කරයි. මාස් කන්නයේ ඔක්තෝම්බර් මැද සිට ජනවාරි පමණ දක්වා ප්‍රධාන වශයෙන් වර්ෂාව ලැබේ. එම නිසා මාස් කන්නයේ ගොඩ ඉඩම් වගාකිරීම සඳහා ප්‍රමාණවත් තරම් ජල පහසුකම් සැපයේ. එහෙත් යල කන්නයේ ජූලි, අගෝස්තු කාලය මෙම ප්‍රදේශයට තද ඉඩෝර සමය නිසා යල කන්නයේ බෝග වගාවට හානි පැමිණේ. ඉදිකර ඇති කෘෂිළිං වල ජලයද සිඳීයන බැවින් කෘෂිළිං යටතේ බෝග වගාවටද හානි පැමිණේ. ගොවි ජනපද සැලසුම් කරන විට ගොඩ ඉඩම් වගා කිරීම සඳහා උස්සාන වාරිමාර්ග ක්‍රමයක් සකස්කර මනා ලෙස ඉදිකරන ලද ඇල පද්ධතියක් මගින් ගොඩ ඉඩම් වගාවට ජලය සැපයීමට පහසුකම් සළසා තිබුණි. ජලපොම්පාගාරයක් මගින් මෙම ඇල පද්ධතිය වෙත වාරිජලය සපයන ලදී.. එහෙත් පසුකාලීනව මෙම ජලපොම්පාගාරය අඩපන වී උස් ඉඩම්වලට ජලය සැපයීම නැවතිනි. යළිත් ප්‍රධාන වාරිමාර්ග ඇලේ සිට දමන ලද කොන්ක්‍රීට් පයිප්පයක් මාර්ගයෙන් ජලය සැපයීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු සළසා තිබුණි. මින්නේරි වාරිමාර්ගය සඳහා සැපයෙන මහවැලි ජලය සීමිත වීම නිසා වාරිමාර්ග දෙපාර්තමේන්තුව උස් ඉඩම් සඳහා ජලය සැපයීම නැවැත්වීමේ තීරණයක් ගැනීම නිසා වාරිමාර්ග ජලයෙන් උස් ඉඩම් වගා කිරීම 1980 දශකයේදී නවත්වා දැමීමට සිදුවිය. මෙම නිසා උස් ඉඩම්වල බෝග වගාකිරීම සාර්ථකව කළහැක්කේ මාස් කන්නයේදී පමණි. මෙම ගොඩබෝග වගාවෙන් ලබාගන්නා අස්වැන්න පවුලේ පරිභෝජනය පිණිස යොදාගැනීම බහුලව සිදුවන්නේය. එය අතිරික්ත නිෂ්පාදනයක් ලෙස අලෙවි නොකෙරුනද එළවළු, පළතුරු සහ මිරිස් සඳහා වැයවන මුදල ඉතිරිකරගැනීමට හැකිවීමත්, පවුලේ පෝෂණ මට්ටම උසස් තත්ත්වයකින් පවත්වා ගැනීමට හැකිවීමත් ඉතා වැදගත්ය.

සත්ත්ව පාලනය ගොවි ජනපද ආරම්භයේදී ඉතා ප්‍රචලිතව පැවතියද, ජලය නිකුත් කිරීමේ කාල පරාසය නියම කිරීම, කාලසටහනකට අනුව ගොවිතැන් කිරීමට පසුකාලයේදී සිදුවීම වැනි හේතු නිසා බිම් සකස් කිරීම වැනි කාර්යයන් ඉතා ඉක්මනින් කරගැනීමට අවශ්‍ය විය. මේ අතරතුර 70 දශකයේ ට්‍රැක්ටර භාවිතය ප්‍රචලිත වීම නිසා ගව පාලනය ක්‍රමයෙන් ප්‍රදේශයෙන් ඉවත්විය. වර්තමානයේදී ගමේ කිරිගව පාලනය වුවද, ඉතා පහත් මට්ටමක පවතී. ස්වයං රැකියාවල නියැළී සිටින පිරිසද ඉතාම අඩු සංඛ්‍යාවකි. හදුන්කූරු, බිම්මල්, රසකැවිලි නිෂ්පාදනය කිරීම් මෙම ස්වයං රැකියාවලින් සමහරකි. ගමෙහි වැටුප් ලබන රැකියාවල යෙදී සිටින පිරිසද ඉතා සුළු පිරිසකි. ගුරු වෘත්තිය, පොලිසිය, ආරක්ෂක අංශය, විදුලිබල මණ්ඩලය සහ පෞද්ගලික අංශයේ රැකියා මේ අතර ප්‍රධාන වේ. කුලී වැඩහි යෙදී ආදායම් උපයන පිරිසද ඉතා අඩු සංඛ්‍යාවකි.

## 2.4.2 ව්‍යාපෘති බල ප්‍රදේශයේ රැකියා නියුක්තිය.

ව්‍යාපෘති බල ප්‍රදේශයේ පවුල් සංඛ්‍යාව 305 කි. මෙම 305 න් පවුල් 19 ක් හැර අන් සියළුම පවුල් වලට කුඹුරු ඉඩම් හිමිකම ඇති නිසා ප්‍රධාන රැකියාව ලෙස හදුනාගතහැක්කේ ඒ වගාවයි. ඒ ගොවිතැනෙහි නියැලෙන්නේ පවුල්වල දෙමව්පියන්ය. දරුවන් අධ්‍යාපන කටයුතුවල නියැලීම සහ පාසැල් හැරගිය තරුණ පිරිස රැකියා බලාපොරොත්තුව සිටී. ගමෙහි ස්ථිර රැකියාවන්හි නියුතු, හා ස්වයං රැකියාවන්හි නියුතු සුළු පිරිසක් සිටී. සැළකියයුතු පිරිසක් කුලී වැඩ වැනි රැකියාවන්හි නියැලී සිටිති. තාවකාලික රැකියාවල නියුතු පිරිස වැඩි ප්‍රමාණයක් සිටී.

සංසුන්ගම ගමෙහි රැකියා නියුක්තිය.

| වයස් කාණ්ඩය 18ට වැඩි 60 ට අඩු | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ස්ථිර රැකියා | 16 | 23% |
| ස්වයං රැකියා | 12 | 1.8% |
| විදේශ රැකියා | 09 | 1.3% |
| කුලී වැඩ | 132 | 19% |
| තාවකාලික රැකියා | 527 | 76% |

මෙම වගුවේ දක්වා ඇති තාවකාලික රැකියාවන්හි නියුක්ත අයගෙන් වැඩි ප්‍රතිශතයක් පාසැල් හැරගියවුවන්ගෙන් යුක්ත වන අතර ඔවුන් රැකියා බලාපොරොත්තුව කාලීනව තම පවුලේ කෘෂිකාර්මික කටයුතු සඳහා සහාය වෙමින් සිටී.

## 2.4.3. ඉඩම් අයිතිය, බුක්තිය හා ඉඩම් ආශ්‍රිත ගැටළු

ගොවි ජනපදයක් වන මෙම ප්‍රදේශයේ ඉඩම් රජය විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදාදෙන ලද ඉඩම්ය. ගමේ සොහොන් පිටිය ආසන්නයේ අනවසර රජයේ කොටසක පවුල් 19 ක් පමණ පදිංචිවී සිටී. මේවා සඳහා ඔප්පු ලබාදී නැත. මෙම කොටසේ ජනතාව අක්කර 1/4 සිට 1/2 යේ ඉඩම් කොටස්වල පදිංචි වී සිටී. මෙම ගමේ ඉඩම් ආරවුල් එතරම් දක්නට නොමැති අතර පසු රජයෙන් ලැබුණු

අක්කර 8ක ඉඩම් කොටස දෙමව්පියන්ගෙන් දරුවන්ට පැවරීමේදී ඇති වූ ආරවුල් ගැන අසන්නට ඇත. මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශය මෙම ආරවුල් බේරාදීම සඳහා අවශ්‍ය සහාය ලබාදෙයි. වර්තමාන ඉඩම් පරිහරන රටාව විමසීමේදී පෙනීයන්නේ රජයෙන් ලැබුණු ඉඩම් කොටස අයිතිකරු විසින් භුක්ති විඳින අතර, ඇතැම් ප්‍රශ්න නිසා ඉඩමේ ගොවිතැන් කිරීම වෙනත් පුද්ගලයන්ට පවරා දෙයි. එනම් කුඹුරු ඉඩම් බදුදීම සහ වී පොරොන්දුවට දීමයි. යම්කිසි නිශ්චිත කාලයකට තම කුඹුරු ඉඩම වෙනත් අයෙකුට බදු ඔප්පුවකින් බදු දී මුදල් ලබාගනී. වී පොරොන්දුව යනු අක්කර 10 වී බුසල් 12 අයිතිකරුට දීමේ පොරොන්දුව පිට කුඹුර වගාකිරීමට වෙනත් පුද්ගලයෙකුට පැවරීමයි.

### 2.4.4. කෘෂිකර්මය

ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වාරිමාර්ග යෝජනා ක්‍රමයක් යටතේ ඉදිකරන ලද ගොවිජනපදයක් වන මින්නේරිය ගොවි ජනපදයට අයත් ගමක් වන- සංසුන්ගම එක ගොවිපවුලක් සඳහා කුඹුරු අක්කර 5ක්ද ගොඩ අක්කර 3ක්ද වශයෙන් අක්කර 8ක ඉඩම් ඒකකයක් ලබාදී ඇත. කුඹුරු ඉඩම් එක යායට පවතින අතර මිනිසුන් පදිංචිවී සිටින ගොඩ ඉඩම්ද එක යායට සිටින ලෙස සැළසුම්කර ජනතාව වෙත ලබාදී ඇත. ඒ අනුව ගොවිපළ ක්‍රමය වනුයේ එක් ගොවිපළකට අක්කර 5ක් පමණ වූ කුඹුරු ඉඩම සහ අක්කර 3ක් පමණ වූ ගොඩ ඉඩමය. කුඹුරු ඉඩමේ වී වගාකරන අතර නිවස ඉදිකිරීමට භාවිතකළ කොටස හැර ඉතිරි කොටසේ බෝග වගාකිරීම සඳහා යොදාගෙන ඇත. නිවස ආසන්නයේම ප්‍රදේශයේ පොල්, තැඹිලි, අඹ, කොස් සහ වෙනත් පළතුරු වර්ග වැනි ස්ථිර වාර්ෂික බෝග වවාගෙන ඇත. ඉතිරි කොටස කාලීන බෝග වගාකිරීමට වෙන්කර ඇත. ඇතැම් ගොඩ ඉඩම් වලින් කොටසක් වී කුඹුරු ලෙස අස්වද්දා ඇති අතර මාස්කන්නයේ ප්‍රමාණවත් ලෙස වර්ෂාව ලැබෙන හෙයින් වර්ෂා පෝෂිත වගාවක් ලෙස මෙම ඉඩමේ වී වගා කරයි. එලෙස කරනුයේ තම ගොඩ ඉඩමේ ජල පහසුකම් ප්‍රමාණවත් පරිදි ඇත්තේනම් පමණි. යල මහ කන්න පදනම් කරගෙන මාස් කන්නයට මඤ්ඤොක්කා, කව්පි, මුං, මිරිස් සහ එළවළු, කුරක්කන් වගා කරයි. යල කන්නයට බඩ ඉරිඟු, රටකජු, එළවළු සහ තල වගාකරයි. ඊට අමතරව කන්න භේදයක් නොමැතිව කෙසෙල් වගාකරයි. කෘෂි ළිං 8ක් පමණ ප්‍රදේශයේ ඇති අතර එම ගොවීන් ජලය සපයමින් එළවළු, මිරිස්, බඩ ඉරිඟු, වැනි බෝග වර්ග වගාකර අතිරික්ත නිෂ්පාදන වෙළඳපළට අලෙවිකරයි. මේ සඳහා අවශ්‍ය බීජ සපයා ගැනීම ඔවුන් විසින්ම කරන අතර ඇතැම් බීජ වර්ග ගොවිජනසේවා මධ්‍යස්ථානයෙන් මිලට ගනු ලබයි. වී ගොවීන් 1970 දශකයේ අගභාගයේ මාස 3, 3 1/2, 4 යන කෙටි වයස් කාණ්ඩයේ නව වැඩිදියුණු කළ වී ප්‍රභේද වගාකිරීමට පෙළඹී සිටී. වර්තමානයේ කිරි සම්බා, බී.ජී.358, 359,360 වැනි නවතම වී ප්‍රභේද වගා කිරීමට ගොවීන් වැඩිදෙනෙක් උත්සුක වී ඇති අතර එම බීජ වී ගල්අමුණ ගොවිජනසේවා මධ්‍යස්ථානය සහ පොලොන්නරුව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය විසින් ගොවීන්ට ලබාදීමට පියවර ගෙන ඇත. සම්බා වර්ගයේ මෙම වී වෙළඳපලේ ඉහළ මිලකට අලෙවි වන නිසා ගොවීන්ගේ ආදායම් තත්ත්වය වැඩිදියුණු කිරීමට ඉවහල් වී ඇත. ප්‍රදේශයේ සාමාන්‍ය වී අස්වැන්න යහපත් දේශගුණික තත්ත්වයක් යටතේ අක්කර 10 බුසල් 90-100 ප්‍රමාණයේ පවතී.

### 2.4.5 ගොවිජන බැංකු, ණය සැපයීම.

ව්‍යාපෘති බල ප්‍රදේශයේ ගොවිජන බැංකු වැඩ පිළිවෙල, ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙයි. ගොවිජන බැංකු ණය යටතේ පොහොර යෙදීම සඳහා ණය, අස්වනු නෙළීම සඳහා ණය සහ වී සුරැකුම් ඇතිකිරීම සඳහා ණය ලබාදෙයි. මේ සඳහා වාර්ෂික පොලිය 10.5% කි. පහත දැක්වෙන වගුවෙන් පෙන්වන්නේ ඉහත සඳහන් කාර්යයන් සඳහා ගොවිජන බැංකුව විසින් ණය සපයා ඇති ප්‍රමාණයන් පිළිබඳ විස්තරයි.

ගොවිජන බැංකුණය සැපයීම

| වගා කන්නය | ණය ලබාදුන් කාරණය | නිකුත්කළ ණය මුදල රු. | දායකවූ ගොවීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2002/03 මහ | පොහොර යෙදීම | 371860 | 29 |
| 2003 යල | පොහොර යෙදීම | 408180 | 31 |
| 2002/03 මහ | අස්වනු නෙළීම | 105000 | 07 |
| 2002/03 මහ | වී සුරැකුම් සඳහා | 1396000 | 26 |
| 2003 යල | වී සුරැකුම් සඳහා | 950,000 | 19 |

මූලය : තිරසර සංවර්ධන ව්‍යාපෘති වාර්තා- ගල් අමුණ ගොවිජන සේවා මධ්‍යස්ථානය.

ගොවිජන බැංකුව සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වන ගල් අමුණ ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් කුඩා කණ්ඩායම් ක්‍රමයක් ඇතිකර ඇති අතර එම කුඩා කණ්ඩායම් හරහා පොහොර සහ වී සුරැකුම් ණය සපයා ඇත. ගොවිජන සේවා මධ්‍යස්ථානයේ පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය අලෙවි අංශය මගින් අවශ්‍ය තරම් පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය සපයයි.

### 2.4.6 වී සුරැකුම් වැඩසටහන

ගල් අමුණ ගොවිජන සේවා මධ්‍යස්ථානය 2000/01 මහ කන්නයේ සිට සිය බල ප්‍රදේශයේ ගොවි සංවිධාන ආශ්‍රයෙන් කුඩා කණ්ඩායම් ඇතිකිරීම හා ඒ ආශ්‍රයෙන් ගොවිජන බැංකුව මාර්ගයෙන් ණය මුදලක් ලබාදී ගොවියාගේ නිවස තුළම වී ගබඩාකර පසුව වී මිල ඉහළ ගිය පසු වැඩි මිලකට අලෙවි කිරීමෙන් පසුව ගොවි බැංකු ණය මුදල ආපසු ගෙවීමේ "වී සුරැකුම් ණය ක්‍රමය" හඳුන්වා තිබුණි. මෙම ක්‍රමය ------ මෙම හිඟ ණය ගෙවීම පිළිබඳ ප්‍රශ්නය සංසුන්ගම වසම තුළ බරපතල ප්‍රශ්නයක් වූ අතර පසුව මෙම ණය කොටස් වශයෙන් කන්න දෙකක් තුළදී ගෙවීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසා දී ඇත. 2001/02 මහ කන්නයේ සහ 2002 යල කන්නයේ ගොවි නිවෙස්වල වී සුරැකුම් ක්‍රමයට දායක වූ ගොවීන් පිළිබඳව පහත වගුවෙන් පැහැදිලි වේ.

වී සුරැකුම් ක්‍රමයට දායක වීම- සංසුන්ගම

| මහ කන්නය | දායක වූ ගොවීන් සංඛ්‍යාව |
|---|---|
| 2001/02 මහ කන්නය | 78 |
| 2002 යල | 33 |

මූලය : තිරසර සංවර්ධන ව්‍යාපෘති වාර්තා - ගල් අමුණ ගොවිජනසේවා මධ්‍යස්ථානය.

2002/03 මහ කන්නයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ථායිලන්තයෙන් ගෙන්වන ලද "කොකුන්" නමින් හඳුන්වන වී සුරැකුම් ආවරණ එකක් සංසුන්ගමට ලබාදී ඇති අතර එහි කි.ග්‍රෑ.130135 ගබඩා කර තබා කි.ග්‍රෑ. එකක් රු.13.50 මිලට ප්‍රීමා සමාගමට අලෙවි කරන ලදී. මේ නිසා හිඟ ණය කොටසක් අඩුකර ගැනීමට අවස්ථාව සැළසුණි. 2003 යල කන්නයේ "කොකුන්" දෙකක් ලබාදී ඇති අතර එකක වී කි.ග්‍රෑ. 50,000 බැගින් වී කි.ග්‍රෑ. 100000 ක් ගබඩා කර ඇත. මෙම වී තොගයද ප්‍රීමා සමාගමට විකුණා ලැබුන මුදලින් රුපියල් 13.50 බැගින් ගොවීන්ට මුදල් ගෙවා ඇත.

ඉහත සඳහන් කළ ආකාරයට ගොවිජන බැංකුව විසින් වී වගා කිරීම සඳහා වගා ණය සැපයීම කළද, වී සුරැකුම් ක්‍රමය හඳුන්වා දී තිබුණද, තවදුරටත් වෙළඳුන්ගෙන් පොහොර හා කෘෂි රසායනික යෙදවුම් මිලට ගැනීම බහුල වශයෙන් සිදු වේ. මේ නිසා අස්වැන්න නෙලූ විගසම රු.13.50 මිලට වඩා අඩු මිලට පෞද්ගලික වෙළඳුන්ට අලෙවි කර පොහොර ණය ගෙවීමට සිදුවී ඇත. මෙලෙස ඉක්මනින් අඩු මිලට අස්වනු අලෙවි කිරීමට ගොවීන්ට බල කෙරෙන තවත් ප්‍රධාන හේතූන් දෙකක් සොයා ගැනීමට හැකිවිය. එයින් එකක් නම් ප්‍රදේශයේ ගොවීන්ගෙන් සමහර දෙනෙකුට වී අස්වැන්න අලෙවිකිරීමෙන් පසුව ජීවත්වීමට අවශ්‍ය වියදම් දැරීමට සහ ඊළඟ කන්නයේ වගාව පටන්ගැනීමට ප්‍රමාණවත් අතිරික්ත මුදලක් ඉතිරි නොවීය. මෙම නිසා බොහෝ ගොවීන් රත්‍රං බඩු උගස් ගැනීම සහ ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් වල මඩට යොදන රෝද, තෙල් ඉසින යන්ත්‍ර ආදිය උගස් කිරීමට පෙළඹී සිටී. සීමාසහිත කවුඩුල්ල විවිධ සේව සමූපකාර සමිතියේ ග්‍රාමීය බැංකු අංශයේ ශාඛාවන්හි සහ පෞද්ගලික උකස් මධ්‍යස්ථාන වල මෙම ගොවීන් විසින් උකස් තබන ලද උපකරණ ගොඩගැසී ඇති අයුරු ඡායාරූපගත කිරීමටද හැකිවිය. මෙම නිසා කන්නයේ අස්වැන්න නෙළූ විගසම ඒවා අඩු මිලට අලෙවිකර මෙම උකස් කළ බඩු නිදහස් කරගැනීමට ගොවීන් ක්‍රියා කරයි. දෙවන හේතුව වනුයේ අස්වනු නෙළීමේ අධික වියදමයි. මෙම ප්‍රදේශයේ වර්තමානයේ ක්‍රියාත්මක වන ක්‍රමය වනුයේ මඩකලපුව ප්‍රදේශයේ කුලීකරුවන් වී අස්වනු නෙළීමට යෙදවීමයි. අක්කර 1ක ගොයම් කැපීමට රුපියල් 2700-2800 ක් මිලක් අයකරයි. ප්‍රදේශයේ කුලීකරුවන් හිඟ නිසා මෙසේ ඉහළ මිලක් ගෙවා මෙම කුලීකරුවන් යෙදවීම මගින් අස්වනු නෙළීමෙන් පසු මොවුන්ට කුලී ගෙවීමට ලබාගත් වී අස්වැන්නෙන් කොටසක්වත් පවතින අඩුමිලට අලෙවිකිරීමට සිදුවේ. මේ නිසා ගොවීන්ට වී සුරැකුම් ක්‍රමයට දායකවීමට අවකාශයක් ලැබෙන්නේ නැත. මෙම වී වගා ක්ෂේත්‍රයේ පවතින අධික නිෂ්පාදන වියදම නිසා වී ගොවීන්ගේ ජීවන තත්ත්වය පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය කිරීමට හැකිවිය.

### 2.4.7 සත්ත්ව පාලනය

මෙම ගොවිජනපදය ආරම්භයේදී ගවයන් භාවිතය ඉතා පුළුල් ලෙස පැවතුනු බව සහභාගීත්ව ග්‍රාමීය විමසුම් අභ්‍යාසයේදී පැහැදිලි විය. එකල ඉඩම් භාවිතය විශේෂයෙන්ම ගොඩ ඉඩම් ගවයන්ට ආහාර සපයාදීමට පහසුකම් තිබිණි. කල්ගතවීමේදී ක්‍රමයෙන් වී වගාව වගා කාලසටහනකට අනුව සිදුකිරීමේ තත්ත්වයට පත්විය. වාරිමාර්ග ජලය නිකුත්කිරීම කෙටි කාලයකට සීමාවීම නිසා, එම කාලයේදී බිම් සකසා අවසන්කොට වී වැපිරීමට සූදානම් කිරීමට ගොවියාට සිදු විය. 1970 දශකයේ මුල්භාගය පමණ වනවිට ට්‍රැක්ටරය ගොවීන් තුළ ප්‍රචලිත වීම හා ට්‍රැක්ටරය ගොවියාට නඩත්තු කිරීමට හැකි කෘෂිකාර්මික යන්ත්‍රයක් යන ආකල්පය ගොවීන් තුළ ඇතිවිය. ඒත් සමගම වී වගාවට බිම් සැකසීමටද ඉතා සීඝ්‍රලෙස කළයුතු

තත්ත්වයක් උද්ගතවීම නිසා ගවයන් භාවිතයෙන් බිම් සැකසීම අපහසු බවට ආකල්පයක් ගොවීන්තුළ ඇතිවිය. එම නිසා ක්‍රමයෙන් ගව පාලනය ගොවි ගෘහස්ථ තුළින් ඉවත්වීම සිදුවිය. වර්තමානයේ මෙම ව්‍යාපෘති බල ප්‍රදේශය තුළ ඉතාම සුළු පිරිසක් පමණක් ගවපාලනය කරයි. එනම් එළගවයන් 8 දෙනෙක් පමණක් සිටී. මොවුන්ද නව වැඩිදියුණු කරන ලද සතුන් නොවේ. දේශීය වර්ගයේ සතුන් වේ. මොවුන්ගෙන් කිරි ලබාගැනීමක් සිදුවන්නේද නැත. එහෙත් හොඳ වැඩිදියුණු කරන ලද කිරි ගව පාලනයක් ප්‍රදේශයේ ඇති කිරීමේශක්‍යතාවය සහභාගීත්ව ගැමි විමසුම් වැඩසටහනේදී පෙනී ගියේය. තිදැල්ලේ නොව දිංගලි කිරීමේ ක්‍රමයට කිරි ගවයන් ඇති කිරීමට ගොවීන් රාශියක් කැමැත්ත ප්‍රකාශ කළහ. වෙනත් සතුන් ඇතිකිරීම් අතර කුකුළු පාලනය කරන ගෘහස්ථ දෙකක් පමණක් පවතී. මෙම ගමේ සත්ත්ව පාලනය මෙලෙස ඉතා පහත් අඩියකට පත්ව ඇත්තේ මින්නේරිය පශුසම්පත් ව්‍යාප්ති කාර්යාලයේ සිට දියත් කෙරෙන පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ඉතාසීමිත ගණනක් වීමත් ව්‍යාප්ති සේවා ශක්තිමත් නොවීමත් බව ඒ පිළිබඳ විමසන විට පෙනීගිය කරුණකි. මේ සඳහා බලපාන ලද අනෙක් ප්‍රධාන කරුණ වූයේ ප්‍රදේශයේ ගොවීන් එකම ආදායම් මාර්ගය ලෙස සැළකීමත් ඔවුන් සත්ත්ව පාලනය වැනි අතිරේක ආදායම් උත්පාදන මාර්ග කෙරෙහි අවධානයක් යොමු නොකිරීමත්ය. මේ නිසා සත්ත්ව පාලනය පෞද්ගලිකව ගොවීන් විසින් අත්හැර දමන තත්ත්වයකට පත්වී තිබේ. වර්තමානයේ වී වගාව සම්බන්ධව ගැටළු පැනනැගීමත්, නිෂ්පාදන වියදම ඉහළනිසා ලාභය අඩු වීමත් මත යළිත් ගොවීන් අතිරේක ආදායම් උත්පාදන මාර්ග කෙරෙහි සිත් යොමු කිරීමේ තත්ත්වයට පත්ව ඇත. එහෙත් ශක්තිමත් සත්ත්ව පාලන ව්‍යාප්ති සේවයක් නොවීමත් කිරිගව පැටවුන් ලබාගැනීමේ දුෂ්කරතාවයත් මේ පිළිබඳව වූ ව්‍යාප්ති කටයුතු ශක්තිමත් ලෙස ප්‍රදේශය තුළ ක්‍රියාත්මක නොවීමත් නිසා සත්ත්ව පාලනය තවමත් එතරම් වැදගත් ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස ගොවීන් අතර ප්‍රචලිත වී නැත. තිරසර ව්‍යාපෘතිය යටතේ අවධානය යොමුවිය යුතු ක්ෂේත්‍රයක් ලෙස එය හඳුනාගෙන ඇත.

### 2.4.8 ස්වයං රැකියා (ගොවිපළ නොවන කාර්යයන්)

ව්‍යාපෘති බල ප්‍රදේශයේ ස්වයං රැකියාවල නියුතු සංඛ්‍යාව 12කි. බිම්මල් සෑදීම, හඳුන්කූරු නිපදවීම වැනි ස්වයං රැකියා මේ අතරින් ප්‍රධානය. ප්‍රදේශයේ ගොවි ජනතාව වී වගාවට අමතරව වෙනත් ස්වයං රැකියාවන් ඇරඹීමට උත්සුක වී නැත. ඔවුන් එකම ආදායම් මාර්ගය ලෙස සැළකුවේ වී වගාකිරීම පමණි. ස්වයං රැකියාවක හෝ වෙනත් ආදායම් උපදවන දෙවන රැකියාවක් පිළිබඳ සිත් යොමුකිරීමක් නොකිරීමට හේතුවූයේ මුල් කාලයේදී වී වගාව මගින් ලාභයක් සහිතව ප්‍රමාණවත් ආදායමක් ඉපයූ හෙයිනි. ඉතා මෑත කාලයේ සිට වී වගාව ලාභදායී රැකියාවක් බවට පරිවර්තනය වීමත් සමග හා දෙවන හා තුන්වන පරපුරවල් අතර ඉඩම් බෙදීයාම නිසාද වී වගාවට අමතරව වෙනත් ස්වයං රැකියාවක යෙදීමේ වැදගත්කම අවබෝධ වී ඇත. එසේ වුවද දීර්ඝ කාලයක් තිස්සේ ගොවිතැන් කටයුතු කිරීමේ මානසික තත්ත්වයක පසුවූ ජනතාවකට වෙනත් වෘත්තියක් කරා මාරුවීමේදී යම්කිසි බිය සහිත චකිතයක් ඔවුන් තුළ දක්නට ඇත. මෙම ගම්මානයේ ස්වයං රැකියාවක නිරතවීමට තරම් කායික හා මානසික ශක්තිය ඇති තරුණ ගොවීන් සිටින අතර ඔවුන්ගෙන් කීපදෙනෙකු පමණක් සුළු සුළු ස්වයං රැකියා අරඹා ඇත. මෙම ස්වයං රැකියාවන්හි නිරතවූවන් මුහුණ දී සිටින ප්‍රධානතම ගැටළුව වී ඇත්තේ තමන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමයි. මැදිරිගිරිය නගරයේ සිට ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ස්වයං රැකියා පුහුණුව ලබාදී ස්වයං රැකියා සඳහා යොමුකර ඇත.

ප්‍රදේශය විශාල වශයෙන් ඒ නිෂ්පාදනය කරන නිසා ඒ ආශ්‍රිත ස්වයං රැකියා ඇරඹීමේ ඉඩකඩ පවතී. ගෘහාශ්‍රිත සහල් නිෂ්පාදනය, සහල් පිටි නිෂ්පාදනය, සහල් පිටි ආශ්‍රිත ආහාර වර්ග හා රසකැවිලි නිෂ්පාදනය ඇරඹීමේ හැකියාව පවතී. මේ හැර ගඩොල් නිෂ්පාදනය කිරීමේ ඉඩ ප්‍රස්ථාද බොහෝ දක්නට ඇත.

## 2.5 ආදායම් මට්ටම

ගමේ මුළු පවුල් සංඛ්‍යාව 305 කි. මේ අතරින් 19% හෙවත් පවුල් 60 ක් සමෘද්ධි සහනාධාර ලබයි. සෙසු පවුල් ආදායමේ අවම සීමාවට වඩා ඉහළ ආදායම් මට්ටමේ සිටින් පවුල් වෙයි. මෙම පවුල් වල ආදායම් ප්‍රභවය වී ඇත්තේ වී වගාවයි. වී වගා කරන පවුල් වල පුද්ගලයන් 16 දෙනෙකු ස්ථිර රැකියාවලත්, පුද්ගලයන් 9 දෙනෙකු විදේශ රැකියාවලත් නියුක්තව සිටී. ඇගළුම් කම්හල් වැනි පෞද්ගලික අංශයේ රැකියාවන්හි නිරතව සිටින සංඛ්‍යාව 132 ක්.

විවිධ මට්ටම් වල සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව.

| සමෘද්ධි ප්‍රතිලාභ ලබන මට්ටම | පවුල් සංඛ්‍යාව |
|---|---|
| රු.250 | 02 |
| රු.350 | 16 |
| රු.400 | 25 |
| රු.900 | 17 |
| රු.1000 | - |

මූලය : ග්‍රාම නිලධාරී වාර්තා

## 2.6 අධ්‍යාපන තත්ත්වය

මෙම ගමේ සියළු දෙනාටම කියවීමේ හා ලිවීමේ හැකියාව ඇත. සාක්ෂරතාවය ස්ත්‍රී පුරුෂ වශයෙන් ගත්විට දෙපක්ෂයටම 100% ක සාක්ෂරතාවයක් ඇත. මෙම ගමේ ජනතාව අධ්‍යාපනය තම දරුවන්ට ලබාදීම පිළිබඳව උනන්දුවක් දක්වයි. එමනිසා සෑම පවුලකම දරුවන් පාසැල් යයි. වයස 14ට අඩු කිසිම දරුවෙකු පාසල් නොයා සිටීමක් පිළිබඳව වාර්තාවී නැත. වර්තමානයේ ගමේ වයස 18ට වැඩි 60ට අඩු ජනගහනයේ අධ්‍යාපනික තත්ත්වය පහත සඳහන් වගුව මගින් වඩා පැහැදිලිව පෙන්වයි.

සංගුන්ගම ගම්මානයේ වයස 18ට වැඩි 60ට අඩු අයගේ අධ්‍යාපනික තත්ත්වය.

| අධ්‍යාපනික තත්ත්වය | සංඛ්‍යාව | |
|---|---|---|
| | ගැහැණු | පිරිමි |
| උපාධි සමත් | 3 | 6 |
| උසස්පෙළ සමත් | 15 | 17 |
| සාමාන්‍යපෙළ සමත් | 35 | 32 |
| සාමාන්‍යපෙළ දක්වා | 227 | 265 |

මූලය : ග්‍රාම නිලධාරීන්ගේ වාර්තා

මෙම වගුව අනුව පෙනී යන්නේ සංඛ්‍යාත්මකව ස්ත්‍රී පක්ෂයට සාපේක්ෂව පිරිමි පක්ෂය අධ්‍යාපනික මට්ටම අතින් ඉහළින් සිටින බවයි. පාසැල් හැරගිය තරුණ තරුණියන්ගේ වෘත්තිය පුහුණුව ලැබීම සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු මධ්‍යස්ථානයක් කි.ම.7ක් ඈතින් හිඟුරක්ගොඩ නගරයේ ක්‍රියාත්මකය. මීට අමතර කාර්මික සංවර්ධන මණ්ඩලය, බහුතාක්ෂණික ආයතන වැනි පුහුණු ආයතන පොලොන්නරුවේ පිහිටා ඇත.

සංසුන්ගම ගම මධ්‍යයේ සංසුන්ගම කනිෂ්ඨ විද්‍යාලය පිහිටා ඇත. මෙම පාසැලෙහි විදුලිය සහිත ප්‍රධාන ගොඩනැගිලි තුනක්ද ගුරු නිවාස 4ක්ද නලළිං 1ක්ද හොඳ තත්ත්වයේ වැසිකිළි 1, කැසිකිළි 1 හා ක්‍රීඩාපිට්ටියක්ද පාසලට ආදායම් ලබාගැනීම සඳහා කුඹුරු අක්කර 3ක්ද ලබාදී ඇත. වර්තමානයේ මෙම විදුහල අඩපන වූ තත්ත්වයක පවතී. ළමයි සංඛ්‍යාව අඩුවී ගොස් වර්තමානයේ 18කට සීමාවී ඇත. ගුරුවරුන් 3 දෙනෙක් සිටී. මෙහි පන්ති 4ක් පමණ පවත්වන අතර ඒවා නම් 1,2,3,5 වසර පන්ති වේ. 4ට ළමයි නැත. මෙතරම් සම්පත් ප්‍රමාණයක් සහිත පාසැල අඩපනවීමට වගකිවයුත්තේද ප්‍රදේශයේ දෙමව්පියන්මය. එයට හේතුව මෙයට කි.මී.4 1/2 දුරින් වූ කවුඩුල්ල මහා විද්‍යාලයට අ.පො.ස. සා.පෙළ සිට උසස් පෙළ දක්වා පංති සඳහා ළමුන් යවන අතර සංසුන්ගම ප්‍රාථමික විදුහලට ගිය එවැනි ළමයින් සිය සහෝදර සහෝදරියන් සමග කවුඩුල්ල මහා විදුහලට යාමෙන් සංසුන්ගම ප්‍රාථමික විදුහලට ළමයි නැතිවීමයි. කවුඩුල්ල මහා විද්‍යාලයේ ළමයි 1000 ක් පමණ ඉගෙනගනී. උසස් පෙළ පන්තිද කලා අංශයෙන් පමණක් පැවැත්වේ. මෙම පාසැලේ ඉංග්‍රීසි පන්තිද පැවැත්වේ. ගුරුවරුන් සංඛ්‍යාව 20කි. සංසුන්ගම ගමේ ජනතාවගේ අදහස්වලට අනුව කවුඩුල්ල මහා විද්‍යාලය ළඟ පාත ඇති හොඳ පාසැලකි.

පෙර පාසැල් අධ්‍යාපනය සඳහාද සංසුන්ගම ගමේ පහසුකම් ඇත. වර්තමානයේ ගමේ කෙලවරවල් දෙකේ පෙර පාසැල් දෙකක් පැවැත්වේ. මෙම පාසැල් දෙක සඳහාම ළමයි 37 දෙනෙක් සහභාගී වෙයි.

අධ්‍යාපනය සම්බන්ධයෙන් නිරීක්ෂණය කරන විට පෙනීයන්නේ මෙම ප්‍රදේශයේ දෙමව්පියන්ද රටේ වෙනත් පළාත්වල මෙන් තම දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට උනන්දුවක් දක්වන බවයි. දෙමව්පියන් ගොවියන් වුවද කුමන කැපවීමක් කර හෝ දරුවන්ට උසස් අධ්‍යාපනයක් ලබාදීම මෙම ජනතාවගේ අභිලාෂය බව නිරීක්ෂණය කළහැකි විය.

## 2.7 නිවාස තත්ත්වය හා අයිතිය.

ගොවි ජනපද ආරම්භයේදී මෙම ප්‍රදේශවල පදිංචි කරනු ලැබූ ජනපදිකයන් සඳහා රජය විසින් නිවාස ගොඩනංවා දෙන ලදී. කාමර 2ක්, මැද සාලයක්, කුස්සියක් ඇතුළු උළු සෙවිලි කරන ලද ජනපද නිවසක් ඉදිකර දී ඇත. දශක හතරක් පමණ දැනට ඉක්මවා ඇති මෙම නිවෙස වර්තමානය වනවිට විවිධ වෙනස්කම් වලට භාජනය කර ඇත. වර්තමානයේ පවුලේ සාමාජික සංඛ්‍යාව වැඩිවී ඇති නිසා නිවසේ වර්ග ප්‍රමාණය විශාල කර ඇත. ඇතැම් පවුල්වල දරුවන් අතර ඉඩම බෙදීගොස් ඇති හෙයින් අක්කර 3 ගොඩ ඉඩමේ නව නිවාස කීපයක් ගොඩනගා ඇත. මෙම ගමේ පිටියේ කොටස නමින් හඳුන්වන ප්‍රදේශයේ නිවාස 19ක් ඇත. මෙහි වාසය කරන්නේ ජනපදයේ මුල් පදිංචිකරුවන් නොවේ. ජනපදයේ සුසානභූමිය ආසන්නයේ

රක්ෂිත හෙලිපෙහෙලි කර අක්කර 1/4ක වැනි ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසක නිවෙස් ඉදිකරගෙන ජීවත් වන මෙම පදිංචිකරුවන් පිටින් පැමිණි සංක්‍රමණිකයන් වෙයි. මෙම නිවෙස් 19ම කටුමැටි බිත්ති සහිත ඉතා දුර්වල තත්ත්වයේ නිවෙස් වෙයි. ගමෙහි සෙසු නිවෙස් හොඳ වාතාශ්‍රය සහිත ගඩොලින් ඉදිකරන ලද හොඳ තත්ත්වයේ නිවෙස් වෙයි.

සංසුත්ගම ගමේ නිවෙස්වල වහල වල තත්ත්වය.

| වහලවල ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|
| උළු සහ ඇස්බැස්ටෝස් සෙවිලි කළ | 282 |
| පොල් අතු සෙවිලි කළ | 23 |

මූලය : ග්‍රාම නිලධාරී වාර්තා

මෙම ගමේ ඇති නිවාස සියල්ලම එහි පදිංචි පුද්ගලයන්ට අයත් ඒවා වෙයි. බදු, උගස් සහ කුලී පදනම පිට නිවාසවල ජීවත්වන පිරිසක් මෙහි නැත. එයට විශේෂයෙන්ම හේතුවී ඇත්තේ නගරයෙන් තරමක් ඈතින් මෙම ගම පිහිටීමත් ගමේ ඇති පාසැලේ ගුරු නිවාස පහසුකම් තිබීමත් ග්‍රාමනිලධාරී ගමේම පුද්ගලයකුවීමත් නිසාය. එම නිසා රජයේ රැකියාවල නියුතු පුද්ගලයින්ටත් කුලියට නිවාස ලබාගැනීමට අවශ්‍ය නොවේ.

## 2.8 සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම්.

ව්‍යාපෘති බල ප්‍රදේශය තුළ පිහිටුවා ඇති සෞඛ්‍ය මධ්‍යස්ථාන වනුයේ මැදිරිගිරිය රෝහල සහ හිඟුරක්ගොඩ රෝහලයි. ගම තුළ පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන නැත. හිඟුරක්ගොඩ නගරයේ පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන ඇත. මෙම ප්‍රදේශයේ ජනයාගේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් සහ වෙනත් දරු ප්‍රසූති වැනි අවශ්‍යතාවයන් සඳහා මැදිරිගිරිය රෝහල සහ හිඟුරක්ගොඩ රෝහල වෙත යාමට සිදු වේ. වඩාත් බරපතල රෝගාබාධයකදී පොලොන්නරුව රෝහල වෙත යාමට සිදු වේ. මේ එක් එක් රෝහල් සඳහා අදාල බල ප්‍රදේශයේ සිට ඇති දුර පහත දැක්වෙන වගුවෙන් වඩාත් පැහැදිලි වෙයි.

| රෝහල පිහිටි ස්ථානය | ගමේ සිට ඇති දුර කි.මී |
|---|---|
| මැදිරිගිරිය රෝහල | 5 |
| හිඟුරක්ගොඩ රෝහල | 9 |
| පොලොන්නරුව රෝහල | 17 |

පවුල් සෞඛ්‍ය සේවිකාව සතියකට දින 2 ක් පමණ සංචාරය කරමින් ළමා සහ මාතෘ සෞඛ්‍ය සම්බන්ධයෙන් වැඩකටයුතු කරනු ලබයි. ඊට අමතරව මැදිරිගිරිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය විසින්ද ප්‍රදේශවාසීන්ගේ සෞඛ්‍ය සංරක්ෂණ කටයුතු උදෙසා සේවාවන් සපයයි. මෙලෙස කරන ලද සේවාවක් ලෙස සඳහන් කළ හැක්කේ සංසුත්ගම ගම්මානයේ පානීය ළිං වල ජලය පරීක්ෂා කොට බීමට සුදුසු ළිං සහ නුසුදුසු ළිං මොනවාදැයි ජනතාවට අවබෝධයක් ඇතිකර දීමයි. ඒ අනුව වර්තමානයේ සෑම ගෙවත්තකම ඇති ළිං වලින් පානීය ජලය ලබා නොගන්නා අතර දුර බැහැර ගොස් බීමට සුදුසු යයි නිර්දේශ කරන ලද ළිං වලින් ජලය ගෙනවුත් පානය කිරීමට ජනතාව පුරුදු වී සිටී.



පුස්තකාලය
LIB
හෙ.ජ. ... ජ.පු ආ
HARTI

### 2.8.1 විශේෂිත ලෙඩ රෝග

කෘෂිකාර්මික කටයුතු වල යෙදීමේදී මුහුණ පෑමට සිදුවන විශේෂිත රෝග ලෙස අළුහම්,වන දද කුෂ්ඨ, ඇස් රෝග, ඇස් පෙනීම දුර්වල වීම සිදුවන බව ගම්වැසියන් සමග කළ සාකච්ඡා වලදී හෙළිදරව් විය. එම රෝග වැළදීමට හේතුව ලෙස ඔවුන් විශ්වාස කරන්නේ තද අව්වේ හිඳිමින් කුඹුරු වල වැඩ කිරීමයි. වියළි කලාපයේ වැඩි වශයෙන් සර්පයින් සිටින නිසාත් කෘෂිකාර්මික කටයුතුවලදීත් සර්ප දෂ්ඨ කිරීම් සිදුවේ. මෙම ප්‍රදේශයේ වසරකට සර්ප දෂ්ඨ කිරීම් 5,6 පමණ සිදුවන බවත් එවැනි අවස්ථා වලදී රජයේ රෝහල වෙත ගොස් ප්‍රතිකාර ගන්නා බවත් ඔවුන් පැවසීය. මීට අමතරව මැලේරියා රෝගයත් විශේෂයෙන්ම යල කන්නයේ අධික පෑයු කාලයට ජලය දූෂණය වීම නිසා උදර රෝග හා වකුගඩු ආබාධ වැළදෙන බවත් හෙළි විය. දැනට වකුගඩු රෝගීන් දෙදෙනෙකු මිය ගොස් ඇත. මෙම සියළුම සෞඛ්‍ය ගැටළු සඳහා ප්‍රතිකාර ගැනීමට හිගුරක්ගොඩ රජයේ රෝහල හෝ මැදිරිගිරිය රජයේ රෝහල වෙත ගොස් ප්‍රතිකාර ලබාගැනීම සාමාන්‍ය ක්‍රමය වේයි.

### 2.8.2 වැසිකිළි භාවිතය

ගමේ සෑම නිවසකටම වැසිකිළියක් ඇත. ගමේ වෙනස් කොටස් සමග සංසන්දනාත්මකව බලන විට ඉතා දුර්වල සමාජ තත්ත්වයක් සහිත කොටසක් වන පිටියේ කොටසේ පවා වැසිකිළි භාවිතය දක්නට ලැබේ. ගමේ ජනතාවගේ හැකියාවන් අනුව ගොඩනගාගෙන ඇති වැසිකිළිවල ස්වභාවය පහත දැක්වෙන සටහනින් පැහැදිලි වේ.

සංසුන්ගම වැසිකිළි වල ස්වභාවය.

| වැසිකිළියේ ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|
| නාන කාමරය තුලට ඉදිකර ඇති වැසිකිළි | 03 |
| ජල මුද්‍රිත වැසිකිළි | 294 |
| වල වැසිකිළි | 8 |
| එකතුව | 305 |

මූලය : ග්‍රාම නිලධාරිගේ වාර්තා

### 2.8.3 ජල පහසුකම් සපයාගැනීම

ගමේ ජනතාව ජල පහසුකම් සපයනුයේ තම වතුවල ඉදිකරගෙන ඇති ළිං වලිනි. මා මීට ඉහතදීද සඳහන් කළ පරිදි මෙම සෑම ළිඳකින්ම ලබාගන්නා ජලය බීමට පාවිච්චි නොකරයි. බීමට සුදුසු යැයි නම් කෙරුනු ළිං වලින් පමණ වතුර සපයා ගනී. එහෙත් සේදීම හා නිවසේ වෙනත් අවශ්‍යතා සඳහා මෙම ළිං ජලය පාවිච්චි කරයි. ගෘහ අවශ්‍යතාවයන් සඳහා ජලය ලබාගන්නා ප්‍රධාන ක්‍රම 3ක් ගැන දැනගන්නට ලැබුණි. ඒවා පහත සඳහන් පරිදි වේ.

ජලය සපයාගන්නා මූලාශ්‍රයන්.

| ජල මූලාශ්‍රය | සංඛ්‍යාව |
| --- | --- |
| ආරක්ෂිත ළිං | 105 |
| නල ළිං | 34 |
| වෙනත් ක්‍රම- තද නියං කාල වලට ඔයේ වලවල් හාරා ජලය ලබා ගැනීම | 144 |

මූලය : ග්‍රාම නිලධාරීගේ වාර්තා

නෑම සඳහා ජලය සපයාගන්නේ ගම සීමාවෙන් ගමන් කරන ප්‍රධාන වාරිමාර්ග ඇලෙනි. යල කන්නයේ අස්වනු නෙළීමෙන් පසු ඇලේ ජලය එවීම නතර කරන නිසා ගමේ සිට කි.මී. 3 ක් පමණ ඈතින් පිහිටා ඇති පිනාමංකඩ අමුණ නම් ස්ථානයට යයි. මෙම ස්ථානයේ ජල මාර්ගයේ ජලය සිඳෙන්නේ නැත. ඇතැම්විට වාරිමාර්ගය ආසන්නව වලවල් කැපීමෙන් ජලය ලබාගනී.

## 2.8.4 ආහාර පිසීම සඳහා ඉන්ධන භාවිතය.

ගමේ ජනතාව ආහාර පිසීම සඳහා යොදාගන්නා ඉන්ධන ප්‍රභවය වන්නේ දරයි. ආහාර පිසීමට විදුලිය පාවිච්චි කිරීම නොකරන අතර ඉතා සුළු වශයෙන් ගෑස් පාවිච්චි කරයි.

ගමේ ජනතාව ආහාර පිසීම සඳහා යොදා ගන්නා ඉන්ධන ප්‍රභවයන්

| ඉන්ධන ප්‍රභවය | ගෘහස්ථ සංඛ්‍යාව |
| --- | --- |
| දර භාවිතය | 288 |
| විදුලිය | - |
| ගෑස් භාවිතය | 17 |
| එකතුව | 305 |

මූලය : ග්‍රාම නිලධාරීගේ වාර්තා

දර භාවිතය සඳහා දර සපයාගන්නේ තම ගෙවතුවල වගාවී තිබෙන ගස් වලිනි. පවුල් සංඛ්‍යාව වැඩි වීමත් සමගම දර හිඟවී ඇති අතර දර සපයා ගැනීම පිනිස රක්ෂිත කැළෑද ආසන්නයේ නැත.

විදුලිය බලය සපයාගෙන ඇති පවුල් සංඛ්‍යාව 263 කි. පවුල් 42 ක් තවමත් විදුලි බලය සපයාගෙන නැත. තරමක දරිද්‍රතාවයෙන් පෙළෙන ප්‍රජාවක් වාසය කරන පිටියේ කොටසට මේ දක්වා විදුලි බල පහසුකම් සපයාදී නැත. සිය ප්‍රදේශයට විදුලිය සපයාදෙන ලෙස මෙම කොටසේ ජනතාව ඉල්ලා සිටී. මෙම ගමේ දුරකථන පහසුකම් සපයාගෙන ඇති පවුල් සංඛ්‍යාව ඉතාම සුළු ප්‍රමාණයකි. එනම් පවුල් 4 කි. මේ පිළිබඳව සාකච්ඡා කිරීමේදී ගමේ ගොවි මහතුන් බොහෝ දෙනෙක් ප්‍රකාශ කළේ දුරකථන පහසුකම් පාවිච්චි කිරීමට තරම් වත්කමක් ඔවුන්ට නැති බවයි. එම නිසා දුරකථන පහසුකම් ඇතිකර ගැනීම පිළිබඳව එතරම් අවශ්‍යතාවයකින් කථා නොකරන බව නිරීක්ෂණය කළ හැකිවිය.

### 2.8.5 වෙනත් පහසුකම්

ගමේ ජනතාවගේ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය බැංකු, ගොවිජන සේවා මධ්‍යස්ථාන, රැකියාවන් සඳහා ඇගළුම් කම්හල් ආදියද ගමට ආසන්නව පිහිටා ඇත. ගම තුළ සර්වෝදය බැංකුවක් ඇත, රජරට සංවර්ධන බැංකුවේ ශාඛාවක් ගල් අමුණ නගරයේ පිහිටා ඇත. ගොවිජන සේවා මධ්‍යස්ථානය සහ ඇගළුම් කම්හලද පිහිටුවා ඇත්තේ ගල් අමුණ නගරයේය. කවුඩුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය හා ග්‍රාමීය බැංකුවද ගමේ සීමාවේ පිහිටා ඇත. ප්‍රදේශයේ ජනතාවගේ වැඩි සහභාගීත්වයක් සහිත ගොවි ජන බැංකුව පිහිටා ඇත්තේද ගල් අමුණ නගරයේ පිහිටි ගොවිජන සේවා මධ්‍යස්ථානයෙහිය. ගොවිජන බැංකුව මගින් වී වගා ණය, පොහොර ණය, අස්වනු නෙළීම සඳහා ණය, ට්‍රැක්ටර් මිලදී ගැනීම සඳහා ණය වැනි ණය ඉතා පහසු පොළිය මත (10.5%) සපයයි. කවුඩුල්ල විවිධ සේවා සමුපකාර සමිතියද පහසු පොළිය මත ගොවි ණය සැපයීම, ස්වර්ණාභරණ සහ වෙනත් භාණ්ඩ උගසට තබාගෙන ණය සැපයීම, වී සුරැකුම් ක්‍රමය හඳුන්වා දීම වැනි ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් සලසයි. ගල් අමුණ ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින්ද ගොවීන්ට අවශ්‍ය පොහොර හා කෘමිරසායනික ද්‍රව්‍ය බීජ හා පැළ, බිම් සැකසීම සඳහා ට්‍රැක්ටර්, ගොවිජන බැංකු ණය, වී සුරැකුම් ක්‍රම, කුඩා කණ්ඩායම් මාර්ගයෙන් විධිමත් ණය සැපයුම, පොල් ඉසින යන්ත්‍ර වැනි ගොවි උපකරණ සපයමින් විශාල සේවයක් සිදු කරයි. ඇගළුම් කම්හලේ ප්‍රදේශයේ තරුණ තරුණියන් 400 ක් පමණ රැකියා කරයි.

ගමේ සිට එක් එක් සේවා සැපයුම් මධ්‍යස්ථාන වෙත ඇති දුර

| මධ්‍යස්ථානයේ නම | ගමේ සිට ඇති දුර කි.මීටර් |
|---|---|
| ගල් අමුණ ගොවිජන සේවා මධ්‍යස්ථානය හා ගොවිජන බැංකුව | 2.5 |
| රජරට සංවර්ධන බැංකුව | 2.5 |
| ඇගළුම් කම්හල | 2.5 |
| සී.සහිත කවුඩුල්ල වි.සේ.ස.සමිතිය හා ග්‍රාමීය බැංකුව | 1.5 |

### 2.8.6 ප්‍රදේශයේ මහා මාර්ග

ප්‍රදේශය හරහා වැටී ඇති හිඟුරක්ගොඩ - බුද්ධයාය සී ශ්‍රේණියේ මාර්ගය හැරුණු විට තවත් ග්‍රාමීය බොරළු පාරවල් 11 ක් ඇත. මෙම හිඟුරක්ගොඩ - බුද්ධයාය මාර්ගය සංගුන්ගම ගම හරහා එහි බටහිර මායිමෙන් වැටී ඇත. ගම හරහා ඇති කොටසේ දුර කි.මී.3කි. මෙම මහා මාර්ග කෘෂිකාර්මික ජීවනෝපාය සඳහා අත්‍යවශ්‍යය. ගොවිබිම් කරා පොහොර වැනි යෙදවුම් ප්‍රවාහනයටත් අස්වනු නෙළන කාලයේදී අස්වනු ප්‍රවාහනයටත් අස්වනු මිලදී ගැනීමට පිටපළාත්වල සිට වැඩි වශයෙන් වෙළඳුන් ගෙන්වා ගැනීමටත් මෙම මහා මාර්ග අතිවිශාල සේවයක් සිදු කරන්නේය.


සංසුන්ගම කොටියාස් පාරවල්

| පාර හඳුන්වන ආකාරය | දුර කි.මී. |
|---|---|
| 1. බුද්ධයාය- හිගුරක්ගොඩ මහාමාර්ගය (සී.ශ්‍රේණිය) | 3 |
| 2. L.B 9 ප්‍රධාන පාර පිනාමංකඩ අමුණ දක්වා (බොරළුපාර) | 3 |
| 3. L.B 9 සිට 21 කොටස දක්වා ප්‍රධාන පාර (බොරළු පාර) | 35 |
| 4. 26 හන්දියේ සිට සුසාන භූමිය දක්වා (බොරළුපාර) | 2 |
| 5.26 හන්දියේ සිට 14 කොටස අවසානය දක්වා(බොරළු පාර) | 0.5 |
| 6.F.C 7 කෘෂි පාර | 0.5 |
| 7.32 හන්දියේ සිට සුසාන භූමිය දක්වා | 2.1 |
| 8.L.B. 10 කෘෂි පාර | 1 |
| 9.5 කොටස පාර | 0.7 |
| 10. 21 හන්දියේ සිට L.B 11 පාර | 2 |
| 11. RB 13 පාර | 0.9 |
| 12. 21 කොටස උදාකළ ගම්මාන පාර | 1 |

### 2.8.7 ග්‍රාමීය/ ප්‍රජා සංවිධාන හා ඒවායේ සහභාගීත්වය

ව්‍යාපෘති බල ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන 4ක් ඇත. ඒවා නම් අන්‍යොන්‍යාධාර සමිතිය, ගොවි සංවිධානය, කුලගණ සමිතිය, යෞවන සමාජය හා ක්‍රීඩා සමාජය වශයෙනි. අන්‍යොන්‍යාධාර සමිතිය වැඩිම සාමාජිකත්වයක් සහිත ප්‍රජා සංවිධානය වන්නේය. අවමගුල් කටයුතු වෙනුවෙන් මුදල් ආධාර, ආහාරපාන සහ ජනතා සහභාගීත්වය උපරිම අන්දමින් ලබාදීමට මෙම සමිතිය මගින් කටයුතු සළසා ඇත. මිළඟ ප්‍රබලම සංවිධානය ලෙස හැඳින්විය හැක්කේ ගොවි සංවිධානයයි. ගොවි සංවිධානයේ වර්තමාන සාමාජික සම්ඛ්‍යාව 168 දෙනෙකි. පිරිමි සාමාජිකයන් 124, ගැහැණු සාමාජිකයන් 44ලෙසින් එය සමන්විත වී ඇත. කෘෂිකාර්මික කටයුතු ප්‍රධාන ජීවනෝපාය කරගත් ප්‍රජාවක් වාසය කරන මෙම ප්‍රදේශයේ ගොවි සංවිධානය විසින් එම කෘෂිකාර්මික කටයුතු පහසු කිරීම සඳහා සේවාවන් රාශියක්ම සිදුකරන බව විමසීමේදී දැනගන්නට ලැබුණි. ජල කළමනාකරණ පවත්වාගෙන යාම, කෙත් ඇල නඩත්තුව, ව්‍යාපාර ගොවි සංවිධානයේ රැස්වීම් සඳහා ගමේ ගොවි සංවිධානය නියෝජනය කිරීමින් සහභාගිවීම හා ක්‍රියාකාරීව කටයුතු කිරීම, වී සුරැකුම් ක්‍රමය පවත්වාගෙන යාම, කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය වී සිටින ගොවි සංවිධානයේ ගොවීන්ට පොහොර ණය සඳහා ගොවීන් නිර්දේශ කිරීම් වැනි කටයුතු යෙදෙමින් කෘෂිකාර්මික කටයුතු සඳහා මනා සහයෝගයක් ලබාදෙයි.

සංසුන්ගම



මූලාශ්‍රය: සහභාගීත්ව ගැමි විමසුම් අභ්‍යාසය - සංසුන්ගම

කුලගණ සමිතිය විසින් විහාරස්ථානයේ දියුණුව සඳහා අවශ්‍ය කටයුතු කිරීම, ගමේ සහ ප්‍රදේශයේ අසරණ කොටස් වලට පිළිසරණ වීම සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීම, ගමේ ශ්‍රමදාන මගින් මාර්ග පිළිසකර කිරීම ආදී පුණ්‍ය කටයුතු සහ ප්‍රජා සංවර්ධන කටයුතු සිදුකරයි. ක්‍රීඩා සමාජය හා යෞවන සමාජය විසින් ගමේ තරුණ කොටස්වල සහයෝගය ඇතිව ක්‍රීඩා කුසලතා නැංවීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලබයි. වොලිබෝල්, නෙට්බෝල් වැනි ක්‍රීඩා සඳහා තරුණ තරුණියන් පුහුණු කිරීම හා කොට්ඨාශ මට්ටම හා දිස්ත්‍රික් මට්ටමේ තරග සඳහා ඔවුන් යොමු කිරීමට මෙම සංගම් ක්‍රියාකරයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යෞවන කටයුතු භාර නිලධාරී සමග සම්බන්ධතා පවත්වන මෙම යෞවන හා ක්‍රීඩා සමාජ එම අමාත්‍යාංශ විසින් ලබාදෙන ක්‍රීඩා උපකරණද ලබාගෙන ඇත. වර්තමානයේ ගමේ බොහෝ තරුණ තරුණියන් ඇඟළුම් ක්ෂේත්‍රය හා වෙනත් විවිධ රැකියාවන්හි යෙදීමත් ඔවුන් දුර බැහැර පෙදෙස්වල සිටීමත් නිසා මෙම යෞවන හා ක්‍රීඩා සමාජ එතරම් ක්‍රියාශීලී මට්ටමක නැත.

මෙම ඉහත සඳහන් කරන ලද ග්‍රාමීය ප්‍රජා සංවිධානයන් අතුරින් අන්‍යෝන්‍යාධාර සමිතිය හා ගොවි සංවිධානයේත් පොදු කටයුතුවලට සහභාගීවීමේ ප්‍රතිශතය 85% ක පමණ ඉහළ මට්ටමක් ඇත. කුලගණ සමිතියේ මෙම සහභාගීත්වයේ ප්‍රතිශතය 75% පමණ මට්මක පවතී. යෞවන සමාජයේ හා ක්‍රීඩා සමාජයේ මෙම තත්වය තරමක් පහළ මට්ටමක වන අතර එය 50% - 55% අතර සංඛ්‍යාවකි.

## 2.9 කාන්තාවන්ගේ හා තරුණයන්ගේ

ගමේ ජනතාවගේ අධ්‍යාපනික තත්ත්වය තරමක් මධ්‍යස්ත මට්ටමක පවතී. කාන්තාවන් හා තරුණයන් බහුතරය අ.පො.ස. සා.පෙළ දක්වාවත් අධ්‍යාපනයක් ලැබූවන් වෙයි. එම නිසා ඔවුන්ට බාහිර යමක් ඉගෙන ගැනීමට ඇති හැකියාව ඉහළය. ගමේ කාන්තාවන්ගෙන් 90% දෙනා ඉවුම් පිහුම් වැනි ගෙදර වැඩවල නිරතවීමද, වී වගා බිම් සකස්කරණ සමයේදී ඒ සඳහා සහභාගීවන්නන් සඳහා ආහාර පිසීම, වී වැපිරූ පසුව ගොයම් නෙළීමේ කටයුතු, අස්වනු නෙළන සමයේදීද ආහාර පිසීම වැනි ඉතා වැදගත් වැඩ කොටසක් ඉටුවේ. මේ කරන අතරතුරම දරුවන් බලාකියා ගැනීම හා ඔවුන්ගේ සෞඛ්‍ය හා අධ්‍යාපනික කටයුතු වෙනුවෙන්ද වෙහෙසෙන්නේය. වර්තමානයේ ගෘහමූලික කාන්තාවගේ තත්ත්වය එලෙස වුවත් සිය ගැහැණු දරුවන්ගේ තත්ත්වය මීට හාත්පසින්ම වෙනස් තත්ත්වයක පවතී. සියළුම ගැහැණු දරුවන් පාසැල් අධ්‍යාපනය ලබන අතර පාසැලින් ඉවත්වූවන් ඇඟළුම් ක්ෂේත්‍රයේ විවිධ රැකියා අවස්ථාවන් සඳහා යනු ලබයි. උදාහරණයක් ලෙස තිරසාර සංවර්ධන වැඩසටහන යටතේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ගමේ අරඹන ලද ජුකි මැෂින් පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුව ලැබීම සඳහා පැමිණියේ තරුණ ගැහැණු අයට වඩා පිරිමින්ය. එයින් පෙනීගියේ ගමේ පුරුෂ පක්ෂයේ තරුණයන්ට වඩා තරුණියන්ට රැකියා අවස්ථා වැඩි බවයි.

ගමේ තරුණ තරුණියන්ගේ හැකියාවන් වැඩිදියුණු කරගැනීම සඳහා වූ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් හිඟුරක්ගොඩ පිහිටුවා ඇත. එයට අමතරව ගමතුළට ජුකි මැෂින් පුහුණු මධ්‍යස්ථානයක් අරඹා ඇත. මේවාට අමතරව පොළොන්නරුව වැනි එතරම්ම දුර බැහැර නොවන ප්‍රදේශවල කාර්මික අධ්‍යාපනය ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථාද පවතී.

විනෝද හා ක්‍රීඩා පහසුකම් සඳහා ගමතුළ පිහිටුවා ඇති යෞවන සමාජය හා ක්‍රීඩා සමාජය විසින් ක්‍රීඩා කටයුතු සඳහා පහසුකම් සළස්වා ඇත. ක්‍රීඩා කටයුතු ගමේ පමණක් නොව කොට්ඨාශ මට්ටමේ තරග වලටත් එයින් ජය ලැබූවන් දිස්ත්‍රික් මට්ටමේ තරග වලටත් ඉදිරිපත් කරනු ලබයි. මේ සඳහා ක්‍රීඩා භාණ්ඩ ක්‍රීඩා නිලධාරී හා යෞවන කටයුතු නිලධාරී විසින් ක්‍රීඩා සමාජයට ලබාදී ඇත. ගමේ පවත්නා වී ගොවිතැන ආශ්‍රිතව පවත්නා ගැටළු සහගත තත්ත්වය නිසා සෑම පවුලකම පාසැල් දිවිය හමාර කළ තරුණ කොටස් වෙනත් රැකියාවක් සොයා ගැනීමේ උත්සාහයක යෙදීම පැහැදිලි කරුණකි.

# තුන්වෙනි පරිච්ඡේදය

**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

3.1 ගම තෝරා ගැනීම

නිලධාරීන් දැනුවත් කිරීම

පොළොන්නරුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ඇතුළු සෙසු නිලධාරීන් සමග තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන පිළිබඳව කරුණු පැහැදිලි කිරීමෙන් පසුව මේ සඳහා සුදුසු යයි සැළකිය හැකි ගම්මාන 5ක් පිළිබඳව ඔවුන් කරුණු දැක්විය. මෙයින් පසුව අප පර්යේෂණ කණ්ඩායම මෙම ගම්මාන 5 වෙතම ගොස් අපගේ නිර්නායක අනුව එම ගම් සුදුසු යැයි විමර්ශනයක් කලෙමු. එයින් පසුව සුදුසු ගම්මානය ලෙස සංසුන්ගම ගම්මානය තෝරාගත්තෙමු.

සංසුන්ගම ගම්මානය තෝරා ගැනීමට භාවිතා කළ නිර්නායක

1. ප්‍රධානතම වාරිමාර්ග යෝජනා ක්‍රමයක් යටතේ ඉදිවූ ගොවි ජනපදයක් වන මෙහි එක් ගොවි පවුලක කුඹුරු අක්කර 5ක් සහ ගොඩ අක්කර 3ක ඉඩමක් ලබාදී ඇති නිසා දෙවන පරපුරේදීද සැළකිය යුතු ඉඩම් ප්‍රමාණයක් එක් පවුලකට අයත් වීම.
2. මින්නේරිය වාරිමාර්ග ක්‍රමයෙන් යල, මහ කන්න දෙකේදීම ජලය සැපයෙන නිසා අඛණ්ඩව වී වගා කළ හැකිවීම.
3. ගොවීන් ලබන වර්තමාන අස්වැන්නට වඩා අස්වනු වැඩි කිරීමේ විභවතාවය.
4. කුඹුරු වල පස වැලි සහිත බැවින් අතිරේක ආහාර බෝග වගා කිරීමටද යෝග්‍ය වීම.
5. ගල්අමුණ ගොවිජන සේවා මධ්‍යස්ථානයට කි.මී.2.5 ක් පමණ දුරින් පිහිටීම නිසා ක්ෂේත්‍ර නිලධාරීන්ට ගමට ළඟාවීමේ පහසුව.
6. අක්කර 3ක ගොඩ ඉඩම් ඒකකයක් ඇති නිසා නවීන කෘෂිකර්මය භාවිතා කරමින් ගෙවතු වගා වැඩසටහන් පැවැත්වීමේ විභවතාවය.
7. දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන අතරින් ගල්අමුණ ගොවිජන සේවා මධ්‍යස්ථානය සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් වර්තමානයේ දියුණු තත්ත්වයක පැවතීම.
8. ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර නිලධාරීන් ක්ෂේත්‍ර නිලධාරීන් එනම් ගොවිජන සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම උපදේශක, ප්‍රදේශයේ කෘෂිකර්ම නිෂ්පාදන සහ පර්යේෂණ සහකාර කාර්යගුරු හා කැපවීමෙන් වැඩකරන පිරිසක් වීම.
9. සංසුන්ගම ගොවි සංවිධානය ක්‍රියාශීලී ගොවීන්ගෙන් සමන්විත එකක් වීම.
10. ගමේ ප්‍රජා ශාලා සහ සන්නිවේදන පහසුකම් ප්‍රමාණවත් ලෙස පැවතීම හා ගමට ළඟාවීමේ පහසුව.
11. මෙම ව්‍යාපෘති බල ප්‍රදේශයේ පදිංචි කර ඇති ගොවි ජනතාව ඓතිහාසික කෘෂිකාර්මික පසුබිමක් සහිත වූ කොත්මලේ එකම ප්‍රදේශයකින් පැමිණි පිරිසක් නිසා ගමේ පවත්නා සමජාතීය බව.
12. දෙවන පරපුරේ තරුණ ගොවි පිරිසක් ඇති නිසා සත්ත්ව පාලන හා වෙනත් නව ආදායම් උත්පාදන වැඩසටහන් අත්හදා බැලීමේ පහසුව.

එම විමර්ශණය අනුව හා ඉහත සඳහන් නිර්නායක මත මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංසුන්ගම වසම මහා වාරිමාර්ග යටතේ වී වගා ගම්මානයක් වශයෙන් තිරසර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගන්නා ලදී.

### 3.1.2 සැළසුම් සැකසීම

සහභාගීත්ව ගැමි විමසුම් වැඩසටහනේදී ගමේ ජනතාවගේ සහ නිලධාරීන්ගේ අදහස් මත විවිධ වූ ගැටළු ක්ෂේත්‍ර අලලා ඒ සඳහා වූ සැළසුම් සැකසීමක් සිදුකරන ලදී. ගමේ ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සහ අවසාන වශයෙන් පොදුවේ සියළුම ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම අරමුණු කර තෝරා ගන්නා ලද ක්ෂේත්‍රයන් කීපයක් සඳහා සංවර්ධන සැළසුම් සකස් කරන ලදී.

සකස් කරන ලද සැළැස්ම

| අවධානය යොමු කළ ක්ෂේත්‍රය | සැළැස්ම | කාලය |
|---|---|---|
| වී වගාවේ අස්වනු ඉහළ නැංවීම | අක්කර 1කින් බුසල් 120 දක්වා අස්වැන්න වැඩිකිරීම. | කන්න 3 කදී |
| කුඹුරු වල පස සාරවත් කිරීම | කාබනික ද්‍රව්‍ය පසට යෙදීම මගින් සාරවත් බව වැඩි කිරීම | කන්න 3 කදී |
| වී වගාවේ නිෂ්පාදන වියදම් අඩුකිරීම | වර්තමාන නිෂ්පාදන වියදම පහළ දැමීම ඒකාබද්ධ පළිබෝධ පාලනය හා පිදුරු යෙදීම. අමිශ්‍ර පොහොර යෙදීම | කන්න 4 කදී |
| උසස් බීජ ලබාදී | උසස් බීජ ගොවීන් 6ක් ඇතිකිරීම | කන්න 3 කදී |
| ව්‍යාපෘති සේවා ශක්තිමත් කිරීම | ව්‍යාප්ති දින පැවැත්වීම, ගෙවත්තේ ගොවිබිම් සෑදීම. ක්ෂේත්‍ර දින | කන්න 3 කදී |
| පොහොර ණය වැනි ණය මුදල් විධිමත්ව ලබාදීම | කුඩා කණ්ඩායම් ක්‍රමය ශක්තිමත්කර පොහොර ණය ගොවිබැංකු හරහා දීම | කන්න 3 කදී |
| ඇළ මාර්ග නියමිත පරිදි නඩත්තු කිරීම | ලෝක ආහාර වැඩපිළිවෙල් ශ්‍රමදාන මගින් ඇළ මාර්ග පිළිසකර කිරීම | කන්න 3 කදී |
| වී සුරැකුම් ක්‍රමය විධිමත් ලෙස පුළුල්ව පැවැත්වීම | වී සුරැකුම් ක්‍රමයට ගොවීන් වැඩි පිරිසක් එක්කර ගැනීම | කන්න 3 කදී |
| ගෙවතු වගා වැඩසටහන් තුළින් පෝෂණය හා ආදායම් ඉහළ නැංවීම | ගෙවතු වගා සහ කාබනික පොහොර වැඩසටහනක් ඇරඹීම | කන්න 2 කදී |
| ස්වයං රැකියා ඉහළ නැංවීම | ස්වයං රැකියා අවස්ථා සඳහා පුහුණු ලබාදීම | කන්න 3 කදී |
| ශක්තිමත් ප්‍රජා සංවිධාන ගම තුළ ඇති කිරීම | ප්‍රජා සංවිධාන නියෝජිතයින් පුහුණු කිරීම | කන්න 4 කදී |
| සත්ත්ව පාලනය ගමේ ප්‍රචලිත | පශු වෛද්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඇතිව සත්ත්ව | කන්න 3 කදී |

| | | |
|---|---|---|
| කිරීම හා එමගින් අමතර ආදායම් ලබාගැනීම | පාලන වැඩසටහන් කිරිගව හා කුකුල් පාලනය ඇරඹීම ,මිරිදිය ධීවර පොකුණු ඇරඹීම | |
| දිගුකාලීන ලෙස පරිසර සංරක්ෂණ වැඩසටහනක් හා දැවමය වටිනාකමක් ඇති පැළ සිටුවීමෙන් ආදායම ලැබීම | පැළ සිටුවීම | කන්න 3 කදී |
| අක්කර 3 ක් පමණ වන ගොඩ ඉඩම් කොටස් වලින් අක්කර 1/2 ක් පමණ බෝග වගා කිරීම | උස් ඉඩම් සඳහා ජලය සැපයුම් මාර්ගයක් ඇතිකිරීම | කන්න 3 කදී |
| පානීය ජලය දුර බැහැර ගොස් ගෙන ඒමෙන් ඇතිවන දුෂ්කරතාවය නැවැත්වීම | පානීය ජලය ලබාගැනීමට සුදුසු ළිඳක් මාර්ගයෙන් ප්‍රජා ජල යෝජනා ක්‍රමයක් ඇරඹීම | කන්න 4 කදී |
| රැකියා අවස්ථා වැඩිකිරීම | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ගමේ ඇරඹීම | කන්න 3 කදී |

3.1.3 සහභාගීත්ව ගැමි විමසුව.

සම්පත් හදුනා ගැනීම

තිරසර සංවර්ධන වැඩසටහන පිළිබඳව ගමේ ජනතාවට පැහැදිලි කිරීමෙන් පසු දිනයක කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ සහ ජනතාවගේ සහභාගීත්වය සහිතව සහභාගීත්ව ගැමි විමසුම් වැඩසටහනක් ගමේදී ක්‍රියාත්මක කරන ලදී, මෙම වැඩසටහනේදී ගමේ සම්පත් හදුනා ගැනීම, ගමේ ප්‍රශ්න හා ඒවායේ ප්‍රමුඛතා හදුනා ගැනීම විසඳුම් හදුනාගැනීම සහ ගම් සඳහා සංවර්ධන සැළැස්මක් පිළියෙල කර ගැනීමද සිදුවිය.

ගමේ සම්පත් වශයෙන් අක්කර 5 කුඹුරු ඉඩම් ඒකක අක්කර 3 ගොඩ ඉඩම් ඒකක, ජල මාර්ග, උස්සාන වාරිමාර්ගය සඳහා ඉදිකර ඇති ඇල මාර්ග, ගමේ ඇති රජයෙන් ඉදිකළ පොදු ළිං සහ නල ළිං, හරකින් වැනි සතුන් සහ මිනිස් සම්පත් හදුනාගනු ලැබිය. මෙම සම්පත් සියල්ලම ගොවි ජනපදය ආරම්භ වූ කාලයේ සිටම පැවති ජනතාව බොහෝ සේ පරිහරණය කරන ලද, සම්පත් විය.

3.2 ග්‍රාමීය ප්‍රවේශය.

ගැමියන් හා සංවිධාන දැනුවත් කිරීම

ගම තෝරා ගැනීමෙන් පසු තිරසාර සංවර්ධන ගම්මාන වැඩසටහන පිළිබඳව සංසුන්ගම ග්‍රාම නිලධාරී වසමේ ගැමියන් සහ සංවිධාන දැනුවත් කිරීම සිදු කලේය. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණායතනයේ පර්යේෂණ කණ්ඩායම, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගල් අමුණ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොවිජන සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රදේශය භාර කෘෂිකර්ම උපදේශක, ගොවි ජන රක්ෂණ මණ්ඩලයේ නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර සහ ග්‍රාම නිලධාරී යන ගම් මට්ටමේ නිලධාරීන්ගේද සහයෝගය ඇතිව ඔවුන්ද සමග ගමට ගොස් ගමේ ප්‍රජා ශාලාවට එකතුවීමට දිනයක් සංවිධානය කලෙමු. පළමුව ගොවි සංවිධානයේ නිලධාරීන් හමුවී මෙම වැඩසටහන පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් කර මෙම පළමු දැනුවත් කිරීමේ රැස්වීම සඳහා උපරිම ප්‍රජා සහභාගීත්වයක් ලබා

ගැනීමය කටයුතු කරන ලදී. අප පර්යේෂණ කණ්ඩායම විසින් මෙම රැස්වීමේදී තිරසාර වැඩසටහන පිළිබඳව සවිස්තරාත්මක කරුණු පැහැදිලි කරදීමක් සිදුවිය. ඉන් පසුව ගමේ ජනතාවට මෙම වැඩසටහන පිළිබඳව යම් ගැටළු ඇත්නම් ඒ පිළිබඳව කරුණු පැහැදිලි කරගැනීම පිනිස අවස්ථාව සළසා දෙන ලදී. එහිදී අදහස් දැක්වූ ගැමියන් ප්‍රකාශ කළේ මෙයට වසර 10 කට පමණ පෙරද මෙවැනි ව්‍යාපෘතියක් මෙම ගමට පැමිණි බවත් ඒ මගින් සත්ත්ව පාලන කටයුතු සහ ගොවිතැන් කටයුතු දියුණු කිරීමේ වැඩසටහන් පවා ආරම්භ කළ බවත් අතරතුරදී රටේ ඇතිවූ සිවිල් කලබල හේතුවෙන් එම වැඩසටහන අකර්මන්‍ය වී නැවතුන බවත්ය. මෙම වැඩසටහනද එලෙස අතරමග නොනැවතී අඛණ්ඩව කටයුතු කරගෙන යාමට හැකිකම ලැබේ යැයි ගම් වැසියන් තදින් විශ්වාස කරන බවත් ගමේ කෘෂිකර්මය හා වෙනත් ජන ජීවිතය සම්බන්ධව පවතින ගැටළු හා ප්‍රශ්න සඳහා මේ මගින් විසඳුම් ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදී. මෙම රැස්වීමේදී ගැමියන් හා අප නිලධාරීන් අතර මූලික හඳුනා ගැනීමක්ද සිදු වූ අතර ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ක්‍රියාකාරී මණ්ඩලයක්ද තෝරා ගන්නා ලදී. මෙය සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපති, උපලේකම්, කාරක සභාව සහ උපදේශක මණ්ඩලයකින්ද සමන්විත විය.

ඉන් පසුව ජනතාවගේ සහභාගීත්වයෙන් සහභාගීත්ව ගැමි විමසුම් අභ්‍යාසයක්ද සිදුකළ අතර ඒ මගින් ගමේ ජනතාව මුහුණපා සිටින ගැටළු හා ඒවාට ගැමියන් යෝජනා කරන විසඳුම්, ගමේ පවත්නා සම්පත් සහ ගම ගැන වෙනත් තොරතුරුත් හඳුනාගැනීමට අවස්ථාව ලැබුණි. මෙම සහභාගීත්ව ගැමි විමසුම් අභ්‍යාසයේ තොරතුරු මත ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. ප්‍රාදේශීය සභාව. වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යන ආයතන වල කාර්යභාරයන් හඳුනාගන්නා ලදී.

**සහභාගීත්ව ගැමි විමසුම් අභ්‍යාසය.**

**සහභාගීත්ව ගැමි විමසීමේදී හඳුනාගන්නා ලද, හා ප්‍රමුඛතාගත කරන ලද, ගැටළු.**

ව්‍යාපෘති ප්‍රදේශය : දිස්ත්‍රික්කය පොලොන්නරුව - සංසුන්ගම

| හඳුනාගත් ගැටළු | යෝජිත විසඳුම් | අදාල ආයතන | මේ දක්වා කළ කාර්යයන්/ ලබාදුන් විසඳුම |
|---|---|---|---|
| 1.වගා කන්නය පටන්ගැනීම සඳහා මින්නේරිය වාරිමාර්ග ව්‍යාපෘතිය මගින් නියමිත කලට ජලය නොලැබීම | 1.මුළු මින්නේරිය ව්‍යාපෘතිය සඳහාම නියමිත කාලයට ජලය සැපයීම | මින්නේරිය වාරි මාර්ග ඉංජිනේරු කාර්යාලය | මෙම තත්ත්වය පිළිබඳව මින්නේරිය වාරිමාර්ග ඉංජිනේරු දැනුවත් කිරීම |
| 2.ලැබෙන ජලයද වගාවට ප්‍රමාණවත් තරම් නොලැබීම | 2.හොඳ ජල කළමනාකරණ වැඩසටහනක් හඳුන්වාදීම | මින්නේරිය වාරි මාර්ග ඉන්ජිනේරු කාර්යාලය | මෙම තත්තවය පිළිබඳව මින්නේරිය වාරිමාර්ග ඉංජිනේරු දැනුවත් කිරීම |
| 3.උසස් තත්ත්වයේ බීජ නොමැතිවීම | 3.උසස් තත්ත්වයේ බීජ ලබාගැනීමේ පහසුකම් සැළසීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවිජනසේවා දෙපාර්තමේන්තුව | ගොවීන් වෙත උසස් තත්ත්වයේ බීජ සැපයීමට පියවර ගැනීම |

| | | | |
|---|---|---|---|
| 4.වී වගාව සඳහා දිගින්දිගටම ණය ලබාගැනීම නිසා ගොවීන් ණය උගුලක හිරවී සිටීම | 4. අධිකලෙස කෘෂි යෙදවුම් භාවිතයට හුරුවී ඇති ගොවිජනතාව එයින් මුදවා ගැනීම, කාබනික කෘෂිකර්මය වෙත ගොවීන් යොමුකිරීම, වී සුරැකුම් ක්‍රමය මාර්ගයෙන් වී සඳහා ඉහළ මිලක් ලබාගැනීමට අවස්ථාව සැළසීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවිජනසේවා දෙපාර්තමේන්තුව | වී සුරැකුම් ක්‍රමය ගොවීනට හඳුන්වා දීම, පිදුරු භාවිතයට ගොවීන් හුරු කරවීම<br>– |
| 5.සාධාරණ මිලකට වී විකුණාගත නොහැකිවීම | 5.වී සුරැකුම් ක්‍රමය සාර්ථක ලෙස පවත්වාගෙන යාම | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | උසස් වර්ගයේ බිත්තර වී සැපයීම හා ආදර්ශන පැවැත්වීම |
| 6.වී වගාවෙන් අඩු අස්වැන්නක් ලැබීම | 6.වී අස්වැන්න වැඩි කිරීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | උසස් ආරෙ බිත්තර වී සැපයීම, යාය ආදර්ශන සැළසුම් කිරීම |
| 7.වී වගා කිරීමෙන් පසු අස්වනු නෙළනතුරු ගොවි ජනතාවට අමතර ආදායම් ලැබෙන මාර්ග නොමැතිකම | 7.ගොවීනට ලැබී ඇති ගොඩ ඉඩම වගා පහසුකම් සැළසීම. ස්වයං රැකියා මාර්ග හඳුන්වාදීම හා කෘෂිපාදක කර්මාන්ත හඳුන්වා දීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවිජනසේවා දෙපාර්තමේන්තුව පශ්වාත් අස්වනු තාක්ෂණ ආයතනය. | පුහුණු වැඩසටහන් සැළසුම් කිරීම |
| 8.නව තාක්ෂණය සම්බන්ධ පුහුණුවීම් නොමැතිකම | 8.පුහුණු වැඩසටහන් කීපයක් ඇරඹීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සී.අයි.සී. සමාගම | අදාල ආයතන දැනුවත් කිරීම |
| 9.කෘෂි යෙදවුම් සම්බන්ධ පුහුණුවීම් නොමැතිකම | 9.පුහුණු වැඩසටහන් කීපයක් සැළසුම් කිරීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | – |
| 10.කෘෂි යෙදවුම් මිල දිනෙන් දින ඉහළ යාම නිසා නිෂ්පාදන වියදමද ඒ අනුව ඉහළමට්ටමක පැවතීම | 10.අධික කෘෂි රසායනික භාවිතය අවම කිරීම, කාබනික කෘෂිකර්මය වෙත ගොවීන් යොමු කිරීම, අමිශ්‍ර පොහොර භාවිතය | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | පුහුණු වැඩසටහන් සැළසුම් කිරීම හා ආදර්ශන ඇරඹීම |
| 11.වාරිමාර්ග පද්ධතිය දිගුකලක සිට පිළිසකර කර නොතිබීම | 11.වාරිමාර්ග පද්ධතිය පිළිසකර කිරීම | ගොවි සංවිධානය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව | අදාල ආයතන සමග සාකච්ඡා කිරීම |
| 12.පසෙහි සාරවත්බව අඩුකම | 12.පසේ සාරවත් බව වැඩි කිරීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | යාය ආදර්ශන ඇරඹීම |

| | | | |
|---|---|---|---|
| 13.ව්‍යාප්ති සේවය දුර්වල මට්ටමක පැවතීම | 13.ගොවීන් සතු කෘෂිකාර්මික දැනුම වැඩිකිරීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | පුහුණු වැඩසටහන් සැළසුම් කිරීම,යාය ආදර්ශන ඇරඹීම |
| 14.ජල කළමනාකරණය පිළිබඳ ගොවීන්ගේ දැනුවත්භාවය අඩුකිරීම | 14.ගොවීන්ට ජල කළමනාකරණය පිළිබඳව දැනුම ලබාදීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | පුහුණු වැඩසටහන් සැළසුම් කිරීම |
| 15.ජනගහනය වැඩිවීමත් සමග ඉඩම් කැබලිවී යාම නිසා පවුල් ඒකකයක යැපීමට තරම් ප්‍රමාණවත් වගාබිමක් නොමැතිකම | 15. කෘෂිකාර්මික නොවන කර්මාන්ත වෙත ජනතාව යොමු කරවීම | වෘත්තීය පුහුණු අධිකාරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අදාල ආයතන දැනුවත් කිරීම |
| 16.සත්තව පාලන කටයුතු නියැලීම සඳහා අවශ්‍ය මගපෙන්වීම හා වැඩි දියුණුකළ සතුන් ලබාගැනීමට පවතින දුෂ්කරතා | 16.සත්තව පාළන ව්‍යාප්ති සේවා ගම හා සම්බන්ධ කිරීම | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | අදාල ආයතන සමග සාකච්ඡා කිරීම |
| 17.පාසැල් හැරයන තරුණ තරුණියන් සඳහා කෘෂිකර්මය පාදක කරගත් සහ කෘෂිකර්මයෙන් බැහැරවූ ස්වයං රැකියා හඳුන්වාදීමේ වැඩ පිළිවෙලක් නොමැතිකම | 17.ස්වයං රැකියා හඳුන්වාදීම සහ වෘත්තීය පුහුණුව ලබාදීම | වෘත්තීය පුහුණු අධිකාරිය පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය | අදාල ආයතන සමග සාකච්ජා කිරීම |
| 18.ප්‍රදේශයේ භූගත ජලයෙහි ෆ්ලෝරයිඩ් සාන්ද්‍රණය අධික වීම නිසා පානීය ජලය සපයා ගැනීමේ ගැටළුව | 18.පානීය ජල සැපයුම් යෝජනා ක්‍රමයක් | සමෘද්ධි අධිකාරිය | ව්‍යාපෘති යෝජනාවක් බාරදීම |
| 19.ගමතුළ මාර්ග පද්ධතිය දුර්වල තත්ත්වයක පැවතීම නිසා කෘෂිනිෂ්පාදන අංලෙවියේදී ප්‍රශ්න මතුවීම | 19.මාර්ග පද්ධතිය පිළිසකර කිරීම | ප්‍රාදේශීය සභාව | - |
| 20.ගමතුළ සෞඛ්‍ය හා පෝෂණ නිසා උද්ගතවී ඇති ගැටළු නිසා උද්ගතවී ඇති ගැටළු(මන්දපෝෂණය හා ලෙඩ රෝග) | ගමේ ප්‍රජාව සෞඛ්‍ය හා පෝෂණ අංශයන් පිළිබඳව විධිමත් අධ්‍යාපනයක් ලබාදීම | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය | - |

| | | | |
|---|---|---|---|
| 21.ගමෙහි අනාගත පරපුරට වගාකිරීමට සහ පදිංචිවීමට ප්‍රමාණවත් තරම් ඉඩම් (ගොඩ,මඩ) නොමැතිකම පිළිබඳ ඇතිවී ඇති ගැටළු | 21.සූක්ෂම ඉඩම් පරිහරණ ක්‍රම පිළිබඳව ජනතාවට අවබෝධයක් ලබාදීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අදාල ආයතන සමග සාකච්ඡා කිරීම |
| 22.ප්‍රදේශයේ භූගත ජල මට්ටම ඉතා පහත් මට්ටමක පැවතීම නිසා ළිංවලද ප්‍රමාණවත් තරම් ජලය නොමැතිකම | 22.උත්ථාන වාරිමාර්ග ක්‍රමය යළි ආරම්භ කිරීම | වාරි මාර්ග දෙපාර්තමේන්තුව | යෝජනා සකස් කිරීම |
| 23.වී වගාවෙහි නොයෙදුන අනවසර කුඩා ඉඩම් කැබලිවල පදිංචි වූ පවුල් 30 ක් පමණ සිටීම | 23.ජීවන තත්වය නගාසිටුවීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | අදාල ආයතන දැනුවත් කිරීම |
| 24.නවීන ජල සැපයුම් තාක්ෂණ ක්‍රම (බිංදු ජල සහ විසිරි ජල සම්පාදන පද්ධති ක්‍රම) යොදවාගෙන වගාකිරීමට තරම් ගොවීන් නොදැනුවත්කම සහ ගොවීන්ට ආර්ථික ශක්තියක් නොමැතිකම | 24.නවීන ජල තාක්ෂණ ක්‍රම ගොවීන්ට හඳුන්වා දීම | කෘෂි සංවර්ධන අධිකාරිය | - |
| 25.වැඩි දියුණුකළ සහ වානිජමය වශයෙන් ඉහළ ආදායම් ලබාගතහැකි බෝග වර්ග හඳුන්වාදීමේ වැඩසටහන් ප්‍රදේශයේ නොමැතිකම | 26.වානිජමය වශයෙන් වැදගත් බෝග හඳුන්වා දීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | - |

### 3.3 සංවිධානාත්මක හා කළමනාකරණ ව්‍යුහය.

තිරසර සංවර්ධන වැඩසටහන ක්‍රියාශීලී ලෙස ඉදිරියට පවත්වාගෙන යාම සඳහා යන්ත්‍රණයක් ලෙස කළමනාකරණ ව්‍යුහයක් නිර්මාණය කර ඇත. මෙමගින් ව්‍යාපෘතියේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ තීරණ

ගැනීම සහ පසු විපරම් කිරීම සිදුකරයි. මෙම තාක්ෂණ කමිටුව සමන්විත වනුයේ ගොවිජන සංවර්ධන නිලධාරි, ප්‍රදේශය භාර කෘෂිකර්ම උපදේශක හා ගොවි සංවිධානයේ ලේකම්ගෙනි. මෙම කමිටුවේ උපදේශක වශයෙන් ක්‍රියාකරනුයේ ප්‍රාදේශීය ලේකම්වරයායි. ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ නායකත්වයෙන් යුත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ රැස්වීමේදී ප්‍රදේශයේ සංවර්ධන කටයුතු පිළිබඳ විමසාබැලීමක් කරන අතර තිරසාර සංවර්ධන වැඩසටහනද මෙහිදී විමසුමට ලක්වේ. සංයුක්තගම තිරසාර ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක මෙම සම්බන්ධීකරණ රැස්වීමට සහභාගී වී ව්‍යාපෘතිය පිළිබඳ කරුණු පැහැදිලි කරයි.

ගමේ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රජා සංවිධානයක් වන ගොවි සංවිධානය, කාන්තා සංවිධාන යන ආයතන ශක්තිමත් කිරීම සඳහා ප්‍රජා සංවිධාන සහ ප්‍රජා නායකයින් ශක්තිමත් කිරීමේ පුහුණු වැඩසටහනක් පැවැත්වීම හා ශක්තිමත් ප්‍රජා සංවිධානයක් ගමේ පවත්වාගෙන යාමෙන් ගමට ඇතිවන යහපත පිළිබඳව වරින් වර ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

ව්‍යාපෘතිය ගමේ සෑම ප්‍රදේශයකම සමගේ ක්‍රියාත්මක කිරීමත්, සන්නිවේදන පහසුකම් සඳහාත්, ගමේ ප්‍රජාවට එක්වීමේ පහසුව සඳහාත් ගම කොටස් 6 කට වෙන්කර කුඩා කණ්ඩායම් 6ක් ගොඩනංවා ඒවාට කණ්ඩායම් නායකයන් පත්කර ඇත. මෙම කුඩා කණ්ඩායම් නායකයන් මාර්ගයෙන් එම කුඩා කොටස්වල අවශ්‍යතාවයන් සොයා බැලීම, එම කොටස්වල ජනතාවගේ සහභාගීත්වය ලබාගැනීම හා එක් එක් කොටස් ව්‍යාපෘති කණ්ඩායම අතර සමීප සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සිදු කලේය.

## 3.4 ජනතා සහභාගිත්වය ලබාගැනීම හා ඔවුන් ක්‍රියාකාරීන් බවට පත්කිරීම.

ගමේ ජනතාවගේ අවශ්‍යතාවයන් පිළිබඳව ඔවුන්ගෙන්ම විමසා එම අවශ්‍යතාවයන් පිළිබඳව අදාල ආයතන දැනුවත් කිරීම හා එම ආයතන සමග සබඳතා ගොඩනගා ගනිමින් ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඔවුන් විසින්ම ඉටු කරවා ගැනීම මගින් ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. ගොවි කටයුතු පර්යේෂණායතනය පහසුකම් සළසන්නා වශයෙන් ක්‍රියා කරයි. සෑම සංවර්ධන කාර්යයකදීම ජනතා සහභාගීත්වය ලබාගැනීම හා එහිදී ජනතාව ක්‍රියාකාරී කොටස්කරුවන් බවට පත්කිරීම අවශ්‍ය වේ. එම යන්ත්‍රණය මනාව ක්‍රියාත්මක වීම සඳහා ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන ඔවුන්ගේම බවට පත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

තීරණ ගැනීමේදී, සැළසුම් සකස් කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී යන ප්‍රධාන අවස්ථා තුනේදීම ජනතාව සහභාගිකරවා ගැනීමේ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. සහභාගීත්ව ගැමි විමසුම් වැඩසටහනේදී ගමේ සම්පත් සහ අවශ්‍යතාවයන් හඳුනාගැනීම සහ ඒ ආශ්‍රයෙන් ව්‍යාපෘති සැළසුම් සකස් කිරීමත් සකස් කළ ව්‍යාපෘති අදාල ආයතන මගින් ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා භාවිතා උපක්‍රම වශයෙන් එම ව්‍යාපෘති නිර්මාණය කළ ගමේ ජනතාවගේ කමිටු පත්කර ඇත. එක් එක් ව්‍යාපෘති සඳහා පත්කළ කමිටු සාමාජිකයන් පහත සඳහන් පරිදි වේ. මේ සඳහා පත්කළ තාක්ෂණික කමිටුව තීරණ ගැනීමෙන් හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක මට්ටමට ගෙන ඒමෙන් සහාය වෙයි.

සංසුන්ගම ජනතාව විසින්ම ඉදිරිපත් කළ අදහස් අනුව නිර්මාණය කළ ව්‍යාපෘති සඳහා පත්කළ කමිටු සාමාජිකයන්

| අනු අංකය | ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කටයුත්ත | කමිටු සාමාජිකයින් |
|---|---|---|---|
| 1. | සත්ත්ව පාලනය | කිරි ගව<br>කුකුල් | සරණපාල මයා.<br>ප්‍රේමරාජ් මයා.<br>වීරසූරිය මයා. |
| 2. | ගෙවතු වගා, පළතුරු | එළවළු<br>පළතුරු<br>කොම්පෝස්ට් | ඉන්ද්‍රානි විලේගොඩ මිය.<br>ඉනෝකා අයිරාංගනී මිය.<br>කේ.පී. අප්පුහාමි මයා. |
| 3. | වී වගාව | බිත්තර වී නිෂ්පාදනය<br>ඉදිරි වෙළඳ ගිවිසුම්<br>අස්වනු වැඩි කිරීම<br>පසෙහි පෝෂණය ඉහළ දැමීම<br>සහල් සැකසුම් කර්මාන්තය | ආර්. එම් රත්නායක මයා.<br>කේ.පී. හීන්බණ්ඩා මයා.<br>සරණපාල මයා. |
| 4. | වන වගාව | ප්‍රජා සහයෝගිතා<br>වන වගා වැඩසටහන | එන්. කේ.විකිරිබණ්ඩා මයා.<br>ජේ.පී. මුදියන්සේ මයා. |
| 5. | මිරිදිය මසුන් | මිරිදිය පොකුණු ඇතිකිරීම | කේ.පී. ලොකුබණ්ඩා මයා. |
| 6. | හස්ථ කර්මාන්තය | ගෘහස්ථ කර්මාන්ත ඇති කිරීම | එන්.එල්. වීරක්කොඩි මිය<br>උදයාංගනී මිය.<br>ශ්‍රියාලතා වීරක්කොඩි මිය. |
| 7. | පෝෂණ සෞඛ්‍යය | ළමා හා මානව පෝෂණ මට්ටම<br>ඉහළ නැංවීමට අදාල<br>දැනුවත්කිරීම් හා ක්ෂේත්‍ර දින | එච්.එම්. දයා මැණිකේ මිය<br>ජේ. අයිරාංගනී මිය.<br>එන්.පී. සීලවතී මිය |
| 8. | උත්සාන වාරි වැඩසටහන් | අක්කර 1/4 ක පමණ ගොඩ<br>ඉඩම් වගාකිරීමට වාරිමාර්ග<br>පහසුකම් සැළසීම | කේ.ජේ.ධර්මදාස මයා.<br>එච්.පී. ගාමිණී බණ්ඩාර<br>මයා. |
| 9. | වගා ළිං වැඩසටහන් | වගා ළිං ඉදිකිරීම හා ඒ ආශ්‍රිත<br>නවීන කෘෂි තාක්ෂණික කට්ටල<br>මාර්ගයෙන් වගා කටයුතු | ජී.පී. පුංචිබණ්ඩා මයා<br>ජේ.පී. මුදියන්සේ මයා.<br>එම්.පී. යසරත්න මයා. |
| 10. | පානීය ජලය | පානීය ජලය ලබාගැනීමට සුදුසු<br>ළිඳක් ආශ්‍රයෙන් ප්‍රජා ජල<br>සම්පාදන ක්‍රමයක් ඇරඹීම | ජේ.එම්.විජේරත්න මයා.<br>කේ.පී.හීන්බණ්ඩා මයා.<br>එස්.ජේ. පුංචි බණ්ඩා මයා. |

ගමේ ජනතාව ව්‍යාපෘතියේ සැබෑ කොටස්කරුවන් බවට පත්කර ගැනීමේදී ඔවුන් වෙත අවංකවම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමට උත්සාහ ගන්නා බව ප්‍රදර්ශනය කළ යුතුවන්නේය. උදාහරණ වශයෙන් උත්සාන වාරිමාර්ගය යළිත් ආරම්භ කර ගැනීම සඳහා ජනතාවගෙන් මතුවූ අදහස ක්‍රියාවට නැගීමේදී ඒ පිළිබඳව විවිධ ආයතන දැනුවත් කළ යුතුව තිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව - මින්නේරිය ඉන්ජිනේරු



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.,ප.පු.ආ
HARTI

කාර්යාලය. වාරිමාර්ග හා ජල කළමනාකරණ ඇමතිතුමා. වාරිමාර්ග ඉන්ජිනේරු දිස්ත්‍රික් කාර්යාලය වැනි ආයතන දැනුවත් කිරීම සඳහා භාවිත උපක්‍රමය වූයේ සංසුන්ගම තිරසර සංවර්ධන වැඩසටහනේ ක්‍රියාකාරී කමිටුවේ නම් සඳහන් අලංකාර ලිපි ශීර්ෂයක් සකස් කොට එම ලිපි ශීර්ෂයේ ගමේ ජනතාවගේම ඉල්ලීම් වශයෙන් ඔවුන්ගේම නම් ගම් යටතේ ඉල්ලීම් ඉදිරිපත් කිරීමය. තවත් භාවිත උපක්‍රමයක් වූයේ ක්‍රියාකාරීන් ගමේ සාමාජිකයන් කීපදෙනෙකු සමග ප්‍රදේශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හමුවීමට ගොස් එතුමාට මේ පිළිබඳව කරුණු පැහැදිලි කරදීමය. කෘෂිකර්ම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඉහළ ආදායම් ලබාදෙන අඹ, මිදි හා පැපොල් ආදර්ශන පැවැත්වීම, නව බීජ පොහොර උපදෙස් ලබාදෙමින් වී වගාසාය ආදර්ශන පැවැත්වීම, ගෙවතු වගා පැළ වශයෙන් තේක්ක සහ මැහෝගනී පැළ බෙදාදීම, වී සුරැකුම් ආදර්ශ ලෙස රීප්‍රායල් "කොකුන්" ලබාදීම ආදිය සිදුකර ඇත. මෙම ක්‍රම මගින් ගමේ ජනතාවගේ හොඳ හිත හා පැහැදීම ව්‍යාපෘතිය ඔවුන්ගේම එකක්ය යන හැඟීම ඔවුන් තුළ ඇති කරවීමට සමත් වෙයි.

ජනතාව ව්‍යාපෘති සම්බන්ධව විවිධ මතිමතාන්තර සහිතව සිටීම ස්වභාවයක්ය. මෙම ආකල්ප හා ගති පැවතුම් වෙනස් කිරීම අරමුණු කරගනිමින් ව්‍යාපෘතියේ ප්‍රධානතම ක්‍රියාකාරීන් සහ කුඩා කණ්ඩායම් නායකයන් සඳහා දේශන හා පුහුණු සැසියක් පවත්වා ඇත.

## 3.5 ක්‍රියාත්මක කළ සංවර්ධන කටයුතු

සංසුන්ගම තිරසාර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම අරමුණු කරගනිමින් විවිධ ක්ෂේත්‍ර වලට අයත් සංවර්ධන කටයුතු රාශියක් ක්‍රියාත්මක කර ඇත. මෙම සංවර්ධන කටයුතු පහත දැක්වෙන අයුරින් සාරාංශ කර ඉදිරිපත් කෙරේ.

| කටයුත්තේ ස්වභාවය | කටයුත්ත | ඒ සඳහා මුදල් උපකරණ හෝ වෙනත් ලෙස සහාය ලබාදුන් ආයතන |
|---|---|---|
| 1. සහභාගීත්ව ග්‍රාමීය විමසුම් අභ්‍යාසය | ගමේ සම්පත් හඳුනාගැනීම, ගැටළු හඳුනා ගැනීම හා ඒවා ප්‍රමුඛතා ගතකිරීම, ජනතා අදහස් මත ගම සඳහා සංවර්ධන සැළසුම් සැකසීම. | ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන රක්ෂණ මණ්ඩලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. |
| 2. පුහුණු පාඨමාලා, වැඩමුළු දේශන හෝ උපදේශන සේවා | ග්‍රාමීය නියකත්ව පුහුණුව, කෘෂිකර්ම සහ වෙනත් සහායක සේවා ලබාගැනීම සඳහා ප්‍රජාව ශක්තිමත් කිරීම, කුඩා කණ්ඩායම් ගොඩනැංවීම හා ශක්තිමත්ව පවත්වාගෙන යාම, මිනිසුන් පෙලඹවීම සඳහා යොදාගතහැකි ක්‍රමවේද දැක්වීම | ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ගොවිජන සේවා දෙපාර්තමේන්තුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සී.අයි.සී. සමාගම. |

| | | |
|---|---|---|
| | පාසැල් හැරගිය තරුණ තරුණියන්ට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වෘත්තීය පුහුණු පාඨමාලා තෝරාගැනීම පිළිබඳ මූලික පුහුණුව. | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ඉනාමළුව |
| | අධිවේගී ප්‍රකි මැෂින් පුහුණු මධ්‍යස්ථානයක් ඇරඹීම හා තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව. | |
| | පශු අස්වනු තාක්ෂණ ආයතනය යනු කුමක්ද? එයින් ග්‍රාමීය ජනතාවට ලබාගතහැකි පුහුණු වැඩසටහන් හා තාක්ෂණික දැනුම කෙසේදැයි විග්‍රහ කිරීම | පශු අස්වනු තාක්ෂණ ආයතනය, අනුරාධපුරය. |
| | සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන සැකසීමේ හා ගුණාත්මක සහල් නිපදවීමේ තාක්ෂණික නේවාසික පුහුණු පාඨමාලාව | |
| 3. වගාවන් හා වෙනත් කටයුතු පිළිබඳ ආදර්ශ | ගෙවතු 25ක් සඳහා ගෙවත්තෙන් ගෙවත්තට ගොස් ගෙවතු වගා තාක්ෂණ උපදෙස් ලබාදීම. පළතුරු වගාව- අඹ අක්කර 1/4. ආදර්ශන වගා 03, පැපොල් අක්කර 1/4 වගා 1යි. කෙසෙල් අක්කර 5, ආදර්ශනය. | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පොලොන්නරුව. |
| 4. විශේෂිත තාක්ෂණික දැනුවත් කිරීම් සහ ක්ෂේත්‍ර දින | වී වගාවේ අස්වනු ඉහළ දැමීම, වී වගාවේ කීඩෑ හානිය, වී වගාවේ තාක්ෂණ ඌනතාවය, වී වගාවේ දිලීර රෝග පාලනය.<br>සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව 34<br>ගෙවතු වගා ව්‍යාපෘතින් ඇරඹීම, බීජ වී නිපැයුම, ඉදිරි වෙළඳ ගිවිසුම්, වගා ළිං වැඩසටහන්, එළවළු වගාව.<br>සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව 52<br>පිදුරු කෙතට යෙදීම<br>ගොවීන්, කාන්තාවන්, ළමුන් 60 ක් පමණ සහභාගි විය.<br>බීජ වී ගොවීන් 10 දෙනෙකු අක්කර 12ක පමණ බීජ වී නිෂ්පාදන වැඩසටහන<br>අතිරේක බෝග වගාව | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.<br>පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.<br>පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.<br>පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. |
| 5. බීජ,ඇට,පැළ වර්ග වෙනත් ද්‍රව්‍ය හා උපකරණ බෙදාදීම | වී වගාවේ අක්කර එකේ උපරිම අස්වනු ලබාගැනීමේ ආදර්ශන 11ක් ගොවීන් 11 දෙනෙකු සමග ක්ෂේත්‍රයේ ආරම්භ කර ඇත. මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් සූරියා කි.ග්‍රෑ.540 ටී.එස්.පී. කි.ග්‍රෑ. 525 | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| | එම්.ඕ.පී. කි.ග්‍රෑ.150 ලබාදී ඇත.<br>අක්කර 1/8 මිදි වගා ආදර්ශනයක් සඳහා මිදි පැළ 25 ක් සහ එහි මැස්ස සෑදීමට අවශ්‍ය කොන්ක්‍රීට් කණු ලබාදී ඇත.<br>ගෙවතු වනවගා සඳහා තේක්ක පැළ 3000ක් සහ මැහෝගනී පැළ 100ක් ලබාදීම | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 6. වැව්, අමුණු, ඇලවේලි පාරවල් හා වෙනත් ප්‍රතිසංස්කරණ කටයුතු | කිලෝමීටර 17 දිග ඇළ මාර්ග ශ්‍රමදානයෙන් ශුද්ධ කිරීම, මිනිස් දින 6260 ක ප්‍රමාණයක ඇළ මාර්ග ශුද්ධ කිරීම.<br>කිලෝ.මීටර් 17 දිග සංසුන්ගම කොටසේ පාරවල් බොරළු දමා සකස් කිරීම | ලෝක ආහාර වැඩසටහන<br>ලෝක ආහාර වැඩසටහන |
| 7. සංවිධාන සමිති සමාගම් කුඩා කණ්ඩායම් ගොඩනැගීම හා ශක්තිමත් කිරීම. | තිරසර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ක්ෂේත්‍ර මට්ටමේ ආයතන වල නිලධාරීන්ගෙන් හා ගමේ ජනතාවගෙන් සමන්විත කමිටුවක් ඇති කිරීම, ගමේ පිහිටීම අනුව ජනතාවට රැස්වීමට හා අදහස් ප්‍රකාශ කිරීමට පහසුවන සේ ගම කොටස් 6කට කඩා කුඩා කණ්ඩායම් 6ක් ගොඩ නැගීම. | ගොවි කටයුතු පර්යේෂණ ආයතනය. |
| 8. යෙදවුම් සැපයීම්, ඉතිරි කිරීම් හා ණය සැපයීම්, අලෙවි කටයුතු, යනාදිය අළුතින් හඳුන්වා දීම හෝ පවත්නා සේවා ශක්තිමත් කිරීම | 2002/03 මහ කන්නයේදී ගොවිජන බැංකු ණය ක්‍රමය යටතේ වී ගොවීන් 32 වී සුරැකුම් ක්‍රමයට දායක කරගෙන ඇත.<br>2001/02 මහ කන්නයේදී වී සුරැකුම් කරන ලද ගොවීන්ගෙන් වී මිල ඉහළ නොයෑම නිසා ගොවිජන බැංකුවට වී සුරැකුම් ණය ආපසු ගෙවීමට නොහැකිවූ ගොවීන් 33 දෙනෙකු සඳහා සහන ක්‍රමයක් මත ණය මුදල කොටස් වශයෙන් කන්න 2 කදී ගෙවීමට පහසුකම් සළසා ඇත.<br>2002/03 මහ කන්නයේදී ගොවීන්ගේ වී ගොවිජන බැංකු ණය ක්‍රමය යටතේ සුරකුම සඳහා වී කිලෝ ග්‍රෑම් 10,000ක ධාරිතාවයක් සහිත රීගාලයෙන් ගෙන්වන ලද කොකූන් ඒකක ගමට ලබාදීම හා 2003 යල කන්නයේ වී සුරැකුම් කිරීම සඳහා තවත් කොකූන් එකක් ගමට ලබාදීම. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |

# හතරවන පරිච්ඡේදය.

ව්‍යාපෘතියෙහි බලපෑම් සහ අරමුණු සඵලකර ගැනීම

4.1 සංවර්ධන කටයුතුවල බලපෑම.

ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මකකළ විවිධ ක්ෂේත්‍රවලට සම්බන්ධව ක්‍රියා පහත වගු මගින් විස්තර කරයි.

| 1. පුහුණු පාඨමාලා,වැඩමුළු දේශන හෝ උපදේශන සේවා | එහිනම | පුහුණුව ලැබූ හෝ ප්‍රයෝජනය ලැබූ සංඛ්‍යාව | එහිදී ආවරණය කළ විෂයයන් | එම දැනුම භාවිත කළ සංඛ්‍යාව | ඒ නිසා වැඩිවූ ව්‍යාකළ වපසරිය හෝ ඵලදාව |
|---|---|---|---|---|---|
| 1. ප්‍රජා සංවිධාන නායකයින් සහ තිරසර වැඩසටහනෙහි ක්‍රියාකාරී කමිටු සාමාජිකයන් කුඩා කණ්ඩායම් නායකයින් සඳහා පුහුණුව | ප්‍රජා නායකත්ව සහ හැකියාවන් වර්ධනය කිරීමේ පුහුණුව | 25 | නායකත්ව ගතිලක්ෂණ කුඩා කණ්ඩායම් තිරසාර වැඩසටහන යටතේ උපරිම සේවා ලබාගැනීම පෞද්ගලික අංශයේ සහාය | 22 | තිරසර වැඩසටහන සඳහා ප්‍රජා සහභාගීත්වය |
| 2. පසු අස්වනු තාක්ෂණ පුහුණුව | ගුණාත්මක සහල් නිෂ්පාදනය හා සහල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන පුහුණුව | 07 | වී අස්වනු නෙළීමේ සිට ගුණාත්මක සහල් නිෂ්පාදනයට අදාල ක්‍රියා සහල් ආශ්‍රිත අතුරු නිෂ්පාදනය. | 5 | ගුණාත්මක ලෙස වී නිපදවීම ඇරඹී ඇත. |

| වගාවන් හා වෙනත් කටයුතු පිළිබඳ ආදර්ශන | කුමක් සම්බන්ධයෙන්ද යන්න | එයට කෙළින්ම සහභාගි වූ සංඛ්‍යාව | එය අනුගමනය කළ සංඛ්‍යාව | ඒ යටතේ ව්‍යාප්ත වූ අක්කර ප්‍රමාණය | ඒ නිසා වැඩිවූ ඵලදායිතාවය අක්කර | වෙනත් ප්‍රතිඵල බලපෑම් |
|---|---|---|---|---|---|---|
| ගෙවතු වගාව | ගෙවතු සංවර්ධනය කිරීම | 25 | 10 | අක්කර 8 | ඵළවළු සහ මිරිස් කිලෝ 40 | ගොවීන්ගේ අමතර ලැබීම්, නිවසේ පෝෂණ තත්ත්වය ඉහළ යාම |

| විශේෂිත තාක්ෂණික දැනුවත් කිරීම් සහ ක්ෂේත්‍ර දින | කුමක්ද යන්න | එහි ප්‍රතිලාභීන් ගණන | ඒ නිසා නිෂ්පාදනයට ඵලදායිතාවයට හා ආදායමට වූ බලපෑම |
|---|---|---|---|
| වී වගාව, ගෙවතු වගාව, අතිරේක බෝග වගාව, සම්බන්ධ නව තාක්ෂණික දැනුවත් කිරීම්. | වී වගාවේ අස්වනු ඉහළ දැමීම, වී වගාවේ කීඩෑ හානිය, වී වගාවේ තාක්ෂණ ඌනතාවය, වී වගාවේ දිලීර රෝග පාලනය,ගෙවතුවගා ව්‍යාපෘතීන් ඇරඹීම, බීජවී නිපැයුම්, ඉදිරි වෙළඳ ගිවිසුම්, වගා ළිං වැඩසටහන්, ඵළවළු වගාව, පිදුරු කෙතට යෙදීම, බීජවී ගොවිපළ හා අතිරේක බෝග වගාව | ගොවීන් 98 දෙනෙකු | 2002/03 මහ කන්නයේ හා 2003 යල කන්නයේ මෙම තාක්ෂණික දැනුවත්කිරීම් වලට සහභාගි වූ ගොවීන් වී අස්වනු අක්කර 10 බුසල් 100 මට්ටමේ තිබීම, පොහොර වියදම අඩුවීම, ඵළවළු හා ගෙවතු වගාවෙන් අමතර ආදායම් හා පවුලේ පෝෂණය ඉහළ මට්ටමට පත්වීම |

| බීජ,ඇට,පැළ වර්ග වෙනත් ද්‍රව්‍ය හා උපකරණ බෙදාදීම | බෙදාදුන්නේ මොනවාද යන්න | එක් අයෙකුට දුන් ප්‍රමාණය | දුන් මුළු ප්‍රමාණය හෝ ප්‍රතිලාභීන් ගණන | ඒ යටතේ ව්‍යාප්තවූ අක්කර ගණන | ඒ නිසා වැඩිවූ ඵලදායිතාවය හෝ අක්කර ගණන | එය වර්තමාන හෝ අනාගත ආදායමට බලපා ඇති අයුරු |
|---|---|---|---|---|---|---|
| 1. යෙදවුම් බෙදාදීම | යූරියා කි.ග්‍රෑ. 540 ටී.එස්.පී. | යූරියා කි.ග්‍රෑ.50 ටී.එස්.පී කි.ග්‍රෑ. | ගොවීන් 11 | අක්කර 11 | වී අස්වනු බුසල් 10 බුසල් 100ක් | ගොවියාගේ මුළු ආදායම වැඩිවීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | කි.ග්‍රෑ. 525 | 50 | | | පැවතීම | |
| 2. මිදි වගා ආදර්ශ වනයක් | | එම්.ඕ.පී. කි.ග්‍රෑ.14 | ගොවීන් 1 | අක්කර 1/8 | සෙසු ගොවීන්ටනව ආදායම් මාර්ග පිළිබඳව ආදර්ශනය | ගොවියාගේ ආදායම ඉහළ නැගීම |
| 3. ගෙවතු වන වගාව | ආදර්ශනයක් සඳහා මිදි පැළ 25ක් ලබාදීම, ඒ සඳහා අවශ්‍ය කොන්ක්‍රීට් කණු ලබාදීම තේක්ක පැළ 3000ක් ලබාදීම | මිදි පැළ25 ආදර්ශනය එක ගොවියෙකුට පමණි එක ගොවියෙකුට තේක්ක පැළ 30 | ගොවීන් 100 | අක්කර 100 | | |

| වැව් අමුණු ඇලවේලි පාරවල් හා වෙනත් ප්‍රතිසංස්කරණ කටයුතු | කටයුත්ත කුමක්ද යන්න | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ඒ නිසා වැඩිවූ හෝ ජලය භාවිත වැඩිවීමෙන් වගාකළ ප්‍රමාණය අක්කර | වැඩිවූ ඵලදාව හෝ නිෂ්පාදනය | වැඩි වූ ආදායම | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| 1. ප්‍රධාන ඇලවල් හා කෙත් ඇලවල් ප්‍රතිසංස් කරණය | කි.මී. 17 දිග ඇල මාර්ග ශ්‍රමදානයෙන් ශුද්ධ කිරීම | ගමේ ජනගහනය පුද්ගලයන් 1264 | ගමේ වර්තමාන කුඹුරු ඉඩම් අක්කර 924වම නියගකින් තොරව ජලය සැපයීම | 2003/04 මහ කන්නයේ උපරිම ඵලදාවක් ලබාගත හැකිවීම | උපරිම අස්වැන්න ලැබීම නිසා ආදායම ඉහළ නැගීම | පවුල් 159 |
| 2. සංගුන්ගම වසමේ ප්‍රධාන මාර්ග හා කෘෂිමාර්ග ප්‍රතිසංස් කරණය | කි.මී. 17 පමණ දුර ප්‍රමාණයක පාරවල් බොරළු දමා ප්‍රතිසංස්කරණය | ගමේ මුළු ජනගහනයම මෙහි ප්‍රතිලාභීන් වෙයි. | පවතින කුඹුරු ඉඩම් වලට ලගාවීමේ පහසුව හා ඒ නිෂ්පාදන මිලදීගැනීමට වාහන පැමිණීම | ප්‍රදේශයේ සාමාන්‍ය ඵලදාව | සාමාන්‍ය අස්වැන්න ඉහළ යාම නිසා ආදායම වැඩිවීම | පවුල් 159 |

| සංවිධාන සමිති සමාගම් හා කුඩා කණ්ඩායම් ගොඩනැගීම හා ශක්තිමත් කිරීම | එහි ස්වභාවය | ගොඩනැගූ/ ශක්තිමත් කළ ගණන | ඒ සඳහා සහභාගිවූ ගොවීන්/පුද්ගලයන් ගණන | ඒ නිසා සංවිධානගතවූ පුද්ගලයින්ගේ වත්කම් ප්‍රතිශතය | ගොවීන්/ පුද්ගලයන් ලැබූ ප්‍රතිඵල | |
|---|---|---|---|---|---|---|
| 1. ක්‍රියාකාරී කමිටු ගොඩනැගීම | ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් හා ප්‍රජා සංවිධාන නියෝජිතයන් හා ගැමියන් ඇතුලත් ක්‍රියාකාරී . කමිටුවක් බිහිකිරීම | 1 | 13 | | තිරසර වැඩසටහන ගමේ ජනතාවගේම වැඩසටහනක් ලෙස රටේ ජනතාවට ක්‍රියාත්මක කිරීමේ ශක්තිය ලැබීම | |
| 2. කුඩා කණ්ඩායම් ගොඩනැංවීම | ජනතාවට එක්වීමේ පහසුව තකා කුඩා කණ්ඩායම් ගොඩනැංවීම | කණ්ඩායම් 6 | 120 | | තමතමන්ගේ කොටස්වල ඇති අඩුපාඩු පෙන්වාදීමට හැකිවීම හා එම අඩුපාඩු විසඳාගැනීම සඳහා මූලිකවී ක්‍රියාකිරීම | |

| 8. යෙදවුම් සැපයීම, සේවා ඉතිරි කිරීම් හා ණය සැපයීම් අලෙවි කටයුතු ආදිය හඳුන්වාදීම හෝ ශක්තිමත් කිරීම | කටයුත්ත කුමක්ද යන්න | එහි පතිලාභීන් සංඛ්‍යාව | ඒ නිසා වැඩිවූ ඉතිරි කිරීම්, ණය ගැනීම් ප්‍රමාණය හෝ ප්‍රතිශතය අලෙවි කටයුත්තක් නම් වැඩියෙන් මිල | ඒ නිසා ඇතිවූ ප්‍රතිලාභ |
|---|---|---|---|---|
| වී සුරැකුම් පවත්වාගෙන යාම සඳහා ගොවිජන බැංකු ණය සැපයීම | 2002/03 මහ කන්නයේදී ගොවිජන බැංකුණය ක්‍රමය යටතේ වී ගොවීන් වී සුරැකුම් ක්‍රමයට දායක කිරීම | වී ගොවීන් 32 | රුපියල් 13.50 මිලට වී අලෙවි කිරීම | රුපියල් 13.50 මිලට ප්‍රීමා සමාගමට වී අලෙවි කිරීම නිසා ගොවීන්ගේ ආදායම සරුවීම ආදායම සරුවීම |

| | | | | |
|---|---|---|---|---|
| පොහොර ණය | 2003 යල කන්නයේදී ගොවිජන බැංකු ණය සැපයීම | වී ගොවීන් 19 | රුපියල් 13.50 මිලට අලෙවි කිරීම | |
| | පොහොර මිලට ගැනීම සඳහා ගොවි බැංකු ණය සැපයීම 2002/03 මහ 2003 යල | ගොවීන් 60 | ගොවි බැංකු ණය සැපයීම රුපියල් 780040 කින් ඉහළ ගොස් ඇත. | හොඳින් පොහොර යෙදීම නිසා උසස් අස්වනු ලැබීම |

## 4.2 කෙටිකාලීන හා දිගුකාලීන ව්‍යාපෘති අරමුණු ඉටුවීම

**කෙටිකාලීන**
**ඵලදායිතාවය වර්ධනය කිරීම**

තිරසර සංවර්ධන වැඩසටහන සංසුන්ගම ගම්මානයේ ආරම්භවූයේ ජනතා සහභාගීත්ව වැඩසටහනක් ලෙසිනි. ක්ෂේත්‍ර මට්ටමේ ආයතන හා ගමේ සම්බන්ධතාවය ශක්තිමත් කරමින් ජනතා අවශ්‍යතා මත සැකසුන සංවර්ධන සැළැස්මකට අනුව එම ආයතන ජනතාව සමග සමීප වී සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වීම සිදු විය. මෙම ක්‍රියාවලියේදී කෙටිකාලීනව සිදුවූ වර්ධනයන් කිහිපයක් දැකගත හැකිවිය. එකක් නම් ඵලදායිතාවය වර්ධනය වීමයි. මෙයද ආකාර කීපයක් අනුව වර්ධනය විය. එනම් තිරසාර ව්‍යාපෘතිය මාර්ගයෙන් සංවිධානය කරන ලද දේශන, පුහුණු පන්ති ආදිය මාර්ගයෙන් ජනතාවගේ ආකල්ප හා ඔවුන් මෙම ව්‍යාපෘතිය දෙස බැලූ අන්දම ශුභවාදී දිශාවකට යොමු කිරීමට සමත් විය. මෙවැනි ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් ඔවුන්ගේ ජීවිතය තුළ නොදුටු නොඇසූ බොහෝදේ මේ පුහුණු පන්ති තුළින් ඔවුන්ට ඉගෙනගත හැකිවිය. සහභාගීත්ව ගැමි විමසුම් අභ්‍යාස මාර්ගයෙන් ගමේ තොරතුරු එක්රැස් කිරීම හා සංවර්ධන සැළසුම් සකස් කිරීම ජනතාවගේ උපරිම සහයෝගයෙන් සිදු කිරීම ගමේ ජනතාව ලද නවතම අත්දැකීමක් හා ඉගෙනුමක් වූවාට සැකනැත. ඉන්පසු නායකත්ව පුහුණුවේදී ප්‍රජානායකයකුගේ තිබියයුතු ලක්ෂණ ආදී දේ ගැන කථාකරමින් සමාජ ප්‍රගමනය සඳහා දායකවිය හැකි අයුරින් තමතමන්ගේ ජීවිත හැඩගස්වා ගැනීම හා පවත්වාගෙන යාම පිළිබඳව අවබෝධයක් ලබාගත්හ. ක්‍රියාකාරී කමිටු පිහිටුවා ඒවා සඳහා ගමේ ජනතාව පත්කිරීමෙන් ඔවුන් එක්ව වැඩකිරීම පිළිබඳව බොහෝ අත්දැකීම් ලදහ. මේ සියල්ලෙන්ම ගමේ මානව නැතහොත් ප්‍රජා ඵලදායිතාවයේ වර්ධනයක් සිදුවූ බව කිවයුතුය. මෙම වැඩකටයුතු වලදී ඔවුන් ලබාගත් අධ්‍යාපනය ඔවුන්ට අනාගතයේදීත් ගමේ සංවර්ධනය පිනිස යොමු කරගත හැකි වන්නේය. ක්ෂේත්‍ර මට්ටමේ ආයතන සමග එකට වැඩකිරීම, එම ආයතන වල නිලධාරීන් සමග සබඳතා ගොඩනගා ගැනීම, ඔවුන් සමග එකතුවී වැඩකිරීම ආදිය මගින්ද ගමේ මානව ඵලදායිතාවයේ ගුණාත්මක වර්ධනයක් සිදුවිය. ගමේ ජනතාව පෙරට වඩා වැඩට බැසීම මගින්ද පෙනෙනුයේ ජනතාවගේ ඵලදායිතාවයේ ඉහළ යාමකුයි. ගමේ ජනතාවගේ ඵලදායිතාවය වර්ධනය වූ දෙවන අංගයනම් භෞතිකමය වශයෙනි. තිරසාර වැඩසටහන මාර්ගයෙන් ක්ෂේත්‍ර මට්ටමේ ආයතන දැනුවත් කිරීමත් සමගම එම ආයතන ඊට යහපත් ප්‍රතිචාර දක්වා ඒවායේ ක්‍රියාකාරී වැඩසටහනේදී සංසුන්ගම සඳහා වැඩිබරක් ලබාදීමට ක්‍රියාකළේය. එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාව විසින් ප්‍රමුඛතා ගතකරන ලද ප්‍රශ්න අනුව තම ක්‍රියාකාරී වැඩසටහන් ගමතුළ ක්‍රියාත්මක කිරීමට සම්පත් වැය කළහ. ඒ අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වී වගාව, අතිරේක බෝග වගාව, පළතුරු වගාව, එළවළු වගාව සඳහා අවශ්‍ය තාක්ෂණික පුහුණුවීම්, එළවළු හා පළතුරු ආදර්ශන, වී ආදර්ශන හා උපරිම

අස්වනු ආදර්ශන. බිත්තර වී නිපැයුම ආදී කෘෂි නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට හේතුකාරක වන වැඩසටහන් ඇරඹීමය. මෙම නිසා ගොවීන්හට දැනුම හා අධ්‍යාපනයත් සමගම ඉහළ බෝග අස්වැන්නක් ලබාගැනීමට හැකිවිය. ඒ ආකාරයටම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ණය පොහොර වැනි යෙදවුම්ද අස්වනු ඉහළ මිලකට අලෙවිකරගැනීමට නොහැකිව තිබු පසුබිම යටතේ රජයේ සහතික මිල ගොවීන්ට ලබාදීමට සමත්විය. මේවායේ සෘජු හා වක්‍ර බලපෑම ගොවි ප්‍රජාව ධෛර්යමත් කරන මානසිකත්වයක් නිර්මාණය කිරීමට සමත් විය. ව්‍යාපාර අධිකාරියද ඇල මාර්ග පුනරුත්තාපන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට උනන්දු විය. 2003/04 මහ කන්නයේදී ලෝක ආධාර වැඩසටහන යටතේ ඇල මාර්ග සුද්ධ කිරීම නිසා කුඹුරු යායවලට හොඳින් ජලය ලැබෙන බැවින් එය වී නිෂ්පාදනයටද ආදායමටද අවසානයේ ගොවිජනතාවගේ ධනාත්මක මානසික තත්ත්වයටද බලපානු ඇත. ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය විසින් ආරම්භ කරන ලද අධිවේගී මැෂින් පුහුණුව ලැබීමෙන් තරුණ තරුණියන් 50 කට පමණ වෘත්තීය පුහුණුව ලැබීමත් එමගින් රැකියා සොයාගැනීමට හැකිවීමත් නිසා ඔවුන්ගේ ඵලදායිතාවය වැඩිවිය. ඒ වගාව, අතිරේක බෝග වගාව, ගෙවතු වගාව, ආදිය පිළිබඳ තාක්ෂණය හා යෙදවුම් ලබාදීම නිසා ඒ හැම ක්ෂේත්‍රයකම අස්වනු ඉහළ යාමට හේතුවිය. ලබාගත් අස්වැන්න රජයේ සහතික මිලට අලෙවි කිරීම සඳහා වී ගුරුකුම් කිරීම සඳහා කොකුන් ලබාදීමෙන් වී වලට ඉහළම මිලක් ලබාගැනීමට ගොවි ප්‍රජාවට හැකිවිය. මෙම ඉහත සඳහන් කරන ලද සියළුම ක්‍රියාමාර්ග ඇසුරින් සංසුන්ගම ජනතාවගේ පුද්ගල ඵලදාව සහ භෞතික ඵලදාව ඉහළ ගියබව කිව හැකිය.

තිරසර සංවර්ධන වැඩසටහන ආරම්භයේදීම සිදුකරන ලද සහභාගීත්ව ගැමි විමසුම් අභ්‍යාසයේදී පෙනීගියේ ගොවි පවුල්වල තරුණයන් රාශියක් සඳහා ඵලදායි රැකියා අවස්ථා නොමැති බවයි. මේ නිසා බොහෝ පවුල්වල උපයන පිරිසට වඩා යැපෙන පිරිස විශාල බැවින් දරිද්‍රතාවය පැතිරෙමින් පැවතිනි. මෙයට විසඳුමක් වශයෙන් ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ සහයෝගයෙන් අධිවේගි ජුකි මැෂින් පුහුණු මධ්‍යස්ථානයක් සංසුන්ගම ඇරඹීමට හැකිවිය. මේ නිසා ගමේ කිසිම වෘත්තිය පුහුණුවක් නැති තරුණ තරුණියන් 50 කට පමණ ජුකි මැෂින් ක්ෂේත්‍රයේ වෘත්තීය පුහුණුව හිමිවිය. මොවුන් අතරින් තරුණයින් සඳහා ඇඟළුම් කම්හල්වල රැකියා අවස්ථා සීමිත වුවත් තිරසර වැඩසටහනේ ඉල්ලීම මත ඇඟළුම් කම්හල් දෙකක් විසින් මෙම තරුණයින්ට රැකියා ලබාදී ඇත. මෙයින් එම නිවෙස්වල අතිරික්ත ශ්‍රමයත් ඵලදායී ලෙස වෙනත් ක්ෂේත්‍රයක් වෙත යොමු කෙරුනා පමණක් නොව එම පවුල්වල ආර්ථික දුෂ්කරතා ද මගහැරී යයි.

සංසුන්ගම ගොවි පිරිස විශාල ලෙස වී වගාවේ නිරතවුවද වී ආශ්‍රිතව අතුරු නිෂ්පාදන බිහි කිරීමට මෙතෙක්කල් සිත් යොමුකොට නැත. මෙම මූලික හේතු නිසාත් ජනතාවගේ ස්වයං රැකියා අවස්ථා අඩුවීම නිසාත් ආදායම් මාර්ග සීමිත වීම නිසා දුප්පත්කම පිළිබඳ ගැටළුවට මුහුණ දීමට සිදුවී ඇත. මේ නිසා මෙවැනි ගොවි මහතුන්ට වී ආශ්‍රිත අතුරු නිෂ්පාදිත බිහිකිරීම සඳහා වූ නේවාසික පුහුණු පාඨමාලාවක් අනුරාධපුර "පශ්චාත් අස්වනු තාක්ෂණ" ආයතනය විසින් ලබාදුන්නේය. මෙයින් ලබාගත් දැනුම මත එම ගොවි පිරිස සහල් සැකසීම හා ඒ ආශ්‍රිත කර්මාන්ත ඇරඹීමට සූදානම්ව සිටී. මෙය පොදුවේ ගමේ සියළුම වී ගොවීන්ට හිතකර තත්ත්වයක් වන්නේය.

ගොවීන්ගේ ආදායම් ඉහළ නංවීම අරමුණු කරගනිමින් වැඩසටහන් රැසක්ම ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කර ඇත. ප්‍රධානතම ආර්ථික බෝගය වන වී වගාවේ ආදායම් ඉහළ නැංවීම සඳහා පුහුණු සහ ක්ෂේත්‍ර

වැඩසටහන් යටතේ විශේෂිත තාක්ෂණික දැනුවත් කිරීම් රාශියක්ම සිදුකර ඇත. වී වගාවේ අස්වනු ඉහළ දැමීම, වී වගාවේ කීඩෑ හානිය, වී වගාවේ තාක්ෂණ ඌනතාවය, වී වගාවේ දිලීර රෝග පාලනය මේ අතර ප්‍රධානය. මෙම තාක්ෂණික දැනුවත්වීම නිසා ගොවීන්ගේ (බුසල් 100 දක්වා) අස්වනු ඉහළ ගිය අතර එය ආදායම වැඩිවීමට බලපෑවේය.බීජ වී නිෂ්පාදනයද වී වගාවේ ආදායම් වැඩිකර ගැනීමේ තවත් මාර්ගයකි. බීජ වී ගොවීන් 10 දෙනෙකු අක්කර 12 බීජ වී වගාකර ඇති අතර ඒවා සාමාන්‍ය වී වල මිලට වඩා ඉහළ මිලට අලෙවි කර ඇත. වී වගාවේ අක්කර එකේ උපරිම අස්වනු ලබාගැනීමේ ආදර්ශන 11ක් ගොවීන් 11 දෙනෙකු සමග ක්ෂේත්‍රයේ අරඹා ඒ සඳහා නොමිලේ යූරියා, ටී.එස්.පී. සහ එම්.ඕ.පී. යන පොහොර වර්ග අවශ්‍යතාවයෙන් අඩක් පමණ නොමිලේ ලබාදී ඇත. මේ තුළින්ද ඉහළ අස්වැන්නක් ලැබී ඇති අතර අවසානයේ ඉහළ ආදායමක් ලැබී ඇත. එයට අමතරව ගෙවතු වගා වැඩසටහන්, එළවළු වගා ආදර්ශන වැඩසටහන්, අතිරේක බෝග වගා වැඩසටහන්, වගා ළිං යටතේ බෝග වගා වැඩසටහන් නවීන තාක්ෂණ උපදෙස් යටතේ සිදුකර ඇත. මේ සියල්ලේම අවසාන ප්‍රතිඵලය ගොවීන්ගේ ආදායම කෙටි කාලයක් තුළ ඉහළ නැංවීමයි.

තිරසර සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජනතා සහභාගීත්වය උපරිම අන්දමින් ලබාගැනීම අත්‍යවශ්‍ය කරුණක් විය. මේ සඳහා තිරසර වැඩසටහනේ ක්‍රියාකාරීත්වයට ජනතා සහභාගීත්වය උපරිම අයුරින් ලබාගැනීමට උදව් විය. ඉහත පරිච්ජේදයේදී සඳහන් කරන ලද වී වගාව ගෙවතු වගාව හා අතිරේක ආහාර බෝග වගාව යන වගාවන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් තාක්ෂණික උපදෙස් සැපයීම සහ බීජ හා පොහොර ලබාදීම මගින් ගොවීන් මෙම වැඩසටහන පිළිබඳව පැහැදීමක් ඇතිවී මෙම වැඩසටහනට හැකි උපරිම අයුරින් සිය සහභාගීත්වය ලබාදී ඇත. මෙම වැඩසටන් වලට අමතරව ගෙවතු වනවගා සඳහා වන පැළ ගොවීන් අතර බෙදාදීම මගින්ද ගොවීන් මෙම වැඩසටහන වෙතට ආකර්ශනයකර ගැනීමක් සිදුවිය.

තිරසර වැඩසටහන මුලින්ම ආරම්භ කළේද ගමේ ජනතාව විසින්ම තමන් මුහුණපා සිටින ගැටළු හා ප්‍රශ්න ඉදිරිපත් කිරීම හා ඒවාට සුදුසු විසඳුම් ඔවුන්ම යෝජනා කිරීමේ වැඩසටහනකිනි. එම මූලාරම්භයේදීම මෙම වැඩසටහන ජනතාවගේම වැඩසටහනක්ය යන විශ්වාසය ඔවුන් තුළ ගොඩනැගූ අතර පසුව වාර දෙකකදී පැවැත්වූ පුහුණු වැඩසටහන් වලදී එම අදහස වඩාත් පුළුල් ලෙස ජනතාව වෙත ඇතුල්කරනු ලැබීය. මෙම වැඩසටහන සම්බන්ධව ක්ෂේත්‍රයට යාමේදී වඩාත්ම සුහදශීලී අයුරින් ගමේ ජනතාව හා එක්ව ඔවුන් සමග ඉදිරි වැඩපිළිවෙල් ගැන සාකච්ඡා කරමින් ගමේ ජනතාවට සමීපවීමට අප කළ උත්සාහයද ජනතා සහභාගීත්වය උපරිම අයුරින් ලබාගැනීමට සමත් විය. මෙම ලැබූ ජනතා සහභාගීත්වය තුළින් හඳුනාගත් ප්‍රබලම ගැටළු දෙකකට මේ වනතුරුත් විසඳුම් ලබාදීමට අපොහොසත් වී සිටි. ඒවානම් ගොඩ ඉඩම් වගාකිරීම සඳහා ජල සම්පාදන වැඩසටහන සහ පානීය ප්‍රජා ජල සැපයුම් යෝජනා ක්‍රමයයි. අනාගතයේදීවත් මෙම ජනතාවගේ ඉල්ලීම් ඉටුකර දීමට තිරසර වැඩසටහන සමත් වුවහොත් ලැබූ ජනතා සහයෝගය වඩාත්ම අර්ථවත් එකක් වනු ඇත.

දිගු කාලීන අරමුණු ඉටුවීම :-

ජනතාවගේ ජීවන තත්ත්ව වර්ධනය.

තිරසර සංවර්ධන වැඩසටහන යටතේ සෑම ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන්ම ඉටුකරන ලද වැඩකොටස දිගුකාලීන වශයෙන් ජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරමට ඉවහල් වේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යන ආයතන වලින් ඉහත විස්තර කර ඇති අයුරින් ප්‍රදේශයේ වෙනත් ගම්වලට සිදුනොකරන ලද සේවයක් සංසුන්ගමට ඉටුකර දී ඇත. කෙටිකාලීන වශයෙන් එක කන්නයනක බොහෝ දේවල ප්‍රතිඵල ගොවි ජනතාවට ලැබුණි. එහෙත් ඒවා දිගුකාලීන වශයෙන් ප්‍රතිඵල ලබාදීම සඳහා ජනතාවගේ සිත් තුළට කාවදින කොටස දිගුකාලීන වශයෙන් ඉතා වැදගත් වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් වී වගාව, ගෙවතු වගාව සහ අතිරේක බෝග වගාව සඳහා ලබාදෙන ලද ආදර්ශනද ඇතුලත් ගොවි පුහුණු පන්ති හා ප්‍රායෝගික වැඩ පිළිවෙල මගින් ගොවින් වෙත ලබාදුන් වී වගා ක්ෂේත්‍රය පිළිබඳ පාඩම ගොවි ජනතාව දිගුකාලයක් තිස්සේ තම ගොවිතැන් කටයුතුවලදී ප්‍රායෝගිකව ක්‍රියාවට නංවයි. වී වගාවේ නිෂ්පාදන වියදම් පහළ බැස උපරිම අස්වනු ලැබීමෙන් වී වගාවේ ලාභදායකත්වය වැඩිවේ. වී සුරැකුම් වැඩපිළිවෙල යටතේ ඉහළ මිලක් ලබාගැනීමෙන් ගොවියාගේ ජීවන තත්ත්වය උසස් වේ. බීජ වී නිෂ්පාදනය වැනි වැඩපිළිවෙල් මගින් වී වගාව විවිධාංගීකරණයකට ලක්කෙරේ. මෙනිසා වී අලෙවි ගැටළු මගහැර ගැනීමටත් තම නිෂ්පාදිත බීජ වී සඳහා ඉහළ මිලක් ලබාගැනීමටත් ගොවි ජනතාවට අවස්ථාව සැලසේ. දිගුකාලීන වශයෙන් ආදායම් ලබාදෙන පේක්ක වන වගාවෙන් වසර 20-25 කදී එක ගසකින් රුපියල් ලක්ෂයක් පමණ ලබාගැනීමට අවස්ථාව සැළසෙයි. ජනතාව සාමුහික වශයෙන් ශ්‍රමදාන පදනම මත තම වාරිමාර්ග ශුද්ධකර පුනරුත්ථාපනය කොට ඒවායේ හොඳ ජලවහනයක් ඇති කිරීමට ක්‍රියා කළේය. මේ සඳහා ලෝක ආහාර වැඩපිළිවෙල යටතේ වියළි ආහාර මල්ල බැගින් ලැබුණි. එහෙත් අනාගතයේදීත් මේ ආකාරයට ශ්‍රමදාන මාර්ගයෙන් ඇල මාර්ග හා පාරවල් පිළිසකර කිරීමේ වැදගත්කම ජනතාවට හොඳින් අවබෝධ වී ඇත. එම අත්දැකීම් දිගුකාලීන වශයෙන් ගොවි ප්‍රජාව යලි යලිත් අනාගතයේදී ක්‍රියාවට නගනු ඇත. ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය දිගු කාලීන වශයෙන් උසස් කිරීමට මෙම කටයුතු පිටිවහලක් වේ.

ගොවි ප්‍රජාව සම්බන්ධ නායකත්ව හැකියා, ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීම, කෘෂිකර්ම සහාය සේවා ශක්තිමත් ලෙස ගමට ලබාගන්නා ආකාරය ආදිය පිළිබඳ පුහුණු වැඩසටහන් මාර්ගයෙන් ගොවි ජනතාවගේ හැගීම්, ආකල්ප ආදිය යම්කිසි ආකාරයකට වෙනස් කිරීමට හැකිවිය. මෙම පුහුණු වැඩමුළු මගින් බලාපොරොත්තු වූයේ ගමේ ප්‍රජාව නිවැරදි මාර්ගයකට අවතීර්ණ කොට තම ජීවන තත්ත්වය උසස් කරගැනීම සඳහා මග පෙන්වීමයි. මේ පුහුණු හැකිවලින් ජනතාව වෙත ලබාදුන් දැනුම අනුව ඔවුන්ගේ අනාගතය ඔවුන් විසින්ම උසස්කර ගැනීමට කටයුතු කරාවි යයි තිරසර වැඩසටහන විශ්වාස කරයි.

# පස්වන පරිච්ඡේදය

සොයා ගැනීම්, පාඩම් අත්දැකීම් හා ගැටළු.

## 5.1 සොයා ගැනීම්

තිරසර සංවර්ධන වැඩසටහන පිළිබඳව ආරම්භයේදීම ජනතාව තුළ විශ්වාසයක් පැවතියේ නැත. පැවතියේ සැකයකි. හේතුව 1986 දීද මෙම ගම දියුණු කිරීමට ව්‍යාපෘතියක් පැමිණුනද එය අතරමග අකර්මන්‍ය විය. එම නිසා ව්‍යාපෘති පිළිබඳව ජනතාව තුළ අවිශ්වාසයක් පවතී. එනිසා ආරම්භයේදී ජනතාව මෙවැනි පිටින් පැමිණෙන ව්‍යාපෘති පිළිබඳව සැකයකින් බැලීමට පුරුදුව සිටී.

මෙම ව්‍යාපෘතිය නිර්මාණය වී ඇත්තේ ජනජීවිතයේ තත්ත්වය උසස්කිරීම අරමුණු කොටගත් ක්‍රියාත්මක වැඩ කොටස් සඳහා අදාල ක්ෂේත්‍ර මට්ටමේ ආයතන සම්බන්ධකර ගැනීමෙන් ක්ෂේත්‍ර කටයුතු ශක්තිමත්ව පවත්වාගෙන යාමයි. මෙවැනි අවස්ථා වලදී එම ප්‍රදේශයේ ක්ෂේත්‍ර මට්ටමේ ආයතන මෙම ව්‍යාපෘතියේ වැඩ සමග සම්බන්ධවීමට අදිමදිකිරීමක් පෙන්විය. හේතුව මුදල් ප්‍රතිපාදන අප විසින් සපයන්නේ නොමැතිව වැඩ පමණක් කිරීමට මෙම ආයතන වලින් ඉල්ලීම් කරන බැවිනි. කෙසේ වුවද කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පශ්වාත් අස්වනු ආයතනය වැනි ආයතන තිරසර වැඩසටහනට ඉතා උසස් අන්දමින් දායකවී විශිෂ්ඨ වැඩ කොටසක් කළ බව ප්‍රකාශකළ යුතුය. කෘෂිකර්ම අමාත්‍යාංශයේම ආයතනයක් වන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මුලින්ම අපගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. මින්පසු මේ පිළිබඳ පශු සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කිරීමෙන් පසු ව්‍යාපෘතියේ වැඩකිරීමට කැමතිබව දන්වා ලිපි එවා ඇත.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියද ව්‍යාපෘතිය සඳහා අගනා දායකත්වයක් ලබාදුනි. එසේ වුවත් පොදුවේ ගත්විට ආයතනවල ඉල්ලීම් අනුව ව්‍යාපෘතිවල වැඩකොටස් භාරගැනීමට වෙනත් ආයතන එතරම් කැමැත්තක් නොදක්වන බව පෙනේ.

ගම්වල ජනතාව ව්‍යාපෘති කියූ සැනින් ගිනින් මවාගන්නේ අතිවිශාල මුදල් ප්‍රතිපාදන සහිත විශාල සංවර්ධන වැඩසටහනකි. එමනිසා මෙවැනි ක්ෂේත්‍ර මට්ටමේ ආයතන ගම හා සම්බන්ධකර ක්‍රියාත්මක කරන ව්‍යාපෘති වුවද ඔවුන් සළකන්නේ විශාල සංවර්ධන ව්‍යාපෘතියක්ය යන මානසිකත්වයක බැවින් ගමේ ජනතාව මුහුණපා සිටින බරපතලම එමෙන්ම විශාල මුදල් ප්‍රමාණයක් වැයවන ක්‍රියාකාරකම් ඉටුකරදෙන ලෙස සැමවිටම ඉල්ලා සිටී. උදාහරණ වශයෙන් සංසුන්ගම ජනතාව ඉල්ලනුයේ උස්සාන වාරිමාර්ගය නැවත පුනරුත්තාපනය කරදෙන ලෙස හා පානීය ජල සම්පාදන ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලෙසය. ගමේ ජනතාව විශ්වාස කරනුයේ ගමට පැමිණඇති ව්‍යාපෘතියට මේ සියළුම ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමේ අවශ්‍ය සම්පත් තිබෙන බවයි. මේවා කුඩා පරිමාණ ව්‍යාපෘති වුවත් ඒ සඳහා විශාල සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය වන්නේය. ඇස්තමේන්තු කර ඇති පරිදි මේ සඳහා රුපියල් 25 ලක්ෂයක් අවශ්‍ය වේ.

කොතෙක් වී සුරැකුම් ක්‍රමය ක්‍රියාත්මක වුවත්, ගොවිජන බැංකුව ක්‍රියාත්මක වුවත් කඩේ මුදලාලිගෙන් පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය මිලට ගැනීම සිදුවේ. තවම 40% ක් පමණ මෙලෙස ගමේ හෝ ආසන්නයේ පෞද්ගලික වෙළඳසැළකින් ණයට ගනී. එමනිසා කොතරම් ගොවිජනතාවට හිතකර ප්‍රතිපත්ති ක්‍රියාවට යෙදවීමට උත්සාහ කළද ඒවා සාර්ථක නොවේ. එයට හේතුව මෙම ජනතාව කලක සිට හුරුපුරුදු වූ ජීවනක්‍රම අත්හැරීමට ඇති පසුබැමැත්තයි.

මෙම ජනතාව දශක 5ක් පමණ කාලයක් තිස්සේ වී වගාව පමණක් එකම ප්‍රධානතම ආර්ථික කටයුත්ත ලෙස සළකා ඒ අනුව ජීවිත හැඩගසාගෙන සිටි පිරිසකි. බිම් සකස් කිරීමේ සිට වී වැපිරීම දක්වා මාස 1ක පමණ කාලයත්, අස්වනු නෙළීමේ මාස 1ක පමණ කාලයත් වී වගාවේ ගොවීන්ට වැඩ බහුල කාලය වෙයි. මේ අතරතුර කාලය වැයවන්නේ ජලය සැපයීම, පොහොර යෙදීම වැනි කටයුතු වෙනුවෙනි. මෙම කාලය තුළ අමතර ආදායම් ලැබෙන ස්වයං රැකියාවල යෙදීමට සිත් යොමුකිරීමක් කර නැත. පොහොර සහනාධාර, වී සහතික මිල යෝජනා ක්‍රම ආදිය හොඳින් ක්‍රියාත්මක වූ අවධියේ ගොවීන් වී වගාවෙන් ලාභ ලැබීම නිසා මෙම අමතර ආදායම් මාර්ග වලට සිත්යොමුකර නැත. ගොඩ ඉඩම්වල වගා කටයුතු සඳහා පොම්පාගාර මගින් ජලය සපයාදුන්නද එයද රැකබලාගැනීමක් නොකිරීම නිසා උද්‍යාන වාරිමාර්ගයද අඩපනවීමට පවා හැර ඇත. මෙලෙස වී පමණක් වගාකරමින් තම ආර්ථිකය පවත්වාගෙනආ ගොවිපිරිසක් විවිධ ස්වයං රැකියා මාර්ගවලට පුරුදු පුහුණු කිරීමට උත්සාහ කළද ඒ සාර්ථක නොවන්නේ මෙම ආකල්ප වලින් මොවුන් ඉවත්කර ගැනීමට නොහැකිවීමත් නව ආදායම් මාර්ගයක යෙදීමට මොවුන් තුළ ඇති ඉදිරිපත්වීමට ඇති බිය ගතියක් නිසාය. ප්‍රාග්ධන ගැටළු, අලෙවි ගැටළු විවෘත ආර්ථිකය තුළ ඇති තරගකාරීත්වයට මුහුණදීමට සිදුවීම ආදිය මෙම තත්ත්වය තවතවත් වර්ධනය කිරීමට හේතුවී ඇත.

තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන වැනි වැඩසටහන්වලදී ගමේ ජනතාවගේ ක්‍රියාකාරී සහයෝගය ලබාගැනීම සඳහා ජනතාව මුහුණදී සිටින දැවෙන ප්‍රශ්න සඳහා විසඳුම් ලබාදීමට සිදුවේ. මෙම විසඳුම් ලබාදීම ඒ සඳහා වගකීම දරන ආයතන වෙත යොමුකිරීමට පුළුවන. උදාහරණ ලෙස වාරිමාර්ග පහසුකමක් සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පානීය ජල සම්පාදනයක් පිළිබඳව අදාල පළාත් පාලන ආයතනය, විදුලිය සම්බන්ධව විදුලිබල මණ්ඩලය ආදී වශයෙනි. එසේ මෙම අඩුපාඩුව සපුරාදෙන ලෙස ඉල්ලා අදාල ආයතන වෙත ඉල්ලීම ව්‍යාපෘතිය මගින්ම ඉදිරිපත් කළද ඒ සඳහා විසඳුම් ලැබෙන කාලය කවදාදැයි නිශ්චිත නැත. ඇතැම්විට එය ඉටු නොවීමටද පුළුවන. එමනිසා තිරසාර වැඩසටහන ක්‍රියාත්මක වන කාල වකවානුව තුලම අදාල ප්‍රශ්න විසඳීමට හැකිකමක් ලැබෙන්නේ නම් එය ඉතාම වැදගත් වන්නේය. එම නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සම්බන්ධීකරණය පවත්වාගෙන යන ආයතනය මේ සඳහා සම්පත් වැයකළ යුතුය. එබැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේදී ජනජීවිතය සඳහා අත්‍යවශ්‍ය සීමිත සංවර්ධන කාර්යයන් කීපයක් හෝ ඉටුකිරීම සඳහා සම්පත් වැයකිරීමට සිදුවේ.

තිරසාර සංවර්ධන ගම්මාන වැඩසටහනේ අවසාන අරමුණ වන්නේ ව්‍යාපෘති බලප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමයි. මෙහිදී මා මුලින් සඳහන් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගමේ ජනතාවගෙන් සහ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ගෙන් සමන්විත තිරසර සංවර්ධන කමිටුවක් බිහිකර ඇත. එසේ වුවත් පෙනී යන්නේ ව්‍යාපෘතිය සම්බන්ධීකාරක මෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආයතනය විසින්ම බොහෝවිට මෙම කමිටුව පවා ඇදගෙන යායුතු බවයි. එයින් පෙනෙනුයේ සංවර්ධනය ගැමියා තුළින් නිරායාසයෙන්ම පැනනොනගින බවයි. එම නිසා ඔවුන් සංවර්ධන මාර්ගය වෙත අවතීර්ණ කරවීමට යම්කිසි මාධ්‍යයක් අවශ්‍ය වන්නේය. එම නිසා සංවර්ධනය ගැමියා තුළින් නිරායාසයෙන්ම පැනනොනගී නම් බාහිර උත්ප්‍රේරකයක් මගින් සංවර්ධනය වෙතට ගැමියා කොටුකිරීම ග්‍රාමීය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය කාර්යයකි. එවැනි උත්ප්‍රේරක මාධ්‍යයක් ගැන කතා කිරීමේදී තිරසර වැඩසටහන වැනි

වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන ආයතන එවැනි උත්ප්‍රේරකයෙකුගේ කාර්යය කළයුතු වන්නේය. නැතහොත් උගත් තරුණයකු මේ කාර්යය සඳහා පත්කර ව්‍යාපෘති බල ප්‍රදේශයේම නතර කළ යුතුය.

## 5.2 පාඩම් හා අත්දැක්ම්

තිරසර සංවර්ධන වැඩසටහන ග්‍රාමීය ප්‍රජා සේවා ශක්තිමත් කරන කුඩා පරිමාණ වැඩසටහනකි. ශ්‍රී ලංකාවේ වෙනත් ගම්මාන දියුණු කිරීම සඳහා ආදර්ශනයක් හා මාදිලි ලෙස භාවිතයට ගැනීමට පුළුවන. එලෙස ආදර්ශනයක් ලෙසින් සංවර්ධන කාර්යයන්හි නියැලී සිටින්නන්ගේ ප්‍රයෝජනයට ගැනීමේ මුඛ්‍ය පරමාර්ථය ඉටුවීමට නම් මෙම අදාල ගම්මාන සෑම අංශයකින්ම ආදර්ශමත් ඒවා විය යුතුය. ගම්මානයේ ප්‍රජාව වෙනත් ගම්වලට ආදර්ශ ලෙස මෙම වැඩසටහන තුළ ක්‍රියාකර තිබිය යුතුය. අනෙක් අතට ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ද මෙහිදී ආදර්ශනයක් ලෙස කටයුතුකර තිබිය යුතුය. මගේ අත්දැකීමේ හැටියට මෙම ප්‍රධාන අංශ දෙකම හරිහැටි ඉටුවී නැති බවයි. තිරසර වැඩසටහන ගම් මට්ටමින් ක්‍රියාවට නැංවීම සඳහා ගොඩනගන ලද ග්‍රාමීය ක්‍රියාකාරී කමිටු, කුඩා කණ්ඩායම් ආදිය ක්‍රියාශීලී ලෙස කටයුතු කලේ නැත. මේ සඳහා මූලික වශයෙන්ම මම අත්දුටු කරුණ වූයේ ගොවි ප්‍රජාවගේ අසහනකාරී මානසික ස්වභාවයයි. පොහොර මිල හා කෘෂි රසායනික ද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා වී නිෂ්පාදන වැය ඉහළ යාමත්, වී අස්වනු සාධාරණ මිලකට අලෙවිකර ගැනීමට නොහැකිවීමත්, ඉඩම් බෙදීයාම නිසා ගොවිපළ කුඩා වීමෙන් ඇතිවී ඇති ගැටළුත්, වසර ගණනාවක්ම සහනාධාර මතම රජයන් විසින් ජීවත්කරවූ ගොවි ජනතාවක් නිසා මෙම සහන ක්‍රමයෙන් අඩුවන විට ඔවුන් අසරණභාවයට පත්වී ඇතැයි යන මානසිකත්වයක් වර්ධනයවී තිබේ. මෙම නිසා මෙම මූලික ගැටළු සඳහා විසඳුම් බලාපොරොත්තුවෙන් සිටින මොවුන්ට ඊට වඩා වෙනත් අංශ පිළිබඳව කථාකළද ඒවා ක්‍රියාත්මක කරවීමට උත්සාහකළද එයින් සාර්ථක ප්‍රතිඵල ලබාදීමට හැකියාවක් නැත. මෙම ඉහත දැක්වූ ගැටළු වලට අමතරව ඔවුන් වර්තමානයේ අත්විඳින ගැටළු වලට විසඳුම් ලබාගැනීම අප වැඩසටහන මගින් බලාපොරොත්තු විය. එවැනි ජනතාවගේ ගැටළුවලට පිළියම් යෙදෙන ආකාරයේ සංවර්ධන වැඩ ඉටුකරදීමට අවශ්‍ය සම්පත් ව්‍යාපෘතිය සතුනම් ඒවා ඉටුකරදීමෙන් යම්තාක්දුරට ගමතුළ ආදර්ශමත් ප්‍රජා සංවිධානයක් සහිත තිරසාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට හැකිබව ජනතාවගේ අදහස් විශ්ලේෂණය කිරීමේදී පෙනීයයි. සංගුන්ගම තිරසාර ගම්මානයේ ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් ආරම්භකර පවත්වාගෙන ගිය අධිවේගී ජුකී මැෂින් පුහුණු මධ්‍යස්ථානය පිළිබඳ විශාල ජනප්‍රසාදයක් ලැබුණි. එම කාර්යය සාර්ථකවීම තුළින් ව්‍යාපෘතියට ගොනුවූ පිරිසද විශාලය.

නිලධාරීන්ගේ පැත්තෙන් බලනවිට නිලධාරීන් තිරසාර ව්‍යාපෘතිය පිළිබඳව සහයෝගයක් ලබාදුන්නද එය පූර්ණ සහභාගීත්වයක් **(Full Participation)** ලෙස අර්ථ දැක්වීමට පුළුවන්කමක් නැත. ඔවුන් මාසික ක්‍රියාකාරී සැළැස්මක් ලෙස වැඩකිරීම **(Advance Programme)**හා ක්ෂේත්‍රයට යාම සඳහා ඉන්ධන වියදම් ආදිය එම අදාල ආයතන විසින්ම දැරිය යුතු විය. මේ සඳහා සම්පත් බෙදාහැරීම සඳහා තිබූ අඩුපාඩු ආදිය නිසා නිලධාරීන්ගේද පූර්ණ සහභාගීත්වයක් නොව අර්ධ සහභාගීත්වයක් ලැබුණි. තිරසාර වැඩසටහන ක්ෂේත්‍රය තුළ සක්‍රියව ක්‍රියාත්මක කරගෙන යාම සඳහා නිලධාරීන් පත්කර තිබුණි. එහෙත් එම නිලධාරීන් සහ ගොවීන් අතර මනා සම්බන්ධීකරණයක් නොතිබීම නිසා ක්‍රියාත්මක කරන ලද කෘෂිකාර්මික වැඩසටහන් වලදීද අඩුපාඩු දක්නට ලැබුණි. එම නිසා ක්ෂේත්‍ර මට්ටමේ මනා සම්බන්ධීකරණයක් අවශ්‍ය වන්නේය. ඇතැම් ගොවීන් ගෙවතු වගාව ආදී කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ කුඩා පරිමාණ ක්‍රියාවන් නොවැදගත් සේ සලකන බවත් පෙනේ. නමුත් එම කුඩා පරිමාණ කෘෂිකාර්මික ක්‍රියාවල ඇති හා ගෘහස්ථයේ පෝෂණය සඳහා වන දායකත්වය පිළිබඳව මූල්‍යමය වැදගත්කම ගොවීන්ට පුළුල් ලෙස අවබෝධ කරදිය යුත්තේය. ක්ෂේත්‍රය තුළින් කෘෂිකාර්මික ගැටළු, පොහොර සහනාධාරය අඩුකිරීම වැනි කාලීන ප්‍රශ්න පිළිබඳව තොරතුරු එකතුකර අමාත්‍යංශය වෙත ඉදිරිපත් කලද ඒවායින් ගොවීන්ට හිතකර ලෙස ප්‍රතිපත්තිමය තීරණ ගත්තේදැයි සැකසහිතය.

## 5.3 ප්‍රශ්න හා ගැටළු

මෙම තිරසර ගම්මානය පිහිටා ඇත්තේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේය. අක්කර 3ක ගොඩ ඉඩම් ඒකකයක් හිමිව සිටින මෙම ගොවි පවුල්වලට සෑහීකියයුතු ආදායමක් මෙම ගොඩ ඉඩම්වලින් ලබාගත හැකිය. මෙම ඉඩම් අහස් වැස්සෙන් ලැබෙන ජලයෙන් මාස් කන්නයේදී වගාකිරීමට හැකිවෙතත් මාස් කන්නයේ අගභාගයේ සිට යල කන්නය පුරාමත් ප්‍රමාණවත් වැසි නොලැබීම නිසා ගොඩ බෝග වගාව අසීරුවී ඇත. මෙම ප්‍රශ්නයට විසඳුමක් ලෙස කෘෂි ළිං ඇතිකිරීම හා ඒ හා සමගාමී බිංදු ජල සම්පාදන හා විසිරුම් ජල සම්පාදන ක්‍රම හඳුන්වාදීමට තිරසර වැඩසටහන යටතේ සැළසුම්කර තිබුණි. එහෙත් කෘෂි සංවර්ධන අධිකාරිය අහෝසි කිරීම නිසා එම වැඩසටහන ක්‍රියාවට නැංවීමට නොහැකිවීම මුහුණපෑ ගැටළුවක් විය. කලක් මෙම ගොඩ ඉඩම් සඳහා ජලය සපයාදුන් උස්සාන වාරිමාර්ගය යළිත් ක්‍රියාත්මක කර ආදර්ශනයක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරනලෙස මින්නේරිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජල කළමණාකරන අමාත්‍යාංශය වැනි වගකිවයුතු ආයතන වලින් ඉල්ලා සිටියද එම කාර්ය ඉටුකරගැනීමට නොහැකිවීමෙන් ඒ පිළිබඳ බලාපොරොත්තු තබාසිටි ගොවි ජනතාව අධෛර්යයට පත්කරන්නක් විය. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් තම ක්ෂේත්‍ර වැඩසටහන් තිරසාර ගමේහි ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලාසිටියද පලාත් අධ්‍යක්ෂකවරයා එම ඉල්ලීමට ප්‍රතිචාර දැක්වූයේ නැත. එමනිසා සත්ත් පාලන අංශයේ වැඩසටහන් අදාළ ගමතුළ ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය. තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන තම අභිවෘද්ධිය සඳහා වන වැඩසටහනක් සේ සළකා එය නිසිපරිදි ක්‍රියාත්මක කරගැනීම අරමුණු කරගනිමින් ගමතුළ පිහිටුවන ලද තිරසාර ක්‍රියාකාරී කමිටුවද එතරම් සාර්ථකදායි ලෙස එම කටයුත්ත ඉටුකළ බවක් නොපෙනුණි. සියළුම කටයුතු කොළඹින් ගොස් අඩුපාඩු සොයා බලා කළයුතු තත්ත්වයක් පැවතීමද ව්‍යාපෘතිය මුහුණදුන් ගැටළුවකි.

# හයවන පරිච්ඡේදය

## නිගමන හා යෝජනා

### 6.1 නිගමන

තිරසාර සංවර්ධන ගම්මාන වැඩසටහන ගමේ සංවර්ධන කටයුතු පවත්වාගෙනයාමට හා ජනතාවගේ ජීවන තත්ත්ය උසස් කිරීම සඳහා හේතුවන කුඩා පරිමාණයේ වැඩසටහනක් ලෙස අගය කළ හැකිය. ආර්ථික සංවර්ධනය සඳහා අදාල වන පහසුකම් ගමේ ප්‍රජාව වෙත ලබාගනිමින් ගැමි ගෘහස්ථ වල ආර්ථික ශක්තිය ඉහළ නැංවීම හා ගමේ පොදු සංවර්ධනමය කාර්යයන් අදාල ආයතන වෙතින් ලබාගැනීමට ග්‍රාමීය ජනතාව හුරුකරවීමක් මේ මගින් සිදුවෙයි. ගැමි ජනතාව කොන්කිරීමක් නොකොට සංවර්ධනයේ කොටස්කාරයින් බවට ඔවුන් පත්කරවීම මෙමගින් සිදුවේ.

ආර්ථික සැළසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබාගැනීමේ විශ්වාසනීය මූලයක් ලෙස මෙම පරීක්ෂණාත්මක ගම්මාන ඉතා වැදගත්ය. රජයේ ප්‍රතිපත්ති හා සාමය දේශපාලනය වැනි අංශ පිළිබඳවද ජනතාවගේ තොරතුරු ලබාගත හැකි නියැදියක් ලෙසට මෙවැනි ගම්මාන වලින් වැදගත් කාර්යයක් ඉටුකර ගත හැකිය.

තිරසර ගම්මානය ක්‍රියාත්මක කිරීමේදී ඉහතින් සඳහන් කළ පරිදි අඩක් ජනතා සහයෝගය ලැබුණේ ආර්ථිකයේ ප්‍රධානතම ජීවනාලිය වූ වී වගා ක්ෂේත්‍රය පිළිබඳ පවතින ගැටළුසහගත තත්ත්වය නිසාවෙනි. මේ සමගම ගොවියා යන්න කිසිම පිළිසරණක් නැති අසරණ ප්‍රජාවක්ය යන මානසිකත්වයක් සැමවිටම ජනතා සිත්තුළට කාවැදී පවතිනහෙයිනි. නිලධාරීන්ගේ පාර්ශවයේදී අඩක් සහයෝගය ලැබුණේ තිරසාර වැඩසටහන ඔවුන්ට තවත් වැඩසටහනක් පමණක් වූ නිසාවෙනි. එහි කිසියම් අළුත්බවක් හෝ විශේෂත්වයක් නොවූ නිසාවෙනි. තවදුරටත් නිලධාරීන්ට ආර්ථිකමය වාසි හෝ රාජකාරීමය වශයෙන් ප්‍රථිලාභ ඒ තුළ නොතිබූ නිසාවෙනි.

තිරසාර සංවර්ධන ගම්මාන වැඩසටහන යන්න ගම්මානයේ සියළුම ගොවි ප්‍රජාවට මෙන්ම ඒ හා සම්බන්ධ සිටින ක්ෂේත්‍ර නිලධාරීන්ට දැනෙන වැඩසටහනක් ලෙසට ක්‍රියාත්මක වූයේ නැත. එයට හේතුව ගමතුළ මෙම වැඩසටහනට සක්‍රිය ලෙස ගමේ ප්‍රජාව හෝ නිලධාරීන් සහභාගී නොවීමයි. එයටම බද්ධවූ අනෙක් කරුණවූයේ නවීන තාක්ෂණ ක්‍රම හා රැඩිකල් කෘෂිකර්මයක් වෙත මාරුවීමට තරම් සම්ප්‍රදායික ගොවි සමාජය සූදානම් නැතිකම නිසා ගොවීන් එම නව වැඩසටහන් සොය සොයා යාමට තරම් හොඳ යහපත් මානසික වටපිටාවක් සහිත පරිසරයක් වර්තමානයේ ජනතාව තුළ නොවීමයි. කම්මැලි එමෙන්ම සම්ප්‍රදායී ආකාරයේ වී ගොවිතැනක දශක ගණනාවක සිට නිරතව සිටීමෙන් ඊට ආවේණිකව නිර්මාණය වී තිබූ මානසික පරිසරය බිඳීමට තරම් තිරසර වැඩසටහන සමත් නොවීමයි.

### 6.2 යෝජනා

තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් ලද අත්දැකීම් පදනම් කරගනිමින් මෙහිදී සිදුවූ අඩුපාඩු සකසාගනිමින් මෙම වැඩසටහන ඉදිරියට ගෙනයාම සුදුසුය. ගමේ සෑම ක්ෂේත්‍රයක්ම හසුවන පරිදි සමස්ථ සංවර්ධන කාර්යයක් කරගෙන යාම මගින් කුඩා පරිමාණ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක් ලෙස තිරසාර සංවර්ධන ගම්මාන වැඩසටහන ක්‍රියාවට නැගීමට පුළුවන. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය තොරතුරුද මෙම ගම්මාන වලින් ලබාගැනීමට පුළුවන.

තිරසාර සංවර්ධන ගම්මාන වැඩසටහන ක්‍රියාවට නැංවීමේදී ඒ සඳහා සියළුම අංගෝපාංග වලින් සමන්විත වැඩසටහනක් (පැකේජයක්) අවශ්‍ය වේ. ගමේ ජනතාව විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රමුඛ පෙළේ ගැටළු විසඳීම සඳහා අවශ්‍ය කාර්යයන් කිරීමට අවශ්‍ය සම්පත්ද, ඒ සඳහා ක්ෂේත්‍ර මට්ටමේ සහභාගීවන නිලධාරීන් සඳහා ඔවුන් පෙළඹවීමේ මාධ්‍යයක් ලෙස රැකියාමය වරප්‍රසාදද මෙම පැකේජයට ඇතුලත් කළයුතු වන්නේය.

මෙම වැඩසටහන ගම් සංවර්ධනය කිරීමේ හා තොරතුරු රැස්කර ගැනීමේ පරීක්ෂණාත්මක ගම්මාන ලෙස ජාතික මට්ටමේ වැඩසටහනක් සේ සළකා ඒ සඳහා සහභාගීවීමට අවශ්‍ය අදාල සියළුම පාර්ශව අමාත්‍යාංශ මට්ටමින් දැනුවත් කළයුතු වන්නේය. වර්තමාන වැඩසටහන ආරම්භයේදී එවැනි දැනුවත්කිරීමක් සිදුවූයේ නැත.

විවිධ ආර්ථික ක්ෂේත්‍රයන් පිළිබඳව මෙම තිරසර සංවර්ධන ගම්මාන වලින් එක්රැස් කරනු ලබන තොරතුරු ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට දායකකරගත යුත්තේය. ගමේ ජනතාව විසින් ලබාදෙන තොරතුරු ආශ්‍රයකොට ගනිමින් ජාතික ප්‍රතිපත්ති සම්පාදනය වීම හෝ ගැටළුවලට ජාතික මට්ටමින් විසඳුම් ලබාදීමෙන් ජනතාවගේ තොරතුරු ඔවුනටම අභිවෘද්ධිදායක ලෙස යොදාගත හැක්කේ එවිටය.

මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමේදී අත්විදීමට ලැබුනේ වී ගොවිතැන පිළිබඳ ගොවීන් මුහුණදී සිටින යෙදවුම් මිල ඉහළයාම සහ වී සාධාරණ මිලකට අලෙවිකර ගැනීමට නොහැකිවීමත් නිසා ගොවීන් තුල කැකෑරෙමින් පවතින දැඩි අසහනකාරී මානසික පීඩනයයි. දේශීය වී ගොවිතා හා කෘෂිකර්මය පිළිබඳ වර්තමානයට වඩා අවධානය යොමුකර ගොවීන්තුළ පවතින මෙම අසහනකාරී මානසික පීඩනය ඉවත්කිරීමට අවශ්‍ය විසඳුම් ජාතික මට්ටමින් ලබාදිය යුතු වන්නේය. ගොවි සමාජයේ මූලිකම ප්‍රශ්න නිරාකරණය නොකර මෙවැනි කුඩා පරිමාණ වැඩසටහන් වලින් අපේක්ෂිත ප්‍රථිඵල නෙලා ගැනීම අපහසු බව කිවයුතුය.